# SLIDA

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

# 2011 SLIDA ANNUAL REPORT

වාර්ෂික වාර්තාව | ஆண்டறிக்கை



ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

# වාර්ෂික වාර්තාව

# 2011


ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

28/10, මලලසේකර මාවත,

කොළඹ 07.

ටෙලි: 5980200 ෆැක්ස්: 2584406 ඊ-මේල්: mail@slida.lk වෙබ්: www.slida.lk

සියළුම හිමිකම් ඇවිරිණි

වාර්ෂික වාර්තාව 2011

මුද්‍රණය - 2013


ප්‍රකාශනය
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
28/10, මලලසේකර මාවත, කොළඹ 07.

දුරකථන: 25980200
ෆැක්ස්: 2584406
ඊ-මේල්: mail@slida.lk
වෙබ්: www.slida.lk

# පටුන


01. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දැක්ම සහ මෙහෙවර. 02
02. අපගේ අරමුණු පරමාර්ථ සහ ක්‍රියාකාරකම්. 03
03. පාලක සභාවේ සාමාජිකයන්. 05
04. ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සහ අධ්‍යනේන්ද්‍රිය අංශය. 06
05. අධ්‍යක්ෂතුමාගේ වාර්තාව 10
06. හඳුන්වාදීම. 14
07. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සංවිධාන ව්‍යුහය. 15
08. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සතුව ඇති භෞතික සම්පත්. 16
09. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ උපායමාර්ගික යොමු කිරීම්. 19
10. කාර්ය සමාලෝචනය. 39
10.1. රාජ්‍ය පරිපාලන සහ පළාත්පාලන කේන්ද්‍රය. 41
10.2. පාරිසරික සහ සංවර්ධන අධ්‍යයන කේන්ද්‍රය. 42
10.3. මූල්‍ය කළමනාකරණ කේන්ද්‍රය. 43
10.4. කළමනාකරණ අධ්‍යයන කේන්ද්‍රය. 44
10.5. මානව සම්පත් සංවර්ධන කේන්ද්‍රය. 45
10.6. ඵලදායිතා සහ තත්ත්ව කළමණාකරණ කේන්ද්‍රය. 46
10.7 තොරතුරු තාක්ෂණ කේන්ද්‍රය. 47
10.8 භාෂා අධ්‍යයන කේන්ද්‍රය. 50
10.9 ව්‍යාපෘති කළමනාකරණ කේන්ද්‍රය. 51
10.10 පර්යේෂණ, ප්‍රතිපත්ති අධ්‍යයන හා ප්‍රකාශන මධ්‍යස්ථානය. 52
10.11 විශේෂ වැඩසටහන්. 53
10.12 හැකියාවන් වර්ධනය කිරීමේ වැඩසටහන්. 54
10.13 බාහිර විභාග. 55
10.14 පුහුණු උපදේශන සේවා. 56
10.15 කළමනාකරණ උපදේශන සේවා. 58
10.16 පශ්චාත් උපාධි අධ්‍යයන පාසල. 59
11. වර්ෂය තුළ කාර්ය සාධනය. 63
12. යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම. 65
13. පුස්තකාලය සහ තොරතුරු සේවා. 69
14. මූල්‍ය සමාලෝචනය. 75
- මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශය 77
- මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 79

15. විගණකාධිපති වාර්තාව සහ පිළිතුරු 81



## දැක්ම

රාජ්‍ය අංශයේ
ඉගෙනුම් ක්‍රියාවලියේ
විශිෂ්ඨතම මධ්‍යස්ථානය
බවට පත් වීම.

## මෙහෙවර

පුහුණු උපදේශන සහ පර්යේෂණ
සේවා සම්පාදනය තුළින්
කාර්යක්ෂම, ඵලදායි සහ ඉදිරිගාමී
රාජ්‍ය සේවාවක් සංවර්ධනය කිරීම
සඳහා මැදිහත් වීම.

# අරමුණු

1. විධායක මට්ටමේ සේවක පිරිස විශේෂිත කොට, රාජ්‍ය අංශයේ සේවක පිරිසට, නූතන පරිපාලන කළමනාකරණ දැනුම, කුසලතා සහ ධනාත්මක ආකල්ප ලබා දීම.

2. රාජ්‍ය සේවා ආචාර ධර්ම සහ සේවා සංස්කෘතිය පිළිබඳ ප්‍රමිතිවල වැඩිදියුණුව සහතික කිරීම.

3. ජාතික සංවර්ධනය සඳහා රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයෙහි ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා සහාය වීම පිණිස ප්‍රතිපත්ති සම්පාදකයන්ට පර්යේෂණ පදනම් කරගත් තොරතුරු සහ ප්‍රතිපත්ති පිළිබඳ නිර්දේශ ලබා දීම සහතික කිරීම.

4. පුරවැසි කේන්ද්‍රීය දිශානුයෝජන සහිත කාර්යක්ෂම සහ ඵලදායී සේවයක් ලබා දීමට යෝග්‍ය වන පරිදි තම සංවිධාන ව්‍යුහය, උපායමාර්ග, පද්ධති, ක්‍රියාමාර්ග සහ කාර්ය පරිසරය වැඩිදියුණු කර ගැනීමට රාජ්‍ය අංශයේ සංවිධානවලට සහාය වීම.

5. නූතන තාක්ෂණය සහ යටිතල පහසුකම් සහිත ක්‍රියාශීලි සංවිධානයක් වීම.

# පරමාර්ථ හා ක්‍රියාකාරකම්

- **A** රාජ්‍ය නිලධරයන්ගේ නිල කාර්ය ඵලදායි ලෙස ඉටු කිරීමට අවශ්‍ය වන පුහුණුව, අවබෝධය, කෞෂලයය හා හැසිරීම පුහුණුව මගින් වර්ධනය කිරීම,
- **B** කළමනාකරණ හා රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයන්හි පුහුණු කිරීමේ පාඨමාලා සංවර්ධනය කිරීම,
- **C** ආයතනය මගින් පවත්වනු ලබන පුහුණු කිරීමේ පාඨමාලා වලට සම්බන්ධ සහතික පත්‍ර හා ඩිප්ලෝමා ප්‍රදානය කිරීම,
- **D** සෑම මට්ටමකට කාර්යක්ෂම හා ඵලදායී පරිපාලනය සහතික කිරීම පිණිස රාජ්‍ය සේවය මුළුල්ලේ අධීක්ෂණය හා ආධාර කාර්ය මණ්ඩල ප්‍රවීණ සේවක සංඛ්‍යාවක් වර්ධනය කිරීම,
- **E** කළමනාකරණය පිළිබඳ විවිධ කර්තව්‍ය ක්ෂේත්‍රයන්හි උපදෙස් ලබා ගැනීම, අදහස් විමසීම හා විශේෂ පැවරීම් සඳහා විශේෂඥයන්ගේ සේවාවන් ආණ්ඩුවට හා රටට ලබා ගැනීමට සැලැස්වීම,
- **F** රාජ්‍ය අංශයේ අනුයෝජිත ආයතනවලට ඒවායේ සංවිධානාත්මක කළමනාකරණ ක්‍රම නැවත සලකා බැලීමට හා වැඩිදියුණු කිරීමට සහාය වීම,
- **G** උපදේශක කාර්යභාරය භාර ගැනීම,
- **H** කළමනාකරණය හා සංවිධානාත්මක න්‍යායයන් හා පරිචයන් සහ රාජ්‍ය පරිපාලන ක්‍රම පිළිබඳව විවේචනාත්මකව තක්සේරු කිරීම හා සුලු වෙනස්කම් කිරීම සඳහා මණ්ඩලයක් ඇති කිරීම.
- **I** කළමනාකරණ, සංවර්ධනය, ආයතන කටයුතු , ප්‍රතිමාන, වන්දි ගෙවීමේ ක්‍රම නිශ්චය ආදිය කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ සංවිධානවලට සහාය දීම සහ සාමාන්‍යයෙන් ඒවායේ ඵලදාව වැඩිදියුණු කිරීම,
- **J** ශ්‍රී ලංකාවේ සහ විදේශවල කළමනාකරණ පුහුණු කිරීම, පර්යේෂණ පැවැත්වීම හා ඊට සම්බන්ධ කටයුතු වලදී අන්‍ය සංවිධානයන්, සමූහයක් සහ පුද්ගලයන් සමඟ උද්යෝගීව සහයෝගයෙන් කටයුතු කිරීම.
- **K** සුදුසු ජාතික හා ජ්‍යාත්‍යන්තර මණ්ඩල හා සම්මේලන ඉදිරියේ ආයතනය නියෝජනය කිරීම,
- **L** අවශ්‍ය අවස්ථා වල අනුමත කරන ලද ජාතික හෝ ජාත්‍යන්තර සංවිධානවල සහාය ඇතිව කළමනාකරණය හා රාජ්‍ය පරිපාලනය සම්බන්ධයෙන් සාකච්ඡා හා සම්මන්ත්‍රණ සංවිධානය කර පැවැත්වීම හා ඒ සම්බන්ධ පොත්පත්, සඟරා පළ කිරීම,
- **M** ආයතනයේ කර්තව්‍ය හා කටයුතු පිළිබඳ තොරතුරු මහජනතාව හා අදාළ ආයතන අතර පතුරුවා හැරීම,

## 03 - පාලක සභාවේ සාමාජිකයින්

1982 අංක 09 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පනතේ 6(1) වගන්තිය ප්‍රකාර, ගරු රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයා විසින් 2011 වසර සඳහා පාලක සභාවේ සාමාජිකයින් ලෙස පහත සඳහන් පුද්ගලයින් පත් කොට ඇත.

**පී.බී.අබේකෝන් මහතා**
ලේකම්, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය (සභාපති)

**සිරිසේන අමරසේකර මහතා**
අග්‍රාමාත්‍ය ලේකම්, (සාමාජික)

**පී.බී. ජයසුන්දර මහතා**
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය (සාමාජික)

**පී.ඒ.අබේසේකර මහතා**
නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් (සාමාජික)

**ආචාර්ය නිහාල් ජයතිලක මහතා**
ලේකම්, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය (සාමාජික)

**ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා**
ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය (සාමාජික)

**කේ.වී.පී.රංජිත් ද සිල්වා මහතා**
ලේකම්, වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය (සාමාජික)

**සුමල් පෙරේරා මහතා**
(සාමාජික)

**එච්.එම්.ප්‍රේමරත්න මිය**
(සාමාජික)

**නිහාල් කිරිඇල්ල මහතා**
(සාමාජික)

**බී.විජයරත්න මහතා**
අධ්‍යක්ෂ/ ශ්‍රී සංවර්ධන පරිපාලන ආයතනය (2011.01.11 සිට මේ දක්වා)
(සාමාජික)

පාලක සභාව විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්යයන් අධීක්ෂණය කරනු ලබන අතර, එහි ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සපයනු ලබයි.

# 04 - ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සහ අධ්‍යයනේන්ද්‍රීය අංශය

විද්‍යාවේදී - රාජ්‍ය පරිපාලන
(ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය),
කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි
පාඨමාලාව - පී.අයි.එම්
(ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය),
රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය
පී.අයි.එම්.(ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය),
ආශ්‍රිත සාමාජිකත්වය පිළිබඳ සහතිකය
(ධීවර ප්‍රතිපත්ති සහ සැලසුම්කරණය)
- එක්සත් ජාතීන්ගේ විශ්ව විද්‍යාලය
(අයිස්ලන්තය)රාජ්‍ය පරිපාලනය පිළිබඳ
සහතික පත්‍ර පාඨමාලාව - ශ්‍රී ලංකා සංවර්ධන
පරිපාලන ආයතනය
(ශ්‍රී.ල.ප.සේ විශේෂ ශ්‍රේණිය)

**බී. විජයරත්න මහතා**
අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන
ආයතනය



විද්‍යාවේදී (ගෞරව), රාජ්‍ය මූල්‍ය හා
බදුකරණය, ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති
උපාධිය (නිව් ඉන්ග්ලන්ඩ් - ඕස්ට්‍රේලියාව)
අධ්‍යක්ෂ/ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන
ආයතනය, 2007 ජනවාරි - නොවැම්බර් දක්වා,
ශ්‍රී ලංකා පරිපාලන සේවය

**ටී.එම්.කේ.බී.
තෙන්නකෝන් මහතා**

අතිරේක අධ්‍යක්ෂ
(පුහුණු හා කළමනාකරණ
උපදේශණය)



වාණිජවේදී (විශේෂ). ව්‍යාපාර පරිපාලනය
පිළිබඳ විද්‍යාපති උපාධිය
(මානව සම්පත් සංවර්ධනය),
බදුකරණය හා රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ
විද්‍යාපති උපාධිය, පළාත් පාලනය පිළිබඳ
පශ්චාත් උපාධි ඩිප්ලෝමාව,
ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත්
උපාධි ඩිප්ලෝමාව, බදුකරණය පිළිබඳ
ආධුනිකත්ව වැඩසටහන
(ජාතික බදුකරණ විද්‍යාලය, ජපානය),
ශ්‍රී ලංකා පරිපාලන සේවයේ
විශේෂ ශ්‍රේණිය.

**කේ.ඩී.එන්.ආර්.
අශෝක මහතා**
අතිරේක අධ්‍යක්ෂ
(පරිපාලන සහ මුදල්)



මානව සම්පත් කළමනාකරණය අලෙවිකරණය
සහ බුද්ධිමය දේපළ නීතිය පිළිබඳ ජ්‍යෙෂ්ඨ
උපදේශක අධ්‍යාපනවේදී (ගෞරව) -
කොළඹ, විද්‍යාපති (අලෙවිකරණය)
ස්ට්‍රාත්ක්ලයිඩ් ව්‍යාපාරික පාසල, ග්ලාස්ගෝ,
එක්සත් රාජධානිය, නීතිඥ,
එම්.අයි.එම් (ශ්‍රී ලංකා),
උනන්දුව දක්වන ක්ෂේත්‍රයන් :- බුද්ධිමය දේපළ
, මානව අයිතිවාසිකම් පරිපාලන නීතිය, විනය
පටිපාටි, අලෙවිකරණ කුසලතා සහ නව රාජ්‍ය
කළමනාකරණය, දූෂණ විරෝධී ක්‍රියාකාරකම්,
විදෙස් අත්දැකීම් :- එක්සත් රාජධානිය,
ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, ඉතාලිය,
සිංගප්පූරුව, මැලේසියාව, පිලිපීනය,
ඉන්දියාව සහ ජර්මනිය,

**ඩබ්.ඒ.ජයසුන්දර මහතා**

ප්‍රධානී, කළමනාකරණ
අධ්‍යයන දෙපාර්තමේන්තුව



විද්‍යාවේදී (රාජ්‍ය පරිපාලන) (ගෞරව),
ගණකාධිකරණ ඩිප්ලෝමාව, විද්‍යාපති -
ව්‍යාපාර පරිපාලනය
(බර්මිංහැම් විශ්ව විද්‍යාලය)
(බර්මිංහැම් ව්‍යාපාරික පාසල එක්සත්
රාජධානිය), එෆ.එස්.එල්.අයි.ටී.ඩී. උනන්දුව
දක්වන ක්ෂේත්‍රයන් :- සංස්ථා පාලනය,
රාජ්‍ය - පුද්ගලික හවුල්කාරිත්වය. නව රාජ්‍ය
කළමනාකරණය, මානව සම්පත් සංවර්ධනය
සහ උපාය මාර්ගීක අලෙවිකරණය,
විදෙස් අත්දැකීම් :- එක්සත් රාජධානිය,
සිංගප්පූරුව, තායිලන්තය, මැලේසියාව,
ඉන්දියාව, ජර්මනිය සහ ජපානය,

**එම්.තිලකසිරි මහතා**

ප්‍රධානී,පශ්චාත් උපාධි අධ්‍යයන
පාසල සාමාන්‍ය කළමනාකරණය
සහ උපාය මාර්ගික
කළමනාකරණය පිළිබඳ
ජ්‍යෙෂ්ඨ උපදේශක.



ශාස්ත්‍රවේදී (ගෞරව) දේශපාලන විද්‍යාව,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය, මිලදී ගැනීම් හා
සැපයීම් පිළිබඳ ඩිප්ලෝමාව,
(එන්.එල්.යූ - එක්සත් රාජධානිය) ශාස්ත්‍රවේදී
(ස්ත්‍රී පුරුෂභාවය සහ අන්තර්ජාතික
සංවර්ධනය) වෝවික් විශ්ව විද්‍යාලය,
එක්සත් රාජධානිය, PGDDE - IGNOU,
ඉන්දියාව, MISMM (ශ්‍රී ලංකාව)
විශේෂඥතාවක් හා උනන්දුව දක්වන
ක්ෂේත්‍රයන් :- ස්ත්‍රී පුරුෂභාවය සහ
සංවර්ධනය, ද්‍රව්‍ය කලමනාකරණය, සාමාන්‍ය
කළමනාකරණය, දුරස්ථ අධ්‍යාපනය.

**එස්.මැදගම මහතා**

ජ්‍යෙෂ්ඨ උපදේශක, ප්‍රධානී,
දුරස්ථ ඉගෙනුම් කේන්ද්‍රය



ශාස්ත්‍රවේදී (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) විද්‍යාපති (රාජ්‍ය පරිපාලනය)(ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය), සමාජ පර්යේෂන ක්‍රමවේද පිළිබඳ විද්‍යාපති උපාධිය (එක්සත් රාජධානිය), කළමනාකරණය පිළිබඳ ආචාර්ය උපාධිය, Teesside Business School (එක්සත් රාජධානිය),ශ්‍රී ලංකා පරිපාලන සේවය (1 පන්තිය) (විශ්‍රාමික) රාජ්‍ය කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන සඳහා ජ්‍යෙෂ්ඨ උපදේශක, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ශාක්‍යතා වර්ධන වැඩසටහන, රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් (විදේශීය) සහ පොදු නායකත්ව වර්ධන වැඩසටහනේ සමස්ථ සම්බන්ධීකාරක,
උනන්දුවන් දක්වන විෂය ක්ෂේත්‍රයන් වන්නේ :- අඛණ්ඩ චර්යා වර්ධනය , සංවිධානාත්මක බැඳීම්, සංවිධානාත්මක පුරවැසි චර්යාවන්, සංවිධානත්මක පාලනය, රාජ්‍ය අංශයේ සංවිධානාත්මක අධ්‍යයනය සහ හැකියාවන් ප්‍රවර්ධීකරණය සහ කාර්යසාධනය වර්ධනය කිරිම,
විදේශීය අත්දැකීම්:- එක්සත් රාජධානිය, ස්විට්සර්ලන්තය, දකුණු කොරියාව, ජපානය, බෙල්ජියම, චීනය, සිංගප්පූරුව, මලයාසියාව, ඉන්දියාව සහ මාලදිවයින,

**ආචාර්ය ජේ.ඩී. සමරසිංහ මයා**
ජ්‍යෙෂ්ඨ උපදේශක



දර්ශනශූරි (සංවර්ධන ආර්ථික විද්‍යාව) බැංගලෝර් විශ්ව විද්‍යාලය, ඉන්දියාව, විද්‍යාපති (ග්‍රාමීය සහ කලාපීය සංවර්ධන සැලසුම්කරණය) AIT,තායිලන්තය,පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (අන්තර් කටයුතු) ශාස්ත්‍රවේදී (විශේෂ) (ආර්ථික විද්‍යාව) - කැළණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී.ල.ප.සේ, විශේෂ පන්තිය, උනන්දුවක් දක්වන විෂය ක්ෂේත්‍රයන් වන්නේ :- සංවර්ධන සැලසුම්කරණය හා සංවර්ධන පරිපාලනය විදෙස් අත්දැකීම්:- නිල සංචාරය සහ පුහුණු වැඩසටහන් සඳහා විදේශීය රටවල් කිහිපයකට ගොස් ඇත.
ශ්‍රී.ල.ප.සේ. විශේෂ ශ්‍රේණිය

**ආචාර්ය අයි.එච්.කේ. මහානාම මහතා**
ජ්‍යෙෂ්ඨ උපදේශක



විද්‍යාපති, රාජ්‍ය පරිපාලනය (හාවඩ් විශ්ව විද්‍යාලය, ඇමරිකා එකසත් ජනපදය) FCMA (වරලත් කළමනාකරණය ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය, එක්සත් රාජධානිය), උනන්දුවක් දක්වන ක්ෂේත්‍රයන්:- තුලිත ලකුණු ප්‍රවේශය භාවිතා කොට ව්‍යාපාරයන්හි ක්‍රියාකාරකම් පදනම් කරගත් පිරිවැයකරණය සහ කාර්යය සාධන ක්‍රියාමාර්ග උපයෝගී කොටගෙන භාණ්ඩ සහ සේවා පිරිවැයකරණය,
විදෙස් අත්දැකීම්:- ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, අර්ජන්ටිනාව, නෙදර්ලන්තය, ජපානය, සිංගප්පූරුව සහ ඉන්දියාව

**ඊ.ආරුමුගම් මහතා**

ප්‍රධානී, මූල්‍ය කළමනාකරණය කේන්ද්‍රය, ජ්‍යෙෂ්ඨ උපදේශක



වානිජවේද (පේරාදෙණිය විශ්ව විද්‍යාලය) අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (එක්සත් රාජධානිය) ශ්‍රී ලංකා පරිපාලන සේවය (පළමුවන පන්තිය) (විශ්‍රාමික),

**ජේ.සී.ටී.බුළුමුල්ල මහත්මිය**

ප්‍රධානී, රාජ්‍ය පරිපාලනය සහ පළාත් පාලන කේන්ද්‍රය, ජ්‍යෙෂ්ඨ උපදේශක



ශාස්ත්‍රපති (ව්‍යාපාර පරිපාලනය, බර්මිංහැම් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය, ශාස්තවේදී (ගෞරව) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, විද්‍යාවේදී, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව, ශ්‍රී ලංකා පරිපාලන සේවය -
1 පන්තිය, පාලන ක්‍රම, කළමනාකරණය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ උපදේශක,

උනන්දුවක් දක්වන ක්ෂේත්‍රයන්:- සමාජ අලෙවිකරණය, දුෂණ විරෝධි ප්‍රතිසංස්කරණ, මාධ්‍ය කලමනාකරණය සහ පරිපාලන පාලන ක්‍රම,

විදෙස් අත්දැකීම්:- එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, කොරියාව, ඉන්දියාව, චීනය, තායිලන්තය, මලයාසියාව සහ බංගලාදේශය,
ශ්‍රී.ල.ප.සේ (පළමුවන පන්තිය)

**පී.පී.ඩී.පී.සේරසිංහ මිය**

ජ්‍යෙෂ්ඨ උපදේශක



ශාස්ත්‍රපති (ආර්ථික විද්‍යාව) - ඕස්ට්‍රේලියා ජාතික විශ්ව විද්‍යාලය, ශාස්ත්‍රවේදී ආර්ථික විද්‍යා (විශේෂ) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව, නිතීඥ,

විශේෂඥතාවයක් සහ උනන්දුවක් දක්වන ක්ෂේත්‍රයන් :- ආර්ථික සංවර්ධනය, සංවර්ධන ප්‍රතිපත්ති, උපායමාර්ගික කළමනාකරණය සහ සැලසුම්කරණය, ඵලදායීතාවය සහ ගුණත්වය, පූර්ණ ගුණත්ව කළමනාකරණය, නායකත්වය, ධනාත්මක ආකල්ප සහ පුද්ගල සංවර්ධන සැලසුම්කරණය,

විදෙස් අත්දැකීම්:- ඕස්ට්‍රේලියාව, ඇමරිකා එක්සත් ජනපදය, මලයාසියාව, තායිලන්තය, ඉතාලිය, ඉන්දියාව, ජපානය, පිලිපීනය, කොරියාව සහ ස්විට්සර්ලන්තය,
ශ්‍රී. ල. ප.සේ. විශේෂ ශ්‍රේණිය

**ඩී.වී.බන්දුලසේන මහතා**

ජ්‍යෙෂ්ඨ උපදේශක



ශාස්ත්‍රවේදී, ශාස්ත්‍රපති - සමාජ විද්‍යාව,
ශාස්ත්‍රපති - ව්‍යාපාර පරිපාලනය (යූ.එස්.පී),

උන්නදුවක් දක්වන ක්ෂේත්‍රයන් :-
ඵලදායීතාවය සහ ගුණත්වය, උපායමාර්ගික කළමනාකරණය, පුද්ගලික/ස්වයං සංවර්ධනය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කළමනාකරණය ව්‍යවසායකත්ව සංවර්ධනය, පාරිභෝගිකයාගේ ආරක්ෂාව සහ රාජ්‍ය අංශයේ අලෙවිකරණය,

විදෙස් අත්දැකීම්:- සිංගප්පුරුව, ජපානය, ස්වීඩනය, ඊශ්‍රායලය, ඉන්දියාව, තායිලන්තය, පිලිපීනය
ශ්‍රී. ල. ප.සේ. විශේෂ ශ්‍රේණිය

**සුජාන් නානායක්කාර මහතා**
ජ්‍යේෂ්ඨ උපදේශක



ව්‍යාපෘති කළමනාකරණය, අපද්‍රව්‍ය කළමනාකරණය, පාරිසරික කළමනාකරණය, පර්යේෂණ ක්‍රමවේදය සහ නාගරික සංවර්ධනය පිළිබඳ උපදේශක

ශාස්ත්‍රවේද (ගෞරව), භූගෝල විද්‍යාව, කොළඹ විශ්ව විද්‍යාලය, විද්‍යාපති (නාගරික පාරිසරික කළමණාකරණය) ඒ.අයි.ටී.තායිලන්තය

විදෙස් අත්දැකීම් : ජර්මනිය, නේපාලය, ස්වීඩනය, තායිලන්තය, සිංගප්පූරුව, මලයාසියාව සහ ඇමරිකා එක්සත් ජනපදය

**ඩබ්ලිව්.එම්.එම්.පී.ඩී. විජේකෝන් මහතා**
උපදේශක



විද්‍යාවේදී (ගෞරව) කෘෂිකර්මය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පාරිසරික කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (සී.ඩී.පී.ජර්මනිය) විද්‍යාපති (පාරිසරික ආර්ථික විද්‍යාව) කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය,

විශේෂඥතාවයක් හා උනන්දුවක් දක්වන ක්ෂේත්‍රයන් :- පාරිසරික කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය, ස්ත්‍රී පුරුෂභාවය සහ සංවර්ධනය, අපදා කළමනාකරණය, Incident Command System, පර්යේෂණ ක්‍රමවේද සහ පුහුණු ක්‍රමවේද,

විදෙස් අත්දැකීම්:- ඇමරිකා එක්සත් ජනපදය, ජර්මනිය, නේපාලය සහ ඉන්දුනියාව

**එන්.ජේ. ජයසුන්දර මිය**
පාරිසරික කළමනාකරණය පිළිබඳ උපදේශක



විද්‍යාවේදී (ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය), විද්‍යාපති (වන විද්‍යා) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාල, විද්‍යාපති (තොරතුරු තාක්ෂණය) මොරටුව විශ්ව විද්‍යාලය, තොරතුරු කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
Certificate in E-Government,
Certificate in Local Area Network,

උනන්දුවක් දක්වන ක්ෂේත්‍රයන්:-
E-Government Technologies, වෙබ් අඩවි නිර්මාණය, ජාල කළමනාකරණය,
විදෙස් අත්දැකීම්:තායිලන්තය, ඉන්දුනීසියාව, මලයාසියාව, ඉන්දියාව.

**එන්.එම්.එස්.ඒ.බණ්ඩාර මහතා**
උපදේශක



ශාස්ත්‍රවේදී (කැළණිය), විද්‍යාපති (නෙදර්ලන්තය). පශ්චාත් උපාධි ඩිප්ලෝමා (TESP), (මැන්චෙස්ටර්) ඉංග්‍රීසී භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කොළඹ), TESP සහතික පත්‍ර පාඨමාලාව (එක්සත් රාජධානිය), ඉංග්‍රීසි විශේෂ පුහුණු (පේරාදෙණිය),
විදෙස් අත්දැකීම්:- එක්සත් රාජධානිය, නෙදර්ලන්තය, ඕස්ට්‍රියාව,මලයාසියාව,චීනය සහ සිංගප්පූරුව.

**අයි.එස්.ජයරත්න මහතා**
ප්‍රධානී, භාෂා අධ්‍යයන කේන්ද්‍රය,
උපදේශක - 1 ශ්‍රේණිය.



ශාස්ත්‍රපති (ගෞරව) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කොළඹ විශ්ව විද්‍යාලය) ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (කොළඹ විශ්ව විද්‍යාලය), පුහුණු ගුරු (ඉංග්‍රීසී), අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ජනසන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමාව.

උනන්දුවක් දක්වන විෂය ක්ෂේත්‍රයන්:- සංවර්ධන ආර්ථික විද්‍යාව, දිළිඳුකම පිටුදැකීමේ උපාය මාර්ග, කාන්තාව සහ සංවර්ධනය, අධ්‍යාපන උපදේශනය සහ ඉංග්‍රීසි සාහිත්‍යය.

**එස්.ආර්.එස්.එන්. සුදසිංහ මිය**
උපදේශක



ශාස්ත්‍රවේදී (ගෞරව) අන්තර්ජාතික සබඳතා (කොළඹ විශ්ව විද්‍යාලය), සාමය සහ ගැටුම් අධ්‍යයන පිළිබඳ දර්ශනපති උපාධිය (ඔස්ලෝ විශ්ව විද්‍යාලය - නොර්වේ),

උනන්දුවක් දක්වන විෂය ක්ෂේත්‍රයන් :- අන්තර්ජාතික සබඳතා, සාමය පිළිබඳ පර්යේෂණ සහ පර්යේෂණ ක්‍රමවේද,
විදෙස් අත්දැකීම්:- නෝර්වේ, ස්වීඩනය සහ ඇමරිකා එක්සත් ජනපදය.

**එම්.ආර්.වක්කුඹුර මිය**
උපදේශක



මානව සම්පත් සංවර්ධනය සහ ඵලදායි කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය, (University of Leicester - එක්සත් රාජධානිය), අන්තර්ජාතික ව්‍යාපාර පරිපාලන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (ඕස්ට්‍රේලියාව), අලෙවිකරණය පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමාව (ACIM - UK), කළමනාකරණ ගණකාධිකරණ ඩිප්ලෝමාව (CIMA-UK) Toastmaster's International Hall of Fame Inductee, උනන්දුවක් දක්වන විෂය ක්ෂේත්‍රයන්:- මානව සම්පත් සංවර්ධනය පිළිබඳ පර්යේෂණ, පුහුණු කිරීම, වැඩිහිටි අධ්‍යාපනය සහ සන්නිවේදනය.

**ඩී. හෙට්ටිආරච්චි**
උපදේශක



# පරිපාලන හා මූල්‍ය තොරතුරු පද්ධති හා සේවා අංශය

විද්‍යාවේදී (කළමනාකරණ) (ගෞරව)
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව
(ශ්‍රී ලංකා පරිපාලන සේවය)

**ඒ.එච්.එම්.එල්.**
**අබේරත්න මහතා**
නියෝජ්‍ය අධ්‍යක්ෂ



වානිජවේදී
(විශේෂ)
(ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවය)

**පී.ඩී.ලාල්**
**කුලරත්න මහතා**
ගණකාධිකාරී



විද්‍යාවේදී (ගෞරව),
කාර්මික ගණිතය පිළිබඳ පශ්චාත් උපාධි
ඩිප්ලෝමාව

**ආර්.ඒ.එස්.පී.**
**රණවීර මිය**
රෙජිස්ට්‍රාර්



# 05 - අධ්‍යක්ෂතුමාගේ වාර්තාව - 2011

රාජ්‍ය අංශයේ ඉගෙනුම් ක්‍රියාවලියේ විශිෂ්ටතම කේන්ද්‍රස්ථානය ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) රාජ්‍ය සේවයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය කිරීමේ වගකීම උසුලනු ලබයි. එම ප්‍රයත්නය තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය අනෙකුත් රාජ්‍ය අංශයේ සංවිධාන සමඟ සමීපව කටයුතු කරමින් රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් පමණක් නොව සම්පත් දායක ආයතනයක් ලෙස ද සිය සේවා සපයනු ලබයි.

සමාලෝචනයට පාත්‍ර වන 2011 වර්ෂයේද ආයතනික සංයුතික සැලැස්මෙහි ඇතුළත් උපාය මාර්ගික මගපෙන්වීම්වලට අනුගත වෙමින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පුහුණු හා සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධව ඉහළ මට්ටමේ කාර්යය සාධනයක් අත්කරගෙන ඇත.

මූල්‍ය ලැබීම් පිළිබඳව විමසා බලන විට, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, 2010 වසරේ ඉපැයූ රුපියල් මිලියන 80.9ට සාපේක්ෂව 2011 වසරේදී රුපියල් මිලියන 106.5 ක මෙහෙයුම් ආදායමක් ලබා ඇත. ක්ෂය වීම් සඳහා වෙන් කිරීමෙන් අනතුරුව ශුද්ධ අතිරික්තය රුපියල් මිලියන 0.64 කි.

පුහුණු වැඩසටහන් සංඛ්‍යාව සහ පුහුණු උපදේශන තවදුරටත් ඉහළ යෑමේ ප්‍රවණතාවයක් ඇති බව 2011 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව වූ 91 ඉකුත් වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව වූ 59 හා සසඳන විට පෙනී යයි. තවද 2010 වර්ෂයේ සහභාගීත්ව දින ගණන 28534 ක් වූ අතර, එය 2011 වර්ෂය තුළදී 38706 දක්වා ඉහළ ගොස් ඇත.

අනෙකුත් පුහුණු වැඩසටහන්වලට අමතරව 2011 වසරේදී, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය කිරීමේ අරමුණින් නව වැඩසටහනක් ආරම්භ කරන ලදී. මෙම වැඩසටහනේ පුළුල් පරමාර්ථය වූයේ මහජනතාවට වඩාත් යහපත් සේවයක් ඉටුකරලීමට හා රජයේ˙ සංවර්ධන ක්‍රියාවලිය සාක්ෂාත් කිරීම සඳහා මෙම තරුණ නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වැඩි දියුණු කිරීමයි. මෙවැනි සාර්ථක වැඩසටහන් තුනක් පැවැත්වූ අතර නිලධාරීන් 197 දෙනෙකු විවිධ පුහුණු සැසිවලට සහභාගී කරවන ලදී.

මේ මගින් ඔවුන් තම වෘත්තිය හා පෞද්ගලික ජීවිතය මැනවින් අවබෝධ කරගැනීම සඳහා අවශ්‍ය ඉමහත් අත්දැකීම් සමූහයක් උකහා ගන්නා ලදී.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට අවශ්‍ය අරමුදලෙන් කොටසක් මහා භාණ්ඩාගාරයෙන් සැපයෙන අතර 2008 වසරේ සිට එය 22% - 35% අතර ප්‍රමාණයක් විය. මූල්‍යමය පරතරය පියවා ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් රාජ්‍ය අංශයේ ආයතන සඳහා පුහුණු වැඩසටහන් හා උපදේශන වැඩසටහන් පවත්වන ලදී. ඒ අනුව පුහුණු වැඩසටහන් 91ක් හා පුහුණු උපදේශන 43ක් පවත්වන ලද අතර අනුරූපී 2010 වර්ෂය හා සසඳන විට පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 32කින්ද පුහුණු උපදේශන වැඩසටහන් සංඛ්‍යාව 5 කින්ද ඉහළ ගොස් ඇත. ඊට අමතරව වර්ෂය තුළදී පවත්වන ලද බාහිර විභාග සංඛ්‍යාව 84ක් වූ අතර, 2010 වර්ෂයේදී එය 77 කි.

සංඛ්‍යාලේඛන විශ්ලේෂණය කිරීමේදී මෙම කාල වකවානුව ඇතුළත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවාරම්භක නිලධාරීන් 147 ක ප්‍රමාණයක් පුහුණුව ලබා ඇති බව පෙනී යයි. තවත් 433 ක් වන පරිපාලන සේවයේ නිලධාරීහු පිරිසක් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා පවත්වන ලද ශක්‍යතා වර්ධන වැඩසටහන්වලට සහභාගී වී තිබේ. පශ්චාත් උපාධි වැඩසටහන 219 දෙනෙකුගේ සහභාගීත්වය ඇතිව තවදුරටත් ක්‍රියාත්මක වූ අතර 2011/2013 අධ්‍යයන වර්ෂය සඳහා තවත් 120 දෙනෙක් ඇතුළත් කරගන්නා ලදී.

පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය සමඟ ඒකාබද්ධව හා සිංගප්පූරු විදේශ කටයුතු අමාත්‍යංශයේ හා ඉන්දියාවේ පරිපාලන කාර්යය මණ්ඩල විද්‍යාලයේ සහාය ඇතිව රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අතරින් තෝරාගත් පිරිසක් සඳහා විශේෂ නායකත්ව සංවර්ධන වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලදී.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මෙම කටයුතු ක්‍රියාත්මක කරන්නේ උපදේශකයන් 11 දෙනෙකුගෙන් සමන්විත කාර්යය මණ්ඩලයක් මගින් වන අතර, එය ආයතනය මනාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සේවක පිරිසට වඩා බොහෝ සෙයින් අඩු කාර්යය මණ්ඩලයකි. 2011 වසරේදී නව උපදේශකවරුන් දෙදෙනෙක් බඳවා ගනු ලැබූව ද තවත්

පුරප්පාඩු 18ක් පවතී. තවද මෙම වර්ෂය අවසන් වන විට අතිරේක අධ්‍යක්ෂ තනතුරක්ද පුරප්පාඩු ව පවතී.

ආයතනය ඉගෙනුම් ක්‍රියාවලියේ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ අභිලාෂය ඇතිව මෙමගින් ඉටුකරන සේවය තවදුරටත් ශක්තිමත් කරමින් වෘත්තීයමය පුහුණු මධ්‍යස්ථානයක ප්‍රමිතීන් ඇති කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පියවර ගන්නා ලදී. මේ සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග හා වැඩිදියුණු කිරීම් සිදු කොට ඇත.

සැපයුම් සංචරයකයන් ශක්තිමත් කිරීමේ කාර්යය ඉටුකරන අතරතුර රාජ්‍ය අංශයේ විශිෂ්ඨතම ආයතනයක් ලෙස නම්දරා ඇති මෙම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය නියමිත ප්‍රමිතීන්ට අනුව පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වන යටිතල පහසුකම් සඳහා නව මුහුණුවරක් ලබා දීමේ කර්තව්‍ය සඳහා ද අවශ්‍ය පියවර ගෙන ඇත. මේ සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග හා වැඩි දියුණු කිරීම් සිදු කොට ඇත.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ රථගාල භූමිය එකිනෙකට බද්ධ වූ ගඩොල් යොදා සැකසීම, නේවාසිකාගාර සංකීර්ණය අළුත් වැඩියාකාර දියුණු කිරීම (වැසිකිලි 16ක් ප්‍රකෘති කිරීම) අවශ්‍ය පරිදි නිර්මාණය කළ ගෘහ භාණ්ඩ සැපයීම ඇතුළු කැෆටේරියේ ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම,නේවාසිකාගාරයට සහ දේශන කාමර වලට වායු සමීකරණ පහසුකම් සැලසීම,ප්‍රධාන ශ්‍රවණාගාරයේ අභ්‍යන්තර වැඩි දියුණු කිරීම, සම්මන්ත්‍රණ ශාලාව සහ දේශන කාමර 17ක් සඳහා නව නිර්මාණ යෙදීම, ප්‍රධාන සහ කුඩා ශ්‍රවණාගාරයන්ට සම්මන්ත්‍රණ ශාලාවට, භෝජනාගාරයට සහ දේශන කාමර 14කට නව ගෘහ භාණ්ඩ සැපයීම, පරිගණක මුද්‍රණ යන්ත්‍ර 23ක් මිලට ගැනීම, ප්‍රධාන ගොඩනැගිල්ලේ වැසිකිලි 18ක් ප්‍රකෘතිමත් කිරීම, ජලාප්‍රවහනය සහ අපවිත්‍ර ජාලය සඳහා ජල මාර්ග ඉදි කිරීම, රථගාල ඉදි කිරීම, සමාලෝචන වසර තුල පද්දතියට එක් කළ ද්‍රව්‍ය කිහිපයකි. පර්යේෂණ ක්‍රම වේදය වැනි අංශ සඳහා මහත් ඉල්ලුමක් ඇති ග්‍රන්ථ ප්‍රමාණවත්ව සැපයීම රාජ්‍ය අංශයේ ප්‍රසිද්ධියට හා නිලධාරීන්ගේ ග්‍රන්ථ සහ ලිපි ලේඛණ විමර්ෂන අංශයෙහි ශ්‍රී ලංකා එකතු වේ. පවත්වාගෙන යෑම, පුස්ථකාලයට වෙබ් පිටුයක් සම්පාදනය කිරීම, සාමාජිකයින්ට විමර්ෂණ කටයුතු පහසු කිරීම් බස් මාර්ගයක නාමාවලියකට උපාංග සැලසීම, ස්වයංක්‍රීය පොත් නිකුත් කිරීමේ

ක්‍රමයක් හඳුන්වා දීම, මොනෑෂ් විශ්ව විද්‍යාලය විසින් පරිත්‍යාග ග්‍රන්ථ සහ සගරා සඳහා විශේෂ පොත් රාක්ක සැපයීම මඟින් පුස්තකාල සම්පත් වැඩි දියුණු කර ඇත.

මෙහිදී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමාගෙන් ද, පාලක සභාවෙන් ද, ජනාධිපති ලේකම්තුමාගෙන් ද, ජාතික පරිපාලන ප්‍රතිසංස්කරණ සභාවෙන් ද අනෙකුත් සහයෝගය දක්වන ආයතන වලින් ද ලැබුණු උපදේශකත්වය හා මගපෙන්වීම් ය.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය යහ පාලනය පිළිබඳ ප්‍රශස්තම ක්‍රමවේදයන් හා මූලධර්ම අනුගමනය කරන ලද අතර පාලක සභාවේ හා විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවතවන ලදී.

රාජ්‍ය අංශයේ පුහුණුව හා සංවර්ධනය පිළිබඳ විශිෂ්ටතම කේන්ද්‍රස්ථානය බවට පත්වීමේ අභිලාෂය ඇති ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කිරීමේ නව දැක්ම සමඟ අතිවිශාල කාර්යභාරයක් පැවරී තිබේ. ප්‍රතිලාභීන් සඳහා වඩාත් උද්යෝගිමත් හා සම්පත් පිරි රාජ්‍ය සේවාවක් බවට පත් වීම සඳහා එහි බාහිර ස්වරූපය ඉහළ නැංවීම පමණක් නොව සේවා සැපයීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ වී සිටින පුද්ගලයන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා ද වෙනසකට භාජනය කිරීම අනිවාර්ය වේ. මෙවැනි තත්වයක් යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතයේ වත්මන් මෙහෙයුම් ධාරිතාවය හා සේවා සැපයීම් පද්ධතිය ශ්‍රී ලංකාවේ ඉහළ රාජ්‍ය සේවයේ ප්‍රමාණයටද සාපේක්ෂව එහි ඉගෙනුම් අවශ්‍යතා සැපරීම සඳහා ප්‍රමාණවත් නොවන බව පෙනී යයි. එම නිසා මා දකින ආකාරයට, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ මෙහෙයුම් රටාවේ සම්පූර්ණ වෙනස්වීමක් සිදුවිය යුතු අතර, එමගින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සේවා සැපයීම් ආයතනයක් පමණක් බවට පත් නොවී ඉගෙනුම සඳහා ඉහළ මට්ටමේ ඉල්ලුමක් ඇති සම්පත් මධ්‍යස්ථානයක් බවට පත් කළ යුතුය.

2011 වසරේදී පාලක සභාව විසින් ලබාදුන් නොමසුරු සහයෝගය හා මගපෙන්වීම වෙනුවෙන් මාගේ ප්‍රණාමය පුද කරමි. එසේම ඇදුරු මඩුල්ලට හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයට වසර පුරා ඔවුන් දුන් සහයෝගය වෙනුවෙන් ද මම මාගේ හද පිරි ස්තූතිය පුද කරමි.

බී.විජයරත්න

අධ්‍යක්ෂ / ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය


## 06- හැඳින්වීම

1982 අංක 09 දරන පනතේ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ස්ථාපනය කොට ඇති අතර,එය රාජ්‍ය අංශයේ හැකියාවන් වර්ධනය කිරීමේ අරමුණින් ස්ථාපිත කර ඇති ප්‍රමුඛපෙළේ වෘත්තීය ආයතනයකි. රාජ්‍ය අංශයේ කළමනාකරුවන්ගේ හැකියාවන් සංවර්ධනය කිරීම සහ රාජ්‍ය අංශයේ ආයතනවල කාර්ය සාධනය ඉහළ නැංවීමේ ක්‍රියාදාමය සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත නීති සම්පාදනයෙන් බලතල පවරා ඇත.

ඒ අනුව, මහජනතාව වෙත ඉහළ ගුණාත්වයකින් යුත් රාජ්‍ය සේවාවක් සැපයීමට හැකිවන පරිදි රාජ්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සියලුම මට්ටම් වල නිලධාරීන්ගේ දැනුම හා හැකියාවන් වර්ධනය කිරීම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ මූලික කාර්යභාරයකි. එහි පුහුණු ක්‍රියාකාරකම්වලට අමතරව, රාජ්‍ය අංශයේ කාර්යසාධනය ඉහල නැංවීම සඳහා දායකත්වය ලබා දීම පිණිස කළමනාකරණ උපදේශන සේවා, පර්යේෂණ සහ ප්‍රතිපත්ති විශලේෂණය ආශ්‍රිත ක්‍රියාකාරකම්වලද අප ආයතනය නියැලී ඇත. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ස්වකීය වගකීම් ඉටුකිරීමේදී වසර 40ක අත්දැකීම් සපුරණ අතර, ඒ තුළ මෙරටෙහි අවශ්‍යතාවයන්ට අනුව රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධනය වෙනස් කිරීම අරභයා සිදුකළ කාර්යය හා ඵලදායී ප්‍රතිචාරයන් යලි යලිත් අවධාරණය කෙරෙයි.

| **ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් සපයනු ලබන සේවා සහ පුහුණු වැඩසටහන් පහත සඳහන් වර්ගීකරණයන් යටතේ වෙන්කර දැකවිය හැකිය.** |
|---|
| **සේවාරම්භක පුහුණු වැඩසටහන් (කොටස් වශයෙන් පිරිවැය අයකර ගැනීමේ පදනම මත පැවැත්වේ)** |
| **මධ්‍ය වෘත්තීය පුහුණු වැඩසටහන් (කොටස් වශයෙන් පිරිවැය අයකර ගැනීමේ පදනම මත පැවැත්වේ)** |
| **උපලේඛගත පුහුණු වැඩසටහන් (මධ්‍යම ආණ්ඩුවේ ආමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල නිලධාරීන් සඳහා නොමිලයේ පවත්වනු ලැබේ)** |
| **උපලේඛනගත පුහුණ වැඩසටහන් (පිරිවැය අයකරගැනීමේ පදනම මත පැවැත්වේ)** |
| **පුහුණු සහ කළමනාකරණ උපදේශන සේවා (පිරිවැය අයකරගැනීමේ පදනම මත පැවැත්වේ)** |

# 07. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සංවිධාන ව්‍යුහය



# 08 - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සතු භෞතික සම්පත්

සහභාගිවන්නන් උදෙසා වඩාත් හොඳ අධ්‍යයන-පරිසරයක් සැපයීම සඳහා, ශ්‍රී ලංකා සංවර්ධනපරිපාලන ආයතනය විසින් සියලුම දේශනා ශාලා සඳහා නවීන පහසුකම් සපයා ඇත.එවැනි දේශන ශාලා 18ක් සඳහා වායු සමීකරණ යන්ත්‍ර සවිකිරීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන ඇත. ඊට අමතරව මෙම දේශන ශාලා සඳහා නවීන ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ සවිකොට ඇත.







ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ප්‍රධාන ශ්‍රවණාගාරය මගින් සහභාගිවන්නන් 150 දෙනෙකු සඳහා පමණ ආසන පහසුකම් සපයයි. ස්ථිර ලෙස සවි කර ඇති මහජන ඇමතුම් පද්ධතියකින්ද සමන්විත මෙම ශ්‍රවනාගාරය එකවර විකාශය වන අනුවාදන පහසුකම් සහිත කාමර දෙකකින සමන්විත වන අතර, එහි පුද්ගලයන 40 දෙනෙකු සඳහා සම්මන්ත්‍රණ පහසුකම් සලසා ඇත. මීට අමතරව (බාහුමාධ්‍ය) මල්ටි මිඩියා වැනි අනෙකුත් උපකරණ භාවිතා කිරීමේ පහසුකම්ද සලසා ඇත.

නේවාසික පුද්ගලයින්ගේ භාවිතය සඳහා රූපවාහිණී නැරඹුම් කාමරයක්ද සපයා ඇත. මේ මගින් එම පුද්ගලයින්ට තම විවේක කාලය ඵලදායී අයුරින් ගත කිරීමට හැකියාව ලැබෙනු ඇත.





පාඨමාලා සඳහා සහභාගීවන්නන් උදෙසා නේවාසිකාගාර පරිශ්‍රයේ බිම් මහලේ වෙනම කෑම කාමර පහසුකම් ඇත. කාර්ය බහුල වේලාවන්හීදී ආපන ශාලාවේ තදබදය අඩුකිරීම සඳහා මෙය පිටිවහලක් වී ඇත.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් කොළඹින් බැහැර පුද්ගලයින් සඳහා අධ්‍යයන පහසුකම ලබා දෙන බැවින් ගෙවීමේ පදනම මත ඔවුන් වෙත නේවාසික පහසුකම් ලබා දේ. දැනට ගෘහභාණ්ඩ සහිත තනි කාමර 60ක් සහ එක් කාමරයක ඇඳන් 06 බැගින් වූ විශාල කාමර 06ක් ඇති අතර, ඊට අමතරව වායු සමණය කළ විශාල කාමර 04ක් ඇත. නගරය තුල දැනට පවත්නා මිල ගණන් හා සැසඳීමේදී මෙම නේවාසිකාගාර පහසුකම් සඳහා අයකරන ගාස්තු ඉතාමත් අවම මට්ටමක පවතී.





ආයතනයේ වාහන සඳහා මෙන්ම පාඨමාලා සඳහා සහභාගීවන්නන් වාහන ගාල්කිරීමේ පහසුකම ආයතන පරිශ්‍රය තුලම සපයා ඇත. ඉතාමත් ජනාකීර්ණ ප්‍රදේශයක මෙවැනි පහසුකම් නොමිලේ සැපයීම සම්බන්ධයෙන් පාඨමාලා සඳහා සහභාගීවන්නන් තම කෘතඥතාව පළකර සිටි.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුස්තකාලය සතුව කළමනාකරණය ආශ්‍රිත ශික්ෂණය සම්බන්ධයෙන් පොත් එකතුවක් සහ සඟරා 110 කට වැඩි ප්‍රමාණයක් පවතී.
වෙනස්වන අවශ්‍යතාවයන්ට අනුව පුස්තකාලය ක්‍රමානුකූලව යාවත්කාලීන කරනු ලැබේ.



# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ උපාය මාර්ගික යොමු කිරීම්

# 9. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ උපාය මාර්ගික යොමු කිරීම්.

## 9.1 අවස්ථාගත විමර්ශනය සහ සන්දර්භය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂවරයා වන බී.විජයරත්න මහතාගේ නායකත්වය යටතේ මෙම ආයතනය සහ ඒ මගින් ලබාදෙනු ලබන සේවාවන් අන්තර්ජාතික ප්‍රමිතයන් අනුව මෙහෙයවීම ප්‍රධාන අභිලාෂය වී ඇත. ඉදිරි පස් වසරක කාලපරිච්ඡේදය තුලදී ආයතනයේ අරමුණ වන්නේ කලාපීය සහ අන්තර්ජාතික වශයෙන් පිළිගැනීමක් ඇති පුහුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ විශිෂ්ඨතම ආයතනය බවට පත්වීමය. දශක 03ක් පුරා පැවති යුද්ධය අවසන් වීමත් සමඟම එළඹී ප්‍රගතිශීලී සංවර්ධන කාලපරිච්ඡේදය අභිමුව ආයතනය මගින් ලබාදෙනු ලබන පුහුණු කිරීමේ සේවාවන් ගෝලීය මට්ටමේ ප්‍රමිතීන්ට අනුකූලව සංවර්ධනය කිරීම සඳහා මෙම ආයතනය මනා තත්වයක ඇත.

අතීතයේදී සම්ප්‍රදායික ශ.දු.අ.ත විශ්ලේෂණයෙන් ආයතනයේ කටයුතු සිදුකොට ඇති අතර, එය පූර්ව ඒකාබද්ධ සැලසුම් වල නිරූපණය කොට ඇත. පසුගිය කාලපරිච්ඡේදය පුරාවට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන වලින් සමන්විත විචල්‍යයන් බොහොමයක් නොවෙනස්ව පවතින බව විද්‍යාමාන වේ. දැනට මෙම ආයතනය ''විශිෂ්ඨත්වය'' කරා රැගෙන යාම සම්බන්ධයෙන් ඇති ප්‍රබලතම බාධකය වී ඇත්තේ සංවිධානයේ වැඩසටහන් සැලසුම් කිරීමේ සහ සම්පාදනය කිරීමේ ප්‍රමිතයන්ය.

අතීත හා වර්තමාන පරිසර සාධකයන්ගේ සාරාංශය පහතින් දක්වා ඇත. වර්තමාන නායකත්වය, රජයේ සහයෝගය සහ රාජ්‍ය අංශය තුල පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා වූ කේන්ද්‍රීය ආයතනය ලෙස ව්‍යවස්ථාදායකය විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත අත්කර දුන් පිළිගැනීම සාර්ථකත්වය කරා ළඟා වීමේ මූලික ශක්තීන් බවට පත්වී ඇත. රාජ්‍ය අංශයේ ව්‍යවසායක් සතුව පවත්නා විභව්‍ය වශයෙන් ප්‍රමාණ කල නොහැකි පිවිසුම සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සතුව පවත්නා තොරතුරු සහ සම්පත් ජාලය මගින් සංවිධානයේ මූලික ශක්තීන්ගේ බලය තවදුරටත් වර්ධනය කරනු ලබයි. ආධාරක ව්‍යවස්ථාදායකය මගින් සුවිශේෂී බලයක් සහ අධිකාරයක් සපයනු ලැබුවද, අභිවෘද්ධිය අපේක්ෂිත ක්ෂේත්‍රය වන අභ්‍යන්තරික සේවා-වන්හි ශක්‍යතා පිරිවිතරයන් සම්බන්ධයෙන් සැලසිය යුතු තරමේ අවධානයක් යොමු කල යුතුය.

ආයතනයේ මෙහෙයුම් තත්ත්වය සම්බන්ධයෙන්80% කට වඩා වැඩි බලපෑමක් දක්වනු ලබන ප්‍රධාන පෙලේ සාධක කිහිපයක් පහතින් දක්වා ඇත.

- ❖ පුරවැසි කේන්ද්‍රීය සේවා සපයනු ලබන ක්‍රියාශීලී, අනුකූලතාවය දක්වනු ලබන සහ ඒකාබද්ධ මෙහෙයුම් ආකෘතිය.

- ❖ ආයතනික සංයුතිය සහ සම්මතගත අන්තර්ජාතික සේවා සහ මෙහෙයුම් ප්‍රමිතයන් සඳහා

සහය දක්වනු ලබන ඒකාබද්ධ අන්තර් කාර්යසාධන කළමනාකරණය සහ මෙහෙයුම් ආකෘතිය.

❖ මූලික ඒකක මගින් හැසිරවෙන ආයතන ගත මෙහෙයුම් පද්ධතිය මගින් දෙපාර්තමේන්තු සහ සේවා මෙහෙයුම් පරීක්ෂා කිරීම

සංවිධානයේ ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම සම්බන්ධයෙන් නිර්මාණය වී ඇති බාධක හා දුෂ්කරතා ඇතුළත් සංචරක පිරිවිතරයන් රාශයක් ඉහත සඳහන් කාර්යය ක්ෂේත්‍රයන් තුන තුලට අන්තර්ගත වේ. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගතහොත්, මෙම ක්ෂේත්‍රයන්ගේ සුවිශේෂී බලපෑම හේතුවෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුහුණු කිරීමේ සේවාවන් සම්බන්ධයෙන් සැලකිය යුතු තරමේ පාරසරික තර්ජන ඇති විය හැකිය. දිවයිනේ විවිධාකාර වූ පුහුණු සේවාවන්ගේ අවශ්‍යතාවයන් පිරිමසාලීම සඳහා අනුග්‍රාහක පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන ඇති කිරීම, තීරණාත්මක සහ තත්‍ය තර්ජනයක් වී ඇත. ස්වාධීන උපදේශකවරුන් සහ උපදේශන සංවිධාන සම්බන්ධයෙන් යොදවනු ලබන සම්පත් අන්‍යාකාරයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මත ආයෝජනය කළ හැකි නම් එය ප්‍රසංශනීය කර්තව්‍යයකි.

රාජ්‍ය අංශයේ පුහුණු කිරීම කේන්ද්‍රීය ආයතනය මෙන්ම ප්‍රමුඛ පෙලේ මධ්‍යස්ථානය ලෙස මෙතෙක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් අත්පත් කරගත් කීර්තිය හා පිළිගැනීම අහිමිවීම සම්බන්ධයෙන් ඉහතින් සඳහන් කර ඇති තර්ජනයන් බලපෑ හැකිය.
පසුගිය කාලවකවානුවේදී පවා ඉහතින් සඳහන් කළ විචල්‍යයන් හඳුනාගෙන පැවති අතර, මෙම තර්ජනයන් මෙන්ම ඉහතින් සඳහන් කළ දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා සාමූහිකව ප්‍රයත්න දරා ඇත. මෙම ගැටලුව එලෙසම පවතින වාතාවරණයක ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් මුහුණපානු ලබන දුර්වලතා සහ තර්ජන මඟහරවා ගැනීමේ අභිලාෂයෙන් මෙම අංශය මගින් මුලුමනින්ම වෙනස් මුහුණුවරක ප්‍රගතිශීලී උපාය මාර්ගයක් සැලසුම් කොට ඇත.

පූර්ණ වශයෙන් වෙනස් මුහුණුවරකින් හඳුන්වා දී ඇති මෙම අංශය මගින් සංකල්පිත මෙහෙයුම් ආකෘතියේ න්‍යාය සහ උපායමාර්ගික කාර්ය සැලැස්ම යන ද්වී ආකාර වූ සැලස්ම මැනවින් විදහා දක්වා ඇත. මේ මගින් දැනට පවතින වාතාවරණය සඳහා අතිරේක හා නව විසඳුමක් සපයනු ලබයි. අපේක්ෂිත උපාය මාර්ගයේ අරමුණ වනුයේ ශක්තිමත් මෙහෙයුම් කාර්ය රාමුවක් නිර්මාණය කිරීම සහ විශිෂ්ඨතම පුහුණු කිරීමේ හා සේවා සැපයීමේ ඵලදායී වැඩ පරිසරයක් නිර්මාණය කළහැකි ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය අන්තර්ජාතික වශයෙන් පිළිගත් මට්ටමක් කරා ඔසවා තැබීමයි.

## 9.2 සංදර්භයඃ-

මානව සම්පත් සංවර්ධන යාන්ත්‍රණය විවිධාකාර වූ මාර්ගයන් ඔස්සේ අවබෝධ කරගැනීම සහ යොදා ගැනීම් සිදුකළ යුතුය. මීට ප්‍රධානතම හේතුව වී ඇත්තේ මානව සම්පත් සංවර්ධන යාන්ත්‍රණය නිශ්චිත සන්දර්භයක් ඇතුළත අවබෝධ කරගැනීම සහ යොදා ගැනීම සිදු කළ යුතු වීම සහ එය සංවිධානයෙන් සංවිධානයට, කර්මාන්තයෙන් කර්මාන්තයට සහ රටින් රටට වෙනස් මුහුණුවරක් ගැනීමයි. මෙලෙස මානව සම්පත් සංවර්ධන යාන්ත්‍රණය එය මූලික වශයෙන් පරිකල්පනය කළ ආකාරය මත අර්ථනිරූපනය සහ අවබෝධ කරගැනීම සිදු කෙරේ.

### සංදර්භයඃ-

අතිගරු ජනාධිපතිතුමාගේ උද්යෝගී හා දූරදර්ශී නායකත්වය යටතේ ශ්‍රී ලංකාව ආර්ථික වශයෙන් හා සංස්කෘතික වශයෙන් ලොව වඩාත් ප්‍රගතිශීලි ජාතියක් බවට පත්කිරීමේ පුළුල් ජාතික මෙහෙවෙර කරා ලඟා වෙමින් පවතී. විශේෂයෙන්ම මෙම ඉලක්කය සාක්ෂාත් කරලීම පිණිස, නාවික, ගුවන් සේවා, වානිජ, දැනුම සහ බලශක්ති යන සම්පත් සම්බන්ධයෙන් වූ මධ්‍යම කේන්ද්‍රස්ථානය වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම පිණිස ජාතික මට්ටමේ ප්‍රයත්නයන් සඳහා පියවර ගෙන ඇත. මෙය නිසැකවම ජනතාවගේ සුභසිද්ධිය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ගයකි. එම සංවර්ධන ක්‍රියාදාමයන් මගින් ජනතා සුභසිද්ධිය සැලසීමට හැකිවීම තුළින් රාජ්‍ය මගින් ඉටුවිය යුතු වගකීම් ඉටුකිරීමටද රාජ්‍ය සේවය දායක විය යුතුය.

### මානව සම්පත සංවර්ධනය.

කල්පවත්නා ප්‍රගතිශීලී ආර්ථික සංවර්ධනය සහ පුරවැසි කේන්ද්‍රීය රාජ්‍ය සේවයක් සාක්ෂාත් කරලීමේ කර්තව්‍ය මුදුන් පමුණුවා ගැනීම පිණිස සාධක සමූහයක් ඒකරාශි වීමේ අවශ්‍යතාවය පවතී. උපායමාර්ගික කේන්ද්‍රස්ථාන සංවර්ධනය හෝ ආසියාවේ ආශ්චර්ය කරා ශ්‍රී ලංකාව රැගෙන යාම වැනි ප්‍රයත්නයන් බොහෝ විට මානව ප්‍රාග්ධනය නියාමනය කිරීම, මානව ප්‍රාග්ධන සම්පත් සහ හැකියාවන් මත ස්ථිරවම පදනම් වනු ඇත. රාජ්‍ය සේවයේ පරිපාලන කාර්යරාමුව තුලට අයත් සේවකයන් හැරුණු කොට, මෙම කර්තව්‍යය මුදුන් පමුනුවාගැනීමේ අභිලාෂයෙන් වැඩි වගකීමක් දරනු ලබන වෙනත් පුද්ගල කණ්ඩායමක් නොමැති තරම්ය. ප්‍රමුඛපෙළේ රාජ්‍ය සංවිධාන සහ අමාත්‍යාංශ වල සේවය කරන නිලධාරීන්ගේ සිට රාජ්‍ය සේවයේ පරිපාලන කටයුතු වල නිරතව සිටින පරිපාලන නිලධාරීන් දක්වා වූ මෙම පුද්ගලයින්ගේ සාමූහික හැකියාවන්, විභව්‍යතාවන් සහ මෙහෙයවීම් මගින් ශ්‍රී ලංකාව ස්වකීය අරමුණු මුදුන් පමුනුවා ගනීද නැද්ද යන්න සෘජුවම තීරණය කරනු ලබයි.

### ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, ස්වකීය හැකියාවන් මෙන්ම කළමනාකරණ යටිතල පහසුකම් යන ද්වි ආකාර වූ සම්පත් සමඟින් රාජ්‍ය අංශයේ සංවර්ධනයේ ප්‍රමුඛයා ලෙස මහඟු සේවයක් ඉටු කරනු ලබයි. රාජ්‍ය අංශයේ සංවිධාන සහ ඒ තුළින් පුරවැසි කේන්ද්‍රීය සේවා සැපයුමක් සහිතව රටේ දිගුකාලීන අරමුණු සාක්ෂාත් කර ගැනීම අරභයා අවශ්‍ය හැකියාවන්, ක්‍රමවේද සහ නිපුණතා සපිරි සේවක පිරිසක් සකස් කිරීමේ අතිශය වැදගත් කාර්යය භාරය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත පැවරී ඇති වගකිමකී. කෙසේ වුවද සංවිධානයේ වර්තමාන හැකියාවන්ගේ පරිමාව සහ සඵලතාව ඉහළ නැංවීම කොහෙත්ම ප්‍රමාණවත් නොවේ. අවශ්‍ය වන්නේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් එහි මෙහෙයුම ඉන් සපයනු ලබන පුහුණු කිරීමේ සේවාවන් හා ව්‍යුහය වෙනස් කිරීම සහ සම්පතම අභියෝග සාකෂාත් කර ගනු ලබන ආකාරයේ මූලික වෙනසක් සිදු කිරීමක්ය.

අතීතයේ පැවති වාතාවරණය කෙසේ වුවද ජාතික දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය උපාංග සහ තාක්ෂණය සමඟ පරිපාලන යටිතල පහසුකම් සපුරාදෙන සංවිධානයක් වශයෙන් ඒ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් හා උපරිම ජනතා සුභසාධනය සලසමින් රටේ ප්‍රගතිශීලී සංවර්ධනය වෙත දායක වියහැකි, විනිවිදභාවයෙන් යුත් ආයතනයක් වශයෙන් රාජ්‍ය අංශයේ ව්‍යවසායන් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පය සාක්ෂාත් කළ හැකි මට්ටමක ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය දැනට ක්‍රියාත්මක වන බව පැහැදිළිව විද්‍යාමාන වේ.


සියලුම රාජ්‍ය පරිපාලන සංවිධාන සහ ඒවායේ අදාල කාර්යය මණ්ඩල ඇතුළත් පරිපාලන යටිතල පහසුකම් සපුරාලීම සඳහා ඉලක්කගත කණ්ඩායම් වල ආකල්ප හා චින්තන රටාවන් අනුව මූලික වෙනසක් සිදු කිරිම මෙන්ම එවැනි වෙනසක් ඇති කිරීම සහ පවත්වාගෙන යාම පිණිස අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය කරන්නේ කෙසේද යන්න ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මුහුණපාන අභියෝගයකි. මානව සම්පත් සංවර්ධන ආයතනයක් වශයෙන් සහ අවශ්‍ය හැකියාවන් සහ නිපුනතාවන් සමඟ ජාතික පරිපාලන කාර්යයරාමුව බලගැන්වීමේ කේන්ද්‍රස්ථානය වශයෙන් ඉහතින් සඳහන් කර ඇති ජාතික ඉලක්කයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වන අවම ධාරිතාවයට වඩා අඩුමට්ටමක ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ක්‍රියාත්මක වන බව පැහැදිළිය.

රාජ්‍ය අංශයේ ව්‍යවසායක් වශයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය දැනට භාවිතා කරනු ලබන මෙහෙයුම් යාන්ත්‍රණය සහ ආකෘතිය මගින් දැනට ඉල්ලුමක් පවතින සේවාවන් සැපයුම් කිරීමට අපොහොසත් වී ඇත. මේ සඳහා ප්‍රධාන හේතු 02ක් බලපා ඇත. ඉන් පළමු වන කරුණ නම් දැනට භාවිතයේ ඇති මෙහෙයුම් ආකෘතිය රේඛීය ස්වරූපයක් ගන්නා අතර, බොහොමයක් අංග සම්බන්ධයෙන් තොරතුරු සහ උගන්වනු ලබන විෂය දැනුම ජනතාවගේ සුභසිද්ධිය සඳහා යොදා ගැනෙන බව පිළිගැනීම මත පදනම්ව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය රාජ්‍ය අංශයේ ව්‍යවසායන් සමඟ බොහෝ විට අන්තර් ක්‍රීයාකාරී මට්ටමින් පමණක් ක්‍රියාත්මක වීමයි. එබැවින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, මහජනයා සමඟ ඇති සබඳතාවන් ඒ මගින් වලක්වනු ලබයි. දෙවන කරුණ නම් මෙම ආකෘතියේ උපරිම ක්‍රියාකාරී මට්ටම අත්පත් කරගත හැක්කේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පූර්ණ වශයෙන් අදාල තොරතුරු ලබාගැනීමේ මට්ටමට පිවිසුනහොත් පමණි. එනම් සේවාවන්හි ගුණවත්ව සම්බන්ධයෙන් අදාල වන තොරතුරු සහ පුරවැසියන් වෙතින් ලැබෙන ප්‍රතිචාර විකෘති කිරීමකින් තොරව රාජ්‍ය අංශයේ ව්‍යවසායන් හරහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත ගලා යාම මේ මගින් අපේක්ෂා කෙරේ. තොරතුරු විකෘතිවීම වළක්වාලීම සඳහා රාජ්‍ය අංශයේ සැකැස්ම තවමත් පරිණත මට්ටමට පැමිණ නොමැත.

පවතින මෙහෙයුම් ආකෘතියේ අසාර්ථකත්වය අවබෝධ කර ගැනීම සඳහා සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නව මෙහෙයුම් ක්‍රීයාකාරීත්වය අවබෝධ කරගැනීම සඳහා මෙතැන් සිට ඉදිරියට ඇති පිටුවල සවිස්තරාත්මකව ඉදිරිපත් කොට ඇති පද්ධති විශ්ලේෂණය අධ්‍යයනය කිරීම වැදගත්ය.


## 9.3 වර්තමාන මෙහෙයුම් ආකෘතිය සහ පරිසරය

ආයතනයක මූලික වෙනස්කමක් ඇති කිරීම ඇත්ත වශයෙන්ම පහසු කටයුත්තක් නොවේ. අවශ්‍ය කෙරෙන වෙනස්කිරීම අවබෝධ කරගැනීම සඳහා පවත්නා නිදර්ශනය පළමුව අවබෝධ කර ගත යුතුයි. දැනට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය එක් දිශාවකට පමණක් ප්‍රතික්‍රියා දක්වන පරිසරයක ක්‍රියාත්මක වේ.




ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, අතීතයේදී තම සේවාලාභීන් සමඟ පැවති සන්නිවේදන කටයුතු එක් දිශාවකට පමණක් සීමා කොට පැවතුනි. සංවිධානය විසින් පුහුණු අවශ්‍යතා පිළිබඳ විශ්ලේෂණයකින් තොරව සහ ආයෝජන මත ලැබෙන ප්‍රතිලාභ හෝ තම පුහුණු පාඨමාලා වල ප්‍රතිඵල පිළිබඳ හෝ අවධාරණයකින් තොරව ස්වකීය පාඨමාලා සැලසුම් කිරීම හා පවත්වා ගෙන යාම සිදු කරන ලදී. '' අප විසින් උගන්වනු ලබන දෙය නිවරදිය සහ රාජ්‍ය සේවයේ පරිපාලනය මෙහෙයෙවන නිලධාරීන් සඳහා අදට අවශ්‍ය එපමණයි'' යන මතය මත පදනම්ව සංවිධානය විසින් තම කටයුතු සරල ලෙස පවත්වාගෙන යන ලදී. පසුගිය වකවානුව තුළදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සේවාලාභීන්ට අපේක්ෂිත මට්ටමේ නිපුණත්වය ලබා දීමට නොහැකි වූ අතර, ඔවුන්ට ඉගැන්වූ දෙය ඔවුන් පහසුවෙන් හැදෑරූ අතර, අවසන් පාරිභෝගිකයා වන මහජනතාව වෙත ඉතාමත් සීමිත වටිනාකමක් විතැන් විය. මෙම පද්ධතියේ ඇති විෂමතාව මේ මගින් පැහැදිලිව විද්‍යාමාන වේ. සංවිධානය විසින් උචිත ක්‍රියාපටිපාටියකින් තොරව විෂය මාලාව සැලසුම් කොට ඇති අතර, පුහුණු පාඨමාලා සඳහා සහභාගීවන්නන් ඔවුන්ට උගන්වනු ලබන දෙය හදාරනු ලබන අතර මහජනතාව වෙත සේවා සැලසීම සඳහා ඔවුන් විසින් ඉටුකරනු ලබන කාර්යය ක්‍රියාත්මක කිරීමේදී ඒ තුළත් මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ අත් නොවේ. එසේම සේවාලාභී මහජනතාව වෙත අදාල ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සුවිශේෂී දැනුමක් නොමැති නිසා තමන් ලද සේවා සම්බන්ධයෙන් පරිපාලනය වෙත තොරතුරු දැන්වීම සිදු කළ නොහැකි අතර, රාජ්‍ය ආයතනයන්හි පරිපාලනය විසින් ඉටු කරනු ලබන සේවාවන්හි ප්‍රමිතිය සම්බන්ධයෙන් ඔවුන් අතෘප්තියට පත්වේ. මානව සම්පත් සංවර්ධන ක්‍රියාමාර්ග ඇතුළත් සම්පූර්ණ ක්‍රියාපටිපාටිය මනෝ මූලික සංකල්පයක් වන අතර, රේඛීය වශයෙන් අවම සේවා සැපයුමක් සහිතය.

මෙම ඌනතාව හේතුවෙන් ආයතනයක් වශයෙන් නිර්මාණය වී ඇති පිළිගැනීම සහ සේවාලාභීන් වෙත සපයනු ලබන පුහුණු පාඨමාලාවන්හි වටිනාකම අවසන් වශයෙන් මහජනතාව වෙත විතැන් වේ. අවම සැලසුම් පරිචයන්ගෙන් සමන්විත පුහුණු වැඩසටහන් වල දුර්වලතා හේතුවෙන් දැනුම සහ නිපුණතා ප්‍රවාහයන්ගේ ගලායාම සම්ප්‍රදායික ක්‍රම ඔස්සේ සිදු වන නිසා ඉන් ඇති වන ප්‍රතිලාභ අවම මට්ටමක පවතින අතර, සේවාලාභී අවසන් පරිභෝගිකයා වන රටේ පුරවැසියා වෙත 1% ක් වැනි ඉතා අඩු ප්‍රතිලාභයක් අත්පත් වේ.




**අත්පත් කර ගත් වටිනාකම 10%**

මේ සඳහා බලපා ඇති හේතුව වී ඇත්තේ පුහුණු පාඨමාලා සඳහා සහභාගීවන්නන්ට තම අවශ්‍යතා වලට අනුගත වන පරිදි පුහුණු වැඩසටහන සැලසුම් කොට නොමැති වීමයි. අවශ්‍යතා පිළිබඳව විධිමත් විශ්ලේශනයක් සිදු කිරීමෙන් තොරව එවැනි අවශ්‍යතාවන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට නොහැකිය. පුහුණු අවශ්‍යතා පිළිබඳ විශලේෂණයක් සිදු කිරීමට සහ හැකියාවන් වර්ධනය කිරීමේ වඩාත් හොඳ කාර්යය රාමුවක් සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය අංශයේ පරිපාලන කාර්යයරාමුව තුල විවිධ කාර්යය ක්ෂේත්‍රයන් යටතේ මහජනතාව වෙත සේවා සැපයීම සඳහා කුමන ආකාරයේ හැකියාවන් සහ නිපුනතාවයන් අවශ්‍ය වන්නේද යන්න සම්බන්ධයෙන් පළමුව සාක්ෂිගත අවබෝධයක් ලබා ගත යුතුය.

**පුහුණු වටිනාකම 30%**

පුහුණු පාඨමාලා සඳහා සහභාගීවන්නන්ගෙන් වැඩි ප්‍රමාණයක්. අවශ්‍ය කෙරෙන හැකියාවන් වර්ධනය කිරීම සම්බන්ධයෙන් අවම මට්ටමේ අවධාරණයක් සහිත යෝග්‍ය නොවූ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව අධ්‍යයනය කෙරෙන අතර, එවැනි අධ්‍යයන පාඨමාලා මගින් අත්පත් කර ගන්නා වටිනාකම් ඉතාම අඩු මට්ටමක පවතී. රාජ්‍ය අංශයේ පවත්නා ඉහළ මට්ටමේ බල ව්‍යාප්තිය හේතුවෙන් පාඨමාලා සඳහා සහභාගීවන්නන් වෙතින් ඉතා අඩු මට්ටමේ ඉල්ලුමක් නිර්මාණය වීම නිසා පාඨමාලා වල අදාලත්වය, යෝග්‍ය බව හෝ එය නවතාවයකින් යුක්තද යන්න නොතකා උගන්වනු ලබන දෙය හැදෑරීමට ඔවුන් වඩාත් ප්‍රිය කරති.

**විතැන් වූ වටිනාකම 1%**

පාඨමාලා සඳහා සහභාගී වන්නන් (රාජ්‍ය අංශයේ පරිපාලනය මෙහෙයවන නිලධාරීන්) බොහෝවිට අදාලත්වයක් නොමැති න්‍යායාත්මක දැනුම සම්බන්ධයෙන් පමණක් තම අධ්‍යයන කටයුතු සිදු කරන නිසා ඔවුන් සතු අවම මට්ටමේ හැකියාවන් මගින් මහජනතාව වෙත ඉටුකරන සේවාවන්ද ඉතාමත් අවම මට්ටමක පවතී. එමනිසා ඔවුන් තමන්ට ආවේණික වූ කළමනාකරණ ක්‍රමවේදයක් අනුගමනය කිරීම නිසා බොහෝ අවස්ථා වලදී එය සේවා ප්‍රතිග්‍රාහීන්ට ඉතාමත් අහිතකර ලෙස බලපායි. පුරවැසියන්ගෙන් ලැබෙන ප්‍රතිචාර පිළිබඳ සැලකිල්ලක් දැක්වීමට අපොහොසත් වන මෙවැනි කාර්යය පටිපාටියක් මගින් අදාල තත්ත්වය පිළිබඳ තාත්වික නිරූපණය ඉදිරිපත් නොකරයි.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙහෙයුම් පද්ධතිය එක් දිශාවකට පමණක් අනුගතව පිහිටුවා ඇති බවත් ප්‍රතිචාරාත්මක නොවන සහ උදාසීන පරිසරය ඊට හේතු වී ඇති බවත් පැහැදිලිව විද්‍යාමාන වේ. සක්‍රීය පරිසරයක් තුළදී, පාරිභෝගික උවමනාවන් සහ අවශ්‍යතාවන්ට අනුකූලව වෙනස්වීම හෝ අනුගත වීම සියලුම මානව සම්පත් සංවර්ධන ආයතන විසින් මුහුණ දෙනු ලැබිය හැකි සුවිශේෂී ගැටළුවක් විය හැකිය. මෙම සන්දර්භය තුළ පාරිභෝගිකයාගේ උවමනාවන් සහ අවශ්‍යතාවන් වන්නේ සුදුසු, නවීන දැනුමෙන් පිරිපුන් හැකියාවන් පිළිබඳ හැදෑරීමයි.

ආයතනයේ ඉතිහාසයේ වැඩි කාලයක් තුල මෙම අභියෝගයට මුහුණ දී ඇති බව පැහැදිලිව පෙනේ. පවත්නා ආකෘතිය පිළිබඳව විමර්ශනාත්මක ප්‍රවේශයක් පහතින් දැක්වේ.

❖ රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධන ක්‍රියාදාමයන් වැඩි දියුණු කිරීම සඳහා මෑත භාගයේදී වඩාත් පෙරටුගාමී උපාය මාර්ග සංවර්ධනය කොට ඇති අතර, පසුගිය වකවානු තුළදී, මඳ රේඛිය ස්වභාවයක් ගත් බොහොමයක් උපායමාර්ගික ක්‍රියාදාමයන් භාවිතා කරන්නන්ගේ ඉලක්ක හා අරමුණු සමඟම නොගැලපුණ තත්වයක් දක්නට තිබුණි.

❖ පවත්නා මෙහෙයුම් යාන්ත්‍රණය මගින් එක් දිශාවකට පමණක් යොමු වූ සන්නිවේදන හා තොරතුරු ප්‍රවාහයකට ඉඩකඩ සලසයි.

❖ දැරිය හැකි මෙහෙයුම් ධාරිතාවයක් පැවතීම. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සතුව පහළ මට්ටමේ මෙහෙයුම් ධාරිතාවයක් පැවතියද, ඉහළ මට්ටමේ මෙහෙයුම් ධාරිතාවයක් අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය උපායමාර්ගික හා කළමනාකරණ යටිතල පහසුකම් අඩු මට්ටමක පවතී.


❖ සංවිධානයේ ක්‍රියාකාරීත්වය වඩාත් ඉහළ මට්ටමකට රැගෙන යාම සඳහා අවශ්‍ය කෙරෙන ජවය සහ ශක්තිය සපයාදීමට පවත්නා පාරිසරික සහ මෙහෙයුම් ආකෘතිය අපොහොසත් වී ඇත.

පහළම මට්ටමේ කාර්යක්ෂමතාවයකින් යුතුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය දැනට ක්‍රියාත්මක කරනු ලබන මෙහෙයුම් යාන්ත්‍රණය හඳුන්වා දීම සඳහා ඉහත සඳහන් පිටුවල දක්වා ඇති සවිස්තරාත්මක ප්‍රවේශය උපකාරී වේ. උපරිම කාර්යක්ෂමතාවයකින් යුත් මෙහෙයුම් ආකෘතිය සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මතු අපේක්ෂිත තත්ත්වයන් සැලකිල්ලට භාජනය කිරීම ප්‍රයෝජනවත් වනු ඇත.

## 9.4 ප්‍රශස්ත මට්ටමේ පරිසරය සහ උපරිම මෙහෙයුම් කාර්යක්ෂමතාව

ආයතනයක් ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට ප්‍රශස්ත මට්ටමේ තොරතුරු සඳහා ප්‍රවේශයක් තිබිය යුතුය. ප්‍රශස්ත වශයෙන් තොරතුරු ලබා ගැනීම යන්නෙන් අදහස් කෙරෙන්නේ ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් අපේක්ෂා කරනු ලබන සහ / හෝ අවශ්‍ය කෙරෙන ප්‍රමිතීන්ට අනුව රාජ්‍ය අංශයේ නිලධාරීන්ට අවශ්‍ය කෙරෙන නිවරදි දැනුම, නිපුණතා, ආකල්ප සහ හැකියාවන් පිළිබඳව අවබෝධයක්ලබා ගැනීමසඳහාආයතනයසතු හැකියාවයි. සේවා සැපයීමේ කාර්යභාරය තුළදී පමණක් නොව, රාජ්‍ය අංශයේ පරිපාලන සංවිධාන වල මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ කාර්යසාධනය ඉහල නැංවීමේ කාර්යභාරය තුලදීද මෙය ආදල වේ.

සපයනු ලබන සේවාවන්හි ගුණාත්වය සහ ප්‍රමිතිය වර්ධනය කිරීමට  රජයේ නිලධාරීන් මත සැලකිය යුතු මට්ටමේ අභියෝගාත්මක ප්‍රවේශයක් ඇති කිරීම සඳහා මහජනතාව වෙතින් ප්‍රතිපෝෂණය (Feedback) (ප්‍රතිචාර ලබා ගැනීම) ආරම්භ කළ යුතුය. ඉන්පසුව මෙම අභියෝගය, රාජ්‍ය අංශයේ ප්‍රමුඛ පෙලේ පුහුණු සහ සංවර්ධන ආයතනය වෙත විතැන් කළ යුතුය. එනම් ශ්‍රී ලංකා සප.ප.ආ. මෙම තොරතුරු පදනම් කර ගනිමින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් අපේක්ෂිත ප්‍රමිතීන්ට අනුකූලව මහජනතාව වෙත සේවා සැලසීම සඳහා පුහුණු පාඨමාලාවන් වෙත සහභාගීවන්නනන්ට අවශ්‍ය දැනුම, නිපුණතාවන්, ආකල්ප සහ හැකියාවන් වර්ධනය කිරීම සඳහා සහ ඔවුන් බලගැන්වීමට හැකි මනා ගැලපීමකින් යුත් වැඩසටහන් නිර්මාණය කළ යුතුය. මේ මගින් ඥාන වර්ධන සාධක ඇතුළත් පූර්ණ මානව සංවර්ධන පද්ධතියක් නිර්මාණය කළ හැකිවනු ඇත.




පූර්ණ වශයෙන් තොරතුරු ලබා ගැනීම මගින් ඉහත සඳහන් පරිසරය තුළදී ආරම්භයේදීම ඉහල වටිනාකමක් අත්පත් කර ගත හැකි අතර, විධිමත් පුහුණුව සහ හැකියාවන් වර්ධනය කිරීමේ ශිල්පීය ක්‍රම මගින් ආසන්න පාරිභෝගිකයා වන පුරවැසියන් සඳහා විතැන් වන වටිනාකම ඉහළ අගයක් ගනී.

**පුහුණු වටිනාකම 90%:**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පූර්ණ වශයෙන් තොරතුරු ලබා ගැනීමේ ප්‍රවේශයක් වෙත පිවිස ඇති නිසා පුහුණු වැඩසටහන් සඳහා සහභාගීවන්නන්ට වඩාත් උචිත ආකාරයේ නිවැරදි හා යෝග්‍ය පුහුණු හා හැකියාවන් වර්ධනය කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීමට හැකියාව ලැබෙනු ඇත. මේ මගින් පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් ජනිත වන වටිනාකම 90% දක්වා පමණ ඉහළ යනු ඇත.

**මතු අපේක්ෂිත තත්ත්වයන් :-** වෙළඳපොළ තොරතුරු රැස්කිරීම සහ සූක්ෂම ව්‍යුහයක් සකස් කිරීම මෙන්ම එම තොරතුරු මගින් යෝග්‍ය පුහුණු වැඩ සටහන් නිර්මාණය කළ හැකි විශේෂඥ උපදේශක මඩුල්ලක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සතු විය යුතුය.

**අත්පත් කර ගත් වටිනාකම 100%**

පුහුණු වැඩසටහන් ජෛවීය ස්වභාවයක් ගන්නා නිසාත්, දැනුම වඩාත් කාර්යක්ෂමතාවයකින් යුක්තව හුවමාරු වන නිසාත් පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ පිරිස් ස්වකීය විෂය දැනුම සංවර්ධන ක්‍රියාදාමයන් සඳහා යොදවනු ලබයි. ඔවුන්ට භාවිතයට ගත හැකි සහ අවශ්‍ය වන ආකාරයේ විෂය දැනුම ඔවුන් විසින් හදාරා ඇති බව ඔවුන්ට හැඟීයාම හෝ අවබෝධ වීම නිසා දැනුම හා හැකියාවන් අත්පත් කර ගැනීම වඩාත් කාර්යයක්ෂම වී ඇත. වඩාත් හොඳ තත්ත්වයේ සේවාවක් ලබාගැනීම සඳහා පුරවැසියන් වෙතින් ඉල්ලුමක් පැවතීම හේතුවෙන් පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වන්නන් තම අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් වඩාත් පෙරටුගාමී සහ ක්‍රියාශීලී බවක් පෙන්නුම් කරයි.

අත්පත් කර ගත් හැකියාවන්ගේ කාර්යයක්ෂමතාව මේ මගින් ඉහළ නංවන අතර, ඊට ප්‍රතිවිරුද්ධ අවස්ථාවක් වශයෙන් පුහුණු පාඨමාලා සඳහා සහභාගී වන්නන්ට තමන් හදාරනු ලබන දෙය ප්‍රායෝගික භාවිතයට ගැනීම සඳහා අවසන් අරමුණක් නොමැති අවස්ථා ද දැක්විය හැකිය.

**මතු අපේක්ෂිත තත්ත්වයන්:-** පුහුණු පාඨමාලා සඳහා සහභාගී වන වැඩිහිටි සේවාලාභීන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය වන වැඩිහිටි අධ්‍යයන ක්‍රමවේද සහ මනෝභාවික අවබෝධය වැනි පුහුණු සේවාවන් සැපයීම සම්බන්ධ නිවැරදි නිපුණතාවන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සතුව පැවතිය යුතුය. උපදේශනය, පුහුණු කිරීම සහ අනෙකුත් නවීන අධ්‍යයන සංකල්ප වැනි නිවැරදි මානව සම්පත් සංවර්ධනය ආශ්‍රිත පුහුණු වැඩසටහන් සම්බන්ධ ශිල්පීය ක්‍රම සංවිධානය සතුව පවතී නම් පුහුණු පාඨමාලා සඳහා සහභාගීවන්නන් විසින් අත්පත් කරගනු ලබන අධ්‍යයන වටිනාකම 100% පමණ දක්වා ඉහළ යනු ඇත. වැඩසටහනේ නිවැරදි සැලසුම්කරණය මගින් පුහුණු වැඩසටහන නිවැරදිව සපයා දීම සඳහා 90% ක ස්වායත්ත වටිනාකමක් අත්පත් කර දෙන අතර, ඒ මගින් සැලසුම් කළ පුහුණු අත්පොත් සඳහාද ඉහළ වටිනාකමක් ලබා දෙන බැවින් ස්වායත්ත වටිනාකම් 100% දක්වා ඉහළ යනු ඇත.

**විතැන් වන වටිනුකම් 200%**

විධිමත් අවශ්‍යතා විශ්ලේෂණය සඳහා භාවිතා කරන ජෛවීය ස්වභාවයක් ගන්නා මානව සම්පත් සංවර්ධන වැඩසටහන හරහා නිර්මාණය වන ස්වායත්ත අගය 90% වන අතර, නවීනතම වැඩිහිටි අධ්‍යයන ක්‍රමවේද භාවිත කිරීම මගින් විතැන් වන වටිනාකම 100% ක

අගයක් ගනී. අවසන් පුරවැසියා වෙත විතැන් වන සේවා අගය, අත්පත් කරගත් වටිනාකමෙන් බහුගුණ අගයක් ඇති දර්ශකයක් බවට පත්වේ. මීට හේතු වී අත්තේ නියමිත අවස්ථාවේදී නියමිත පුද්ගලයා විසින් නිවැරදි දැනුම අත්පත් කරගත් විට ඔහුගේ / ඇයගේ පරිසරයට උචිත ආකාරයේ දැනුම හා හැකියාවන් ලබා ගැනීම සඳහා භාවිතා කළ හැකි බහුවිධ මාර්ග සොයා ගැනීම සහ ඊට ගැලපෙන අයුරින් ඒවා අනුවර්තනය කිරීම සඳහා සහ වඩාත් ඉහළ වටිනාකමක් නිර්මාණය කිරීම වෙනුවෙන් පුහුණුව ලබන්නන්ගේ මනස තුල එම දැනුම හා හැකියාවන් ක්‍රමයෙන් වර්ධනය වීමයි. මේ මගින් පුරවැසියා වෙත විතැන් වන වටිනාකම ඉහළ අගයක් ගනී.

**ඥාන වර්ධන සාධක.**

සහභාගීවන්නන් විසින් අත්පත් කරගනු ලබන අධ්‍යයන වටිනාකම, සහභාගීවන්නාගේ අභ්‍යන්තර සංජානන ක්‍රියාකාරකම් මගින් සමානුපාතික නොවන ආකාරයෙන් වර්ධනය වීමේදී ඥාන වර්ධන ක්‍රියාවලිය සිදුවේ. මෙම අවස්ථාව නිරූපණය කිරීම සඳහා භාවාත්මක බුද්ධිය සම්බන්ධ මධ්‍යම සංකල්ප යටතේ මනෝභාවයන් කළමනාකරණය කිරීමේ උපක්‍රම සහ ශිල්පිය ක්‍රම පිළිබඳව හදාරණ සිවිල් සේවා පරිපාලන නිලධාරීන් පිළිබඳ උදාහරණය සලකා බලමු. වැඩිහිටි අධ්‍යාපනය සඳහා යෝග්‍ය හා හිතකාමී ආකාරයට පුහුණු වැඩසටහන් නිර්මාණය කිරීම හා සැපයීම සිදු කරන්නේ නම් එකී දැනුම අත්පත් කර ගැනීමෙන් අනතුරුව පුහුණුව සඳහා සහභාගීවූවන් එම සංකල්ප ප්‍රායෝගිකව යොදා ගැනීම ආරම්භ කරන අතර, බහුවිධ යෙදවුම් සිද්ධිදාමයන් නිරූපණය කළ හැකි ආකාරයේ ක්‍රියාකාරකම් වලද ඔවුන්ට නිරත විය හැකිය. ඔහු මහජනතාව සමඟ කටයුතු කලයුතු ආකාරයට ගැලපෙන පරිදි අවස්ථානුකූලව නව නියමයන් සහ යෙදවුම් පිරිවිතරයන් මගින් ලබා ගන්නා මූලික දැනුම මත ඔහු ගොඩනැගෙනු ඇත. මෙම දැනුම ප්‍රායෝගිකව යොදා ගැනීම මගින් අත්පත් කරගත් දැනුම නවීකරණය වන අතර, මෙලෙස නවීකරණය වූ ප්‍රායෝගික හැකියාවන් හා දැනුමේ සෘජු ප්‍රතිලාභියා වන පුරවැසියා වෙත අති විශාල වටිනාකමක් විතැන් වේ.

මෙලෙස යෝග්‍ය ශිල්පීය ක්‍රම භාවිතයෙන් නිවැරදි, උචිත සහ අදාල වන දැනුම, නිපුණතාවන් ආකල්ප සහ හැකියාවන් හුවමාරු වන්නේ නම් පුහුණු පාඨමාලා සඳහා සහභාගීවන්නන්ද ඒ සඳහා වටිනාකමක් ආදේශ කරනු ඇත. මේ මගින් පුරවැසියා වෙත සලසනු ලබන සේවාවන්හි වටිනාකම ඉහළ නැංවෙනු ඇත.

**මතු අපේක්ෂිත තත්ත්වයන්:-** ඥාන වර්ධන ක්‍රියාවළිය සිදුවීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සතුව පරිපූර්ණ තොරතුරු ගලායාමේ ප්‍රවේශයක් තිබිය යුතුය. තවද වඩාත් හොඳ තත්ත්වයේ සේවාවන් ලබා ගැනීම සඳහා පුරවැසියා වෙතින් ප්‍රමාණවත් තරමේ බලපෑමක් ඇති පරිසරයක අඛණ්ඩව වර්ධනය වන ප්‍රතිපෝෂණ සහ මෙහෙයුම් යාන්ත්‍රණයක් සහ පුහුණු වැඩසටහන් සැපයීමේ විශිෂ්ඨතම ශිල්ප ක්‍රම, වඩාත් උසස් මානව සම්පත් සංවර්ධන සංකල්ප ඇතුළත් මනා ලෙස නිර්මාණය කරන ලද වැඩසටහන්ද මෙම ආයතනය සතුව තිබිය යුතුය.

## 9.5 උපරිම කාර්යය සාධනය අත්පත් කර ගැනීම

කාර්යක්ෂමතාව ඉතාමත් පහළ මට්ටමක පවතින, දැනට පවත්නා එක් දිශාවකට පමණක් යොමු වූ ආකෘතිය පිළිබඳව ඉහත පිටු මගින් අවධාරණය කර ඇත. වර්තමානයේදී පුරවැසි කේන්ද්‍රීය මානව සම්පත් සංවර්ධන පරිසරයක් අප සතුව නොපැවති අතර, දැනට කුමන ආකාරයේ පුහුණු වැඩසටහන් සපයන්නේද සහ සැපයිය යුත්තේ කුමන ආකාරයේ පුහුණු වැඩසටහන් ද යන්න අතර සැලකිය යුතු තරමේ සම්බන්ධයක්ද නොමැත. කෙසේ වුවද මෙම ක්‍රියාදාමයන්ගේ අවසන් ප්‍රතිලාභියා වන ශ්‍රී ලාංකික පුරවැසියන් වෙත උපරිම වටිනාකමක් අත්පත් කරදෙන සහ ඥාන වර්ධන සාධක ඇතුළත් වඩාත් හොඳම මෙහෙයුම් ආකෘතිය සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා  සංවර්ධන පරිපාලන ආයතනය දැඩි ප්‍රයත්නයන් දරා ඇත.

එසේ වුවද, එම ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම සඳහා සැලකිය යුතු තරමේ බාධක පවතී. ඉහතින් සඳහන් කර ඇති පරිදි, අවශ්‍ය කෙරෙන උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්ත ආකෘතිය තවමත් අත්පත් කොට ගෙන නොමැත.

**ඉල්ලුම කේන්ද්‍ර කොටගත් මානව සම්පත් සංවර්ධනයඃ-**

දැනුවත්භාවය සහ අවබෝධය අවම මට්ටමක පවතින සම්ප්‍රදායික සංස්කෘතික විචල්‍යයන් හේතුවෙන් රාජ්‍ය සේවයේ ප්‍රමිතීන් ඉහළ මට්ටමකට ගෙනයාම සඳහා මහජනතාව වෙතින් උද්යෝගී බලපෑමක් ඇති වී නොමැත. එවැනි තත්ත්වයක් පැවතියද මහජනතාව වෙතින් ලැබෙන ප්‍රතිපෝෂණ (Feed back) දත්ත ලබා ගැනීමට සහ සකස් කිරීමට පවත්නා ප්‍රතිසක්‍රීය සංස්කෘතික ක්‍රියාකාරීත්වයන් සහ අවම මට්ටමේ කළමනාකරන යටිතල පහසුකම් අපොහොසත් වී ඇත.

සේවා තත්ත්වයන් සම්බන්යෙන් ඉතාමත් අවම මට්ටමේ අවධාරණයක් පවතින බැවින්, මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් පවතින නවීනතම සංවර්ධන ක්‍රියාදාමයන් භාවිතා කරමින් වර්තමානයට උචිත ආකාරයේ වැඩසටහනක් සම්පාදනය කරන මෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙතින් ඉල්ලීම් කිරීම සඳහා ආයතනයේ පාඨමාලා සඳහා සහභාගීවන්නන් අපොහොසත් වී ඇත. මෙලෙස සම්පූර්ණ ක්‍රියාදාමයම පෙරටුගාමී ස්වභාවයක් පෙන්නුම් කිරීමට වඩා ප්‍රතික්‍රියාකාරී ස්වභාවයක් පෙන්නුම් කරයි.

**මතු අපේක්ෂිත තත්ත්වයන්ඃ-**


මේ සම්බන්ධයෙන් වෙළඳපොළ ඉල්ලුමක් පැවතියද ඉහතින් සඳහන් කළ මතු අපේක්ෂිත තත්ත්වයන් අත්පත් කොට ගෙන ඇත්තේ  අර්ධ වශයෙනි. උදාහරණයක් වශයෙන් කාර්යසාධනය පෙරටුගාමී වූ පරිසරයක් නිර්මාණය නොවීමේ අඩුපාඩුව හේතුවෙන් පුහුණු කරන්නන් සහ උපදේශකවරුන් භාවිතා කරනු ලබන ඉගැන්වීමේ සහ පුහුණු කිරීමේ නවීනතම ශිල්පීය ක්‍රම ඉතා අවම මට්ටමක පවතී. ආයතනයේ වර්තමාන මෙහෙයුම් ක්‍රියාකාරීත්වය ඇතුළත විශේෂිත විෂය ධාරාවකින් යුක්ත වැඩසටහන් මාලාවක් (අනෙකුත් කරුණු අතර) සපයනු ලබන ඒකාබද්ධ ඉගැන්වීමේ ආකෘතියක් සංවිධානය සතුව නොපවතී.

**සැකෙවින් දක්වතොත් පවත්නා පරිසරය සහ මෙහෙයුම් යාන්ත්‍රණය ඇතුලත විධිමත් මෙහෙයුම් ආකෘතියක් කරා සංවිධානය මෙහෙයවීම දුෂ්කර අභියෝගයක් වී ඇත. එම නිසා අදාල මෙහෙයුම් පද්ධතිය සහ ඊට අදාල විචල්‍යයන් දෙස වෙනස් ආකාරයකින් බලනු ලබන මූලික වෙනසක් සිදු කිරීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දැනට පවත්නා ආකෘතියේ පවතින සම්ප්‍රදායික බාධක මඟහරවා ගැනීම පිණිස මෙම ක්‍රමවේදය උපකාරී වේ. මානව සම්පත් සංවර්ධන යාන්ත්‍රණය මගින් මෙම අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කෙරේ.**

> ඉහතින් සඳහන් කළ මානව සම්පත් සංවර්ධන යාන්ත්‍රණය මගින් අපේක්ෂා කරන්නේ මෙහි සඳහන් කර ඇති අරමුණු කරා ළඟා වීම පිණිස බලපෑමක් ඇති කරනු ලබන විචල්‍යයන්හි වෙනසක් සිදු කිරීම සහ ඵලදායී ක්‍රමවේදයක් සහිත මෙහෙයුම් ආකෘතියක් ඇති කිරීමයි. ප්‍රගතිගාමී වෙනසකට වඩා ක්‍රියාකාරී වෙනසක් ඇති කිරීම සම්බන්ධයෙන් අපේක්ෂා සහගතව සිටීම වෙනුවට එම වෙනස අත්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ක්‍රියාකාරී ලෙස දායක වී සිටී. මානව සම්පත් සංවර්ධන යාන්ත්‍රණය හරහා පාලනය කළ නොහැකි විචල්‍යයන්ගේ බලපෑම අවම කර ගැනීම සඳහා ආයතනය ප්‍රයන්ත දරනු ලබන අතර, ඉහත පරිච්ඡේදයන්හි සඳහන් කර ඇති ආවේණික දුබලතාවයන් පිටු දැකීම පිණිස මෙහෙයුම් ආකෘතියද නැවත සකස් කෙරෙනු ඇත.


මානව සම්පත් සංවර්ධන යාන්ත්‍රණය භාවිතා කරමින් ජාතික මානව සම්පත් සංවර්ධන පරිසරය සහ ඉගැන්වීමේ ක්‍රමවේද මෙහෙයවීම යටතේ කරුණු දෙකක් ගෙනහැර දැක්විය හැකිය. පළමුවන කාරණය නම් අභ්‍යන්තර මෙහෙයුම් යාන්ත්‍රණයයි. බාහිර පරිසරයට බලපෑමක් කළ හැකි ආකාරයට භාවිතා කළ හැකි උපාය මාර්ග සංවර්ධනය කිරීම මත ගෝලීය මෙහෙයුම් කාර්යය රාමුවක් සංවර්ධන කිරීම අභ්‍යන්තර මෙහෙයුම් යාන්ත්‍රණය යටතේ දැක්විය හැකිය. අන්‍යාකාරයකින් කිවහොත් ප්‍රධානතම මෙහෙයුම් පියවරයන් සැලසුම් කිරීම සහ සංවර්ධන කිරීම ඉන් ප්‍රමුඛ ස්ථානයක් ගනී. මෙය නියත වශයෙන්ම නවමු වෙනසක් මත පදනම් වූ නව මෙහෙයුම් ආකෘතියකි. මෙම මෙහෙයුම් ආකෘතිය යටතේ බාහිර පරිසරයට බලපෑමක් ඇති කළ හැකිය. යෝජිත මෙහෙයුම් කාර්යරාමුව නිර්මාණය කිරීම යටතේ සිදු වූ මූලික වෙනස්කම් මෙතැන් සිට පිළිබිඹු කෙරේ.

## 9.6 මානව සම්පත් සංවර්ධන සැලසුම්කරණය තුලින් මූලික වෙනසක් ඇති කිරීම




ඉහත සඳහන් ආකෘතීන් දෙක මගින් වර්තමාන මෙහෙයුම් පද්ධතියේ අවම කාර්යක්ෂම මට්ටම සහ උපරිම කාර්යක්ෂම මට්ටම පෙන්නුම් කරයි. මීට පෙර සඳහන් කර ඇති පරිදි ආකෘතිය ක්‍රියාත්මක කෙරෙන ප්‍රතික්‍රියාකාරී පරිසරයන් ඉහතින් සඳහන් කර ඇති මතු අපේක්ෂිත තත්ත්වයන් අත්පත් කර ගැනීම අසම්පූර්ණ වීම හේතුවෙන් ඉහළම කාර්යසාධන මට්ටමට ළඟා වීම දුෂ්කර කර්තව්‍යයක් වී ඇත.


මෙම ක්‍රියාදාමයේ ප්‍රධාන පාර්ශවකරුවන් දෙදෙනා සමඟ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සම්බන්ධ වන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් මූලික වෙනසක් සිදු කිරීම අවශ්‍යය. මෙහි පළමුවන පාර්ශවකරු වශයෙන්, රාජ්‍ය අංශයේ පරිපාලනයත්, දෙවන පාර්ශවකරුවන් වශයෙන් මහජනතාවත් එකිනෙකට රේඛීය ස්වභාවයක් ගැනීම අවශ්‍ය නොවේ. මෙම තත්ත්වයට ළඟා වීම සඳහා නිශ්චිත මට්ටමේ මානව සම්පත් සංවර්ධන පද්ධතීන් සැලසුම්කරණය කිරීම අවශ්‍ය වේ.




රේඛීය චින්තනයේ සිට බහු ආංශික කාර්යය රාමුවක් වෙත පරිවර්තනය වීමේ යෝජිත ක්‍රියාදාමය ඉහත සඳහන් රූප සටහන මගින් නිරූපණය වේ. මහජනතාව විසින් (රාජ්‍ය අංශයේ සේවකයන් විසින් සපයනු ලබන සේවාවන්හි අවසාන ප්‍රතිග්‍රාහකයා) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්යයන් නිශ්චය කිරීමේදී මෙන්ම පුහුණු වැඩසටහන් සඳහා සහභාගීවන්නන්ගේ මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මෙකී ආයතනය සංවිධානයක් වශයෙන් එම කටයුත්තෙහි නිරත විය යුත්තේ කෙසේද යන්න පිළිබඳව තීරණාත්මක කාර්යය භාරයක් ඉටු කරනු ලබයි.


ඉහත රූප සටහනේ පෙන්වා ඇති පරිදි පාර්ශ්වකරුවන් අතර, සම්බන්ධතාව රේඛිය ස්වභාවයක් නොගන්නා අතර, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කෙරෙන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් මහජනතාවට සැලකිය යුතු තරමේ බලපෑමක් ඇති කිරීමට මේ මගින් හැකියාව ලැබේ. සේවා සපයන්නන් (පුහුණුව ලබන්නන්) වෙත පිරිනමනු ලබන පුහුණු වැඩසටහන් වල කාර්යක්ෂමතාව සෘජුව ඇගයීම සඳහා මෙම චින්තන ආකෘතිය මගින් ඉඩකඩ

සැලසේ. එම නිසා අතරමැදි පුහුණුව ලබන්නන් වෙතින් ලැබෙන ප්‍රතිපෝෂණය (ප්‍රතිචාරාත්මක අදහස්) සංවිධානය වෙත විතැන් කිරීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට ඔවුන් මත යැපීම අනවශ්‍යය.




මූලික වෙනස්වීම තුළින් වර්තමානයේ පුරවැසියා හෝ මහජනතාව ප්‍රමුඛ ස්ථානයේලා සලකන අතර, පදනම සහ අවධානය දැනට පාරිභෝගිකයා වෙතින් පුරවැසියා වෙත විතැන් වී ඇත. මීට පෙර ආයතනය විසින් ප්‍රමුඛ ස්ථානයෙහිලා සැලකුවේ පුහුණුව ලබන්නන් වන අතර, නව වෙනස්කම් යටතේ උගැන්විය යුත්තේ කුමක්ද සහ උගැන්විය යුත්තේ කෙසේද යන්න ආයතනය නිශ්චය කරනු ලබන්නේ ප්‍රධාන වශයෙන්ම මහජනතාව වෙතින් ලැබෙන ප්‍රතිචාර පදනම් කර ගනිමිනි.

වඩාත් විශ්වාසදායී බවකින් යුත් පුහුණු විෂයමාලාවක් ලෙස ප්‍රායෝගිකව අදාල කර ගැනීමේ අපේක්ෂාවෙන් මහජනතාව ඉල්ලා සිටිනු ලබන ආකාරයේ දැනුම දක්ෂතා සහ හැකියාවන් පිළිබඳව පුහුණුව ලබන්නන් (පාරිභොගිකයන්) අධ්‍යයනය කරනු ලැබේ. එවිට මහජනතාව සමඟ ගණුදෙනු කිරීමේදී පුහුණුව සඳහා සහභාගීවූවන් තමා ලබාගත් දැනුම මත පදනම්ව කටයුතු කරනු ලබන අතර, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත එමගින් වඩාත් හොඳ ප්‍රතිචාරාත්මක අදහස් ගලා එයි. මෙය නවීන වෙනස්කම් යටතේ ක්‍රියාත්මක කරනු ලබන මූලික මෙහෙයුම් ආකෘතිය වේ. මීට පෙර උපකල්පනය මත පදනම් වූ මහජන අවශ්‍යතා ඇතුළත් රේඛීය ආකෘතියකට අනුකූලව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ක්‍රියාත්මක විය. විධිමත් පර්යේෂණ සහ සංවර්ධන අවශ්‍යතාවයන් පිළිබඳ විශ්ලේෂණයක් සහ පුහුණු අවශ්‍යතා ඇති සංවිධාන සහ මහජනතාව අපේක්ෂා කරනු ලබන ආකාරයේ සේවා ප්‍රමිතීන් යන ද්වි ආකාරව වූ සාධකයන්හි විමර්ශනාත්මක ඇගයීම තුළින් සියලුම මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් නිර්මාණය වනු ඇත.




ඉහත සඳහන් රූප සටහන මගින් චින්තන රටාවේ වෙනස්කම් පිළිබඳ පූර්ණ සංකල්පය විදහා දක්වයි.මෙම මූලික වෙනස්කම් යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

❖ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් රේඛීය පිවිසුමක් ඇති කිරීම වෙනුවට, පුහුණුව ලබන්නන් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ඉගැන්විය යුත්තේ කුමක්ද සහ ඔවුන් වෙත ලබා දිය යුත්තේ කුමක්ද යන්න පිළිබඳව මෙන්ම එම පුහුණු වන්නන් විසින් මහජනතාව වෙත ලබා දිය යුත්තේ කුමක්ද යන්න පිළිබඳව නිශ්චය කිරීමේදී මහජනතාව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

මීට පෙර ක්‍රියාත්මක වූ ආකෘතිය මගින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මූලික වශයෙන් අවධානය යොමු කළේ පුහුණුව සඳහා සහභාගීවන්නන් වෙත පමණක් වන අතර, රජයේ නිලධාරීන් විසින් විදහා දැක්විය යුතු සහ මහජනතාව විසින් අපේක්ෂා කරනු ලබන ආකාරයේ හැකියාවන් දක්ෂතාවයන් සහ නිපුණතාවයන් සම්බන්ධයෙන් අවම මට්ටමේ අවධානයක් යොමු කරන ලදි.


පුරවැසි කේන්ද්‍රීය නව ආකෘතිය යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට තම අවසන් සේවා ප්‍රතිලාභීයා වන මහජනතාවගේ ප්‍රතිපෝෂණ සහ ප්‍රතිචාරයන් මත තම මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යාමට අවස්ථාව උදා වනු ඇත. මහජනතාවට වඩාත් හොඳ මට්ටමේ සේවාවන් සැපයීම සඳහා පුහුණුව ලබන්නන් විසින් ඉගෙන ගත යුත්තේ කුමක්ද යන්න සම්බන්ධයෙන් සැලකිය යුතු මට්ටමේ බලපෑමක් ඇති කිරීම මෙන්ම මහජන සම්බන්ධතා පැවැත්වීමේදී පුහුණු වන්නන් විසින් තමන් ලබා ගත් නිපුණතාවන් නිවරදි ලෙස යොදා ගැනීම සම්බන්ධයෙන් වගකීම දැරීමට මෙම නව ආකෘතිය මගින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට හැකි වනු ඇත. මීට පෙර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුහුණුව ලබන්නන් මෙම වගකීම පූර්ණ වශයෙන් දරන ලදී.

මහජනතාවට වඩාත් හොඳ සේවාවක් ලබාගැනීම උදෙසා රාජ්‍ය අංශයේ නිලධාරීන්ට අවශ්‍ය වන ආකාරයේ පුහුණුවක් ලබා දීම සඳහාත් ඒ සඳහා රාජ්‍ය අංශයේ නිලධාරීන් මත ප්‍රමාණවත් ආකාරයේ බලපෑමක් ඇති කිරීමේ අපේක්ෂාවෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මත බලපෑමක් ඇති කිරීම සඳහාත් මෙම ත්‍රිපාර්ශවීය ආකෘතිය මගින් ඉඩකඩ සැලසේ. එසේම එකී නිලධාරීන්ට අවශ්‍ය දක්ෂතාවයන් හා නිපුණතාවයන් ලබා දීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත බලපෑමක් ඇති කිරීම සඳහා මහජනතාවට මේ මගින් ඉඩකඩ සැලසෙන අතර, මහජනතාව සෑහීමකට පත් වන ආකාරයේ දැනුම, හැකියාවන් හා නිපුණතාවන් ලබා ගැනීම සඳහාත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත බලපෑමක් ඇති කිරීම සඳහා පුහුණු සඳහා සහභාගීවන්නන් වෙතද ඉඩකඩ සැලසේ.

මෙම ත්‍රිපාර්ශවීය ආකෘතිය, අවසන් පාරිභෝගික අවශ්‍යතාවයන් ඉටු කිරීම සම්බන්ධයෙන් පමණක් මුලුමනින්ම අවධානය යොමු කොට නොමැති බව විශේෂයෙන් කිවයුතු කරුණක් නොවේ. මේ මගින් පමණක් කරනු ලබන්නේ පුරවැසියා යන සංකල්පය විධිමත් සැලකිල්ලක් යොමු කළ යුතු උපායමාර්ගික මූලිකාංගයක් බවට පත්වී ඇති බවයි. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ලබා දිය යුතු මානව සම්පත් සංවර්ධන උපායමාර්ග මෙහෙයවීම සම්බන්ධව තීරණ ගැනීමේදී රජය සහ රාජ්‍ය අංශයේ නායකත්වය වැනි අනෙකුත් සාධක සහ පාර්ශවකරුවන් සමාන වැදගත්කමක් අත්පත් කර ගනී. මෙම නව ආකෘතියේ අභිප්‍රාය සරල මෙන්ම පැහැදිලි මුහුණුවරක් ගනී.

එම නිසා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් මෙහෙයවනු ලබන මානව සම්පත් සංවර්ධන පුහුණු පාඨමාලාවන්හි අවසන් ප්‍රතිඵලය ප්‍රධාන අරමුණු දෙකක් හා බද්ධ වේ. ඉන් පළමුවන කරුණ නම් රටේ ප්‍රගතිගාමී ආර්ථික සංවර්ධනයට දායකත්වය සැපයීම වන අතර, දෙවන කරුණ නම් මහජනතාවට වැඩිම වාසියක් අත්පත් කර දෙන පුරවැසි කේන්ද්‍රීය පාරිභෝගික සේවාවක් නිර්මාණය කිරීමයි.

## 9.7 නව මෙහෙයුම ආකෘතිය සහ අවශ්‍යතා නිර්මාණය කිරීම





- ඉහතින් සඳහන් කර ඇති පද්ධතිය සියලුම පාර්ශවකරුවන් එකම රැහැනකින් බැඳී සිටින සමීප චක්‍රීය පද්ධතියකි. ගුණාත්මක සේවාවක් ලබා දෙන ලෙස රාජ්‍ය අංශයේ නිලධාරීන් මත බලපෑමක් ඇති කිරීමටත් ඒ පිළිබඳ අධ්‍යයන පහසුකම් ලබා දෙන ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මත බලපෑමක් ඇති කිරීමටත් මහජනතාවට හැකි විය යුතුය.

- මෙම බලපෑම හේතුවෙන් මහජනතාවගේ අවශ්‍යතාවයන්ට සමගාමීව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පුහුණුව සඳහා සහභාගී වන්නන් වෙත අධ්‍යාපනය ලබා දීම සහ සංවර්ධනය කිරීම කළ යුතු වන අතර නිසි වේලාවට වඩාත් නිවරදි කාර්යරාමුවක් මත පුහණුව සඳහා සහභාගීවන්නන්ගේ දැනුම, කුසලතා, හැකියාවන් වර්ධනය කර ගැනීම සඳහා දායකත්වය ලබා දිය හැකි බවට තහවුරු විය යුතුය. එලෙසම පුහුණුව සඳහා සහභාගීවන්නන් මත මහජනතාව විසින් ඇතිකරනු ලබන බලපෑම හේතුවෙන් අදාල දැනුම හැකියාවන් සහ නිපුණතාවයන් ලබා ගැනීම සඳහා අධ්‍යයනය කිරීමට ඔවුන්ට අවශ්‍ය වේ.

මෙම ත්‍රිපාර්ශවීය සමීප චක්‍රීය පද්ධතිය හේතුවෙන් වඩාත් හොඳ සේවාවක් ලබා දීමට අවශ්‍යතාවයක් ඇති වීමත් වඩාත් හොඳ හැකියාවන් නිර්මාණය වීමත් වඩාත් නිර්මාණශීලී ලෙස අධ්‍යයනය කිරීමත් සහ තමා හදාරනු ලැබ ඇති දෙය විශිෂ්ඨ අන්දමින් ප්‍රායෝගිකව යොදා ගැනීමත් සිදු වනු ඇත. මෙම මූලික කාර්යය රාමුවේ අන්තර් සම්බන්ධතාවය මත නව මෙහෙයුම් ආකෘතිය ක්‍රියාත්මක කළ හැකි වන පරිදි ඒකාබද්ධ උපාය මාර්ග සම්පාදනය කළ හැකි වනු ඇත.

## 9.8 නව ආකෘතිය මත පදනම් වූ ඒකාබද්ධ උපායමාර්ග සකස් කිරීම

ඉදිරිපත් කර ඇති ආකෘතිය වඩාත් හොඳින් සැලසුම් කොට තිබුණද, එය ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ උපාය මාර්ග අවශ්‍ය වනු ඇත.




ඉහත සඳහන් රූප සටහනේ පෙන්වා ඇති පරිදි, ඒකාබද්ධ උපායමාර්ගික කාර්ය රාමුව උපාය මාර්ගික මූලිකාංග 06කින් සමන්විත වේ. ඒකාබද්ධ උපායමාර්ගික කළමනාකරණ ක්‍රියාවලියක් සඳහා ඉඩකඩ සලසමින් සෑම මූලිකාංගයක්ම එකිනෙක හා සම්බන්ධ වේ. මෙම රූපසටහන් මගින් උපායමාර්ගික මූලිකාංගයන් ගෙන හැර දැක්වීම පමණක් සිදු කළද සෑම මූලිකාංගයක්ම ව්‍යාප්ත වූ කරුණු සම්භාරයකින් හා විවිධාකාර වූ උපායමාර්ගික සංරචකයන්ගෙන් සමන්විත වන බව අවබෝධ කරගැනීම වැදගත්ය. මෙම උපායමාර්ගය මගින් උපායමාර්ගික සංරචක ඕනෑම සංඛ්‍යාවකට සහ විවිධ මූලිකාංග යටතේ පද්ධතිය වෙත ඒකාබද්ධ කිරීමට නියමිත මූලික පියවරයන් සඳහා අනුබල සපයයි. එනම් ඕනෑම උපායමාර්ගික පියවරක් ඉහත සඳහන් ඒකාබද්ධ කාර්යරාමුව වෙත සුමට ලෙස ඒකාබද්ධ කළ හැකිය. රූප සටහනෙහි පෙන්වා දී ඇති ආකෘතිය විනිවිදභාවයකින් හා වගකීමකින් යුත් කල්පවත්නා ආකෘතියක් බවට සහතික විය හැකි අතර, මෙම නිශ්චිත මූලිකාංග හය තුළට විවිධාකාර වූ උපාය මාර්ගික සංරචකයන් අන්තර්ගත කිරීම සඳහා මෙම ආකෘතිය නම්‍යශීලී බවද පිළිගෙන ඇත.

# කාර්ය සමාලෝචනය


# 10. කාර්ය සමාලෝචනය

## 10.1 - රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන කේන්ද්‍රය

රාජ්‍ය අංශයේ කළමනාකරණ මට්ටමේ නිලධාරීන්ගේ දැනුම හා කුසලතා යාවත්කාලීන කිරීම සඳහා රාජ්‍ය පරිපාලන හා පළාත් පාලනය සම්බන්ධ නව න්‍යායන් හා පරිචයන් ගැන පුහුණු වැඩසටහන් සැලසුම් කොට පැවැත්වීම පිණිස රාජ්‍ය පරිපාලනය හා පළාත් පාලන කේන්ද්‍රය පිහිටුවා ඇත. සාමාලෝචිත කාල පරිච්ඡේදය තුළ කේන්ද්‍රය මඟින් සැලසුම් කරන ලද වැඩසටහන් 04ක් පවත්වන ලද අතර, මුළු සහභාගීත්ව දින ගණන 470ක් පමණ වේ. එම වැඩසටහන් පිළිබඳ විස්තර පහත සඳහන් කර ඇත.

| අනු අංකය | පාඨමාලාව | 2011 | | | | |
|---|---|---|---|---|---|---|
| | | කාලපරිච්ඡේදය | ඉලක්කය | 1<br>පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | 2<br>සහභාගීවූවන් සංඛ්‍යාව | 3<br>සහභාගීත්ව දින ගණන |
| 1 | ඉඩම් කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 10 | 1 | 1 | 30 | 300 |
| 2 | යහ පාලනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 10 | 2 | 1 | 17 | 170 |
| | එකතුව | 20 | 3 | 2 | 47 | 470 |








## 10.2 - පාරිසරික හා සංවර්ධන අධ්‍යයන කේන්ද්‍රය

මෙම කේන්ද්‍රයේ අරමුණ වන්නේ පාරිසරික හා සංවර්ධනය පිළිබඳ විවිධ ක්ෂේත්‍රයන්හි නිරත වන්නන්ගේ ශක්‍යතාව වර්ධනය කිරීමයි. මෙම වසරේදී සැලසුම් කළ පරිදි එක් වැඩසටහනක් පවත්වන ලද අතර, මුළු සහභාගීත්ව දින ගණන 100කි. පවත්වන ලද වැඩසටහන් වල තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | පාඨමාලා ශීර්ෂය | 2011 | | | | |
|---|---|---|---|---|---|---|
| | | කාලපරිච්ඡේදය | ඉලක්කය | 1<br>පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | 2<br>සහභාගීවූවන් සංඛ්‍යාව | 3<br>සහභාගීත්ව දින ගණන |
| 1 | ආපදා කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 10 | 1 | 1 | 10 | 100 |
| | එකතුව | | 1 | 1 | 10 | 100 |








## 10.3 - මූල්‍ය කළමනාකරණ කේන්ද්‍රය

වෙනස් වන පරිසරය තුළ පවතින මූල්‍ය කළමනාකරණ අභියෝගවලට මුහුණදීමට අවශ්‍ය දැනුම හා කුසලතා මූල්‍ය කළමනාකරණ කේන්ද්‍රය මගින් සහභාගිවන්නන් වෙත ලබා දෙයි. මෙම වර්ෂය තුළ පුහුණු වැඩසටහන් නවයක් සැලසුම් කොට පවත්වන ලදී. මුළු සහභාගීත්ව දින ගණන 3648 කි. පවත්වන ලද වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අනු අංකය | පාඨමාලා ශීර්ෂය | 2011 | | | | |
|---|---|---|---|---|---|---|
| | | කාල පරිච්ඡේදය | ඉලක්කය | 1<br>පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | 2<br>සහභාගීවූවන් සංඛ්‍යාව | 3<br>සහභාගීත්ව දින ගණන |
| 1 | රාජ්‍ය ප්‍රසම්පාදනය සහ ගිවිසුම් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (DIPPCA) - 2011 / 2012 | 96 දින | - | 1 | 30 | 2880 |
| 2 | ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 10 | 5 | 1 | 20 | 200 |
| 3 | මූල්‍ය නොවන කළමනාකරුවන් සඳහා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 10 | 2 | 1 | 10 | 100 |
| 4 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ වැඩමුළුව | 3 | 2 | 1 | 17 | 51 |
| 5 | රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රම පිළිබඳ වැඩමුළුව | 3 | 6 | 5 | 139 | 417 |
| | එකතුව | | | 9 | 216 | 3648 |







## 10.4 - කළමනාකරණ අධ්‍යයන කේන්ද්‍රය

කළමනාකරණ අධ්‍යයන කේන්ද්‍රය ඉගෙනුම් අවස්ථා සපයමින් ඊට සහභාගීවන්නන්ට වෘත්තිමය කළමණාකරුවන් ලෙස අතිශය තරඟකාරී පරිසරයක් තුළ ඔවුන්ගේ ආයතන මෙහෙයවීමේදී ක්‍රියාකාරී කාර්යය භාරයක් ඉටුකිරීමට අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම සිදු කරයි. සමාලෝචිත වර්ෂය තුළදී සැලසුම්ගත වැඩසටහන් දෙකක් පවත්වන ලද අතර, මුළු සහභාගීත්ව දින ගණන 145කි පවත්වන ලද වැඩසටහන් වල විස්තර පහතින් දැක්වේ.

| අනු අංකය | පාඨමාලා ශීර්ෂය | 2011 | | | | |
|---|---|---|---|---|---|---|
| | | කාල සීමාව | ඉලක්කය | 1 පැවැත්වූ පාඨමාලා ගණන | 2 සහභාගී වූ සංඛ්‍යාව | 3 සහභාගීත්ව දින ගණන |
| 1 | කළමනාකරණ හැකියාවන් පිළිබඳ සහතික පත්‍ර පඨමාලාව | 10 | 2 | 1 | 10 | 100 |
| 2 | කාර්යසාධන ඇගයීම් ක්‍රම පිළිබඳ වැඩමුළුව | 3 | 2 | 1 | 15 | 45 |
| | එකතුව | | 4 | 2 | 25 | 145 |








## 10.5 - මානව සම්පත් සංවර්ධන කේන්ද්‍රය

මානව සම්පත් සංවර්ධන කේන්ද්‍රයේ අරමුණ වන්නේ කළමනාකරුවන්ට ඔවුන්ගේ මානව සම්පත් කළමණාකරණය කිරීම සඳහා අවශ්‍ය නිර්මාණශීලිත්වය හා නවෝත්පාදනය වර්ධනය කිරීමයි. වර්ෂය තුළ සැළසුම් සහගත වැඩසටහන් තුනක් පවත්වන ලද අතර මුළු සහභාගීත්වය දින ගණන 395කි. පවත්වන ලද වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අනු අංකය | පාඨමාලා ශීර්ෂය | 2011 | | | | |
|---|---|---|---|---|---|---|
| | | කාල සීමාව | ඉලක්කය | 1 පැවැත්වූ පාඨමාලා ගණන | 2 සහභාගී වූ සංඛ්‍යාව | 3 සහභාගීත්ව දින ගණණ |
| 1 | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 10 | 3 | 2 | 27 | 270 |
| 2 | විනය ක්‍රියාමාර්ග පිළිබඳ වැඩමුළු | 5 | 3 | 1 | 25 | 125 |
| එකතුව | | | 6 | 3 | 52 | 395 |








## 10.6 - ඵලදායිතා හා තත්ත්ව කළමනාකරණ කේන්ද්‍රය

රාජ්‍ය අංශයේ සංවිධාන තුළ ඵලදායිතාව හා ගුණාත්මකභාවයෙන් පිරිපුන් සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මෙම කේන්ද්‍රය පිහිටුවන ලදී වර්ෂය තුළ එක් සැලසුම්ගත වැඩසටහනක් පවත්වන ලද අතර සම්පූර්ණ සහභාගීත්ව දින ගණන 2880 ක් පමණ වේ. වසර තුළ පැවැත්වූ වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අනු අංකය | පාඨමාලා ශීර්ෂය | 2011 | | | | |
|---|---|---|---|---|---|---|
| | | කාල පරිච්ඡේදය | ඉලක්කය | 1<br>පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | 2<br>සහභාගීවූවන් සංඛ්‍යාව | 3<br>සහභාගීත්ව දින ගණන |
| 1 | කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව | 96 දින | - | 1 | 30 | 2880 |
| | එකතුව | | | 1 | 30 | 2880 |



## 10.7 - තොරතුරු තාක්ෂණ කේන්ද්‍රය

මෙම කේන්ද්‍රයේ අරමුණ වන්නේ රාජ්‍ය අංශයේ සංවිධානවලට ඔවුන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ හැකියාවන් පුහුණු හා උපදේශන සේවා මගින් වැඩිදියුණු කරගැනීම සඳහා උපකාර වීමයි. කේන්ද්‍රය මගින් පවත්වන ලද සියලුම පුහුණු වැඩසටහන් සහ ලබා දෙන ලද සියලුම උපදේශන සේවා මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා ඉලක්කගත කොට ඇත.

කේන්ද්‍රය මගින් පවත්වන ලද විශේෂ වැඩසටහන් අතරින් එකක් වන තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව අත්‍යාවශ්‍ය තොරතුරු තාක්ෂණ කුසලතාව ඉහළ නැංවීම සඳහාම පවත්වන ලද්දකි. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන (Computer Driving Licienses) '' e-government'' වැඩමුළුව, විවෘත මූලාශ්‍ර යෙදුම් (Open Source Applications) පිළිබඳ සහතිකය ආදිය කේන්ද්‍රය මගින් මෙහෙයවන අනෙකුත් වැඩසටහන් අතර වේ. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පරිගණක ක්‍රියාකරවීමේ බලපත්‍රය සහ තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ප්‍රාදේශීය මධ්‍යස්ථානයන් හිදී ද පැවැත්වේ.

මෙම වර්ෂය තුළ කේන්ද්‍රය මගින් පහත සඳහන් පාඨමාලා පවත්වන ලදී.

- සැලසුම්ගත සේවාරම්භක පුහුණු පාඨමාලා 19 (වගුව 1 හි තොරතුරු දක්වා ඇත.)
- උපදේශන පුහුණු වැඩසටහන් 16 (වගුව 2 හි තොරතුරු දක්වා ඇත.)
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථාන මගින් පවත්වන ලද Computer Driving Licenses සහ තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව සඳහා විභාග 10 (වගුවෙ 3 හි තොරතුරු දක්වා ඇත.)

මෙහිදී සඳහන් කළ යුතු තවත් වැදගත් කරුණක් වන්නේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අභ්‍යන්තර කාර්යය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ කුසලතා සංවර්ධනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ කේන්ද්‍රය මගින් විශේෂ පුහුණු වැඩසටහන් 3ක් පැවැත්වීමයි. මීට අමතරව යෙදවුම් හතක් සහිත තොරතුරු කළමනාකරණ තොරතුරු පද්ධතියක් ද සංවර්ධනය කොට ඇති අතර, ඉන් කිහිපයක් 2010 වර්ෂයේ ආරම්භ කළද ක්‍රියාත්මක කිරීම මේ වසරේ සිට සිදු කොට ඇත. (වගුව 04හි තොරතුරු දක්වා ඇත.)

ඉහත සඳහන් පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අන්තර්ජාල සබඳතා වල වේගය තත්පරයට කිලෝබයිට් 512 සිට තත්පරයට මෙගා බයිට් 4 දක්වා ඉහළ නංවමින් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් තවදුරටත් වැඩිදියුණු කොට ඇත. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පරිඝනක ජාලය ෆයිබර් රැහැන් කිහිපයක්ද යොදා තවදුරටත් වැඩිදියුණු කොට ඇත.

මෙම වර්ෂය තුළදී තොරතුරු තාක්ෂණ කේන්ද්‍රය මගින් අදාල සේවා අපේක්ෂිත ආයතනයන් හි තොරතුරු පද්ධති සංවර්ධනය කිරීම සඳහා කළමනාකරණ උපදේශන පැවරුම් 05 ක් භාරගෙන ඇත. මින් පැවරුම් 03 ක් සම්පූර්ණ කොට ඇති අතර ලබන වර්ෂයේදී අවසන් කිරීමට නියමිතය. මේ පිළිබඳ තොරතුරු 05 වගුවෙහි දක්වා ඇත.

| අංකය | වැඩසටහන | දින ගණන | ඉලක්ක ගත වැඩසටහන් සංඛ්‍යාව | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වන්නන් සංඛ්‍යාව | සහභාගීත්ව දින ගණන |
|---|---|---|---|---|---|---|
| 1 | ශ්‍රීලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ තොරතුරු පද්ධතිය විදහා දැක්වීම | 0.5 | 1 | 1 | 18 | 9 |
| 2 | හැකියාවන් වර්ධනය කිරීමේ වැඩසටහන කණ්ඩායම් 11 | 2 | 4 | 4 | 149 | 298 |
| 3 | විවෘත මූලාශ්‍ර පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 10 | 1 | 1 | 32 | 320 |
| 4 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ Computer Driving License පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව- 27 වන කණ්ඩායම | 10 | 3 | 3 | 51 | 510 |
| 5 | තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව. | 25 | 1 | 1 | 32 | 800 |
| 6 | තොරතුරු තාක්ෂණය පදනම් වූ ව්‍යාපාරික ලිපි ලිවීම. | 5 | 1 | 1 | 15 | 75 |
| 7 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අනධ්‍යන කාර්යය මණ්ඩලය සඳහා Power Point පුහුණුව | 1 | 2 | 2 | 61 | 61 |
| 8 | තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී.ල.ප.සේ විවෘත කණ්ඩායම් මොඩියුලය | 5 | 3 | 3 | 110 | 550 |
| 9 | තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී.ල.ප.සේ විවෘත කණ්ඩායම් මොඩියුලය | 9 | 1 | 1 | 37 | 333 |
| 10 | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා තැපැල් කළමනාකරණ ක්‍රම පිළිබඳ විශේෂ පුහුණුව | 0.5 | 1 | 1 | 5 | 2.5 |
| 11 | E- රාජ්‍ය වැඩසටහන් පිළිබඳ වැඩමුළුව | 5 | 1 | 1 | 11 | 55 |
| | | | | | | |
| | | 73 | 19 | 19 | 521 | 3013.5 |

වගුව 01 :- පුහුණු වැඩ සටහන් උප ලේඛණය

| අංකය | වැඩසටහන | දින ගණන | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වන්නන් සංඛ්‍යාව | සහභාගීත්ව දින ගණන |
|---|---|---|---|---|---|
| 1 | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව (සති අන්ත) | 8 | 1 | 56 | 448 |
| 2 | මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා SQL Server 2000 සම්බන්ධයෙන් උසස් පුහුණුව | 5 | 1 | 17 | 85 |
| 3 | මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පරිඝනක පුහුණුව | 5 | 2 | 40 | 200 |
| 4 | කාර්යාල කළමනාකරණය පිළිබඳ පුහුණුව | 6 | 1 | 30 | 180 |
| 5 | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහකාර නීති කෙටුම්පත් සම්පාදක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව | 1 | 1 | 17 | 17 |
| | ග්‍රාම නිලධාරීන් කණ්ඩායම් සඳහා පරිඝනක පුහුණුව | 2 | 4 | 140 | 280 |
| 7 | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව (සතියේ දින) | 8 | 1 | 47 | 376 |
| 8 | විද්‍යාපති (වෛද්‍ය පරිපාලනය) 2011 | 0.5 | 1 | 15 | 7.5 |
| 9 | ජාතික ඖෂධ තත්ත්ව සහතික පරීක්ෂණාගාරයේ නිලධාරීන් සඳහා පරිඝනක ජාල කටයුතු ආශ්‍රිත පුහුණුව | 2 | 1 | 40 | 80 |
| 10 | සෞඛ්‍ය ආමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා භාෂා සහ ඉදිරිපත් කිරීමේ හැකියාවන් සංවර්ධනය කිරීමේ වැඩසටහන | 2 | 1 | 40 | 80 |
| 11 | වාහන කළමනාකරණ ක්‍රම පිළිබඳ පුහුණුව | 1 | 2 | 62 | 62 |
| | | | | | |
| | එකතුව | 41 | 16 | 504 | 1815.5 |

වගුව 02 :- පුහුණු උපදේශන

| අංකය | ප්‍රාදේශීය දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය | විභාග සංඛ්‍යාව | අයදුම්කරුවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | කුරුණෑගල | 6 | 46 |
| 2 | ගාල්ල | 18 | 181 |
| 3 | බදුල්ල | 3 | 33 |
| 4 | හම්බන්තොට | 1 | 24 |
| | එකතුව | 28 | 284 |

වගුව 03 - දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථාන වල පවත්වනු ලබන විභාග

| අංකය | අංශ | මෘදුකාංග පද්ධති සංවර්ධනය |
|---|---|---|
| 1 | පරිපාලන - පිළිගැනීමේ අංශය | පිළිගැනීමේ අංශය (අවසන් කොට ඇත) |
| 2 | පරිපාලන - නේවාසිකාගාරය | නේවාසිකාගාර කාමර වෙන්කරවා ගැනීමේ පද්ධතිය (අවසන් කොට ඇත) |
| 3 | පරිපාලන - ප්‍රවාහන | වාහන කළමනාකරණ පද්ධතිය (අවසන් කොට ඇත) |
| 4 | පරිපාලන - මානව සම්පත් | මානව සම්පත් කළමනාකරණ පද්ධතිය (අවසන් කොට ඇත) |
| 5 | පුස්තකාලය | පුස්තකාල කළමනාකරණ පද්ධතිය(ආරම්භ කොට ඇත) |
| 6 | වැඩසටහන් | පාඨමාලා කළමනාකරණපද්ධතිය වැඩිදියුණු කිරීම |
| 7 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ තොරතුරු පද්ධතිය |

වගුව 04- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පද්ධති වැඩිදියුණු කිරීම


| අංකය | ආයතනය | උපදේශන විෂය ක්ෂේත්‍රය |
|---|---|---|
| 1 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | කාන්තා තොරතුරු පද්ධතිය(අවසන් කොට ඇත) |
| 2 | රජයේ සියලුම අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු (නිදහස් සංවර්ධනය) | වාහන කළමනාකරණ පද්ධතිය (අවසන් කොට ඇත) |
| 3 | රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | අමාත්‍යාංශයීය වෙබ් අඩවිය(අවසන් කොට ඇත) |
| 4 | ජාතික මැණික් හා ස්වර්නාභරණ අධිකාරිය | මැණික් පතල් හැරීමේ බලපත්‍ර ක්‍රමය (ආරම්භ කොට ඇත) |
| 5 | ජාතික මැණික් හා ස්වර්නාභරණ අධිකාරිය | මැණික් ගනුදෙනු පිළිබඳ බලපත්‍ර ක්‍රමය (ආරම්භ කොට ඇත.) |


වගුව 05- කළමනාකරණ උපදේශණ

# 10.8 - භාෂා අධ්‍යයන කේන්ද්‍රය

රාජ්‍ය අංශයේ සංවිධානවල නිලධාරීන්ගේ භාෂා අවශ්‍යතා සපුරාලීම පිණිස භාෂා අධ්‍යයන කේන්ද්‍රය ස්ථාපනය කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ සැලසුම්ගත වැඩසටහන් නවයක් පවත්වන ලදී. මුළු සහභාගීත්ව දින ගණන 8670කි. පවත්වන ලද වැඩසටහන්වල විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | පාඨමාලා ශීර්ෂය | 2011 | | | | |
|---|---|---|---|---|---|---|
| | | කාල පරිච්ඡේදය | ඉලක්කය | 1 පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | 2 සහභාගිවූවන් සංඛ්‍යාව | 3 සහභාගීත්ව දින ගණන |
| 1 | සංවාදාත්මක දෙමළ භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 4 මාස ( 2 දින ) | 1 | 1 | 55 | 1760 |
| 2 | පොදු සංවාදාත්මක නිපුණතා | 10 | 1 | 1 | 11 | 110 |
| 3 | වාර්තාකරණ හැකියාවන් | 5 | 3 | 2 | 68 | 340 |
| 4 | උසස් වාර්තාකරණ හැකියාවන් | 5 | 1 | 1 | 12 | 60 |
| 5 | වෘත්තිකයන් සඳහා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව (DEP).කණ්ඩායම් 61,62,63 සහ 64 | 40 දින | - | 4 | 160 | 6400 |
| | එකතුව | | | 9 | 306 | 8670 |








## 10.9 - ව්‍යාපෘති කළමනාකරණ කේන්ද්‍රය

වර්ෂය තුළ එක් වැඩසටහනක් පවත්වන ලද අතර සම්පූර්ණ සහභාගීත්ව දින ගණන 90කි. පවත්වන ලද වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අනු අංකය | පාඨමාලා ශීර්ෂය | 2011 | | | | |
|---|---|---|---|---|---|---|
| | | කාල පරිච්ඡේදය | ඉලක්කය | 1<br>පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | 2<br>සහභාගීවූවන් සංඛ්‍යාව | 3<br>සහභාගීත්ව දින ගණන |
| 1 | අරමුණු අනුගත ව්‍යාපෘති සැලසුම්කරණය | 5 | 1 | 1 | 18 | 90 |
| එකතුව | | | 1 | 1 | 18 | 90 |








## 10.10 - පර්යේෂණ , ප්‍රකාශන සහ ප්‍රතිපත්ති අධ්‍යයන කේන්ද්‍රය

මෙම කේන්ද්‍රයේ කාර්යභාරය දෙයාකර වේ. එනම් පර්යේෂණ හා උපදේශණ සහ තොරතුරු හා ප්‍රකාශන වේ. මේ සඳහා අවශ්‍ය සම්පත් අභ්‍යන්තරයෙන් ජනනය කරගනු ලබන අතර බාහිරව හෝ ඒකාබද්ධව අනුග්‍රහය දක්වනු ලබයි. මේවා ස්වභාවයෙන් බහුවිධ විෂය ක්ෂේත්‍රයන් ආශ්‍රයෙන් කෙරෙන සමාජ විද්‍යා පර්යේෂණ වන අතර, සහභාගිත්වය,කණ්ඩායම් වැඩ හා හවුල්කාරීත්වය ආදී ක්‍රම මගින් මෙහෙයවනු ලබයි.

| අනු අංකය | පාඨමාලා ශීර්ෂය | 2011 | | | | |
|---|---|---|---|---|---|---|
| | | කාල පරිච්ඡේදය | ඉලක්කය | 1<br>පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | 2<br>සහභාගීවූවන් සංඛ්‍යාව | 3<br>සහභාගීත්ව දින ගණන |
| 1 | පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ වැඩමුළුව | 5 | 1 | 1 | 10 | 50 |
| 2 | නිර්මාණාත්මක චින්තනය පිළිබඳ වැඩමුළුව | 2 | 2 | 2 | 37 | 74 |
| | **එකතුව** | | **3** | **3** | **47** | **124** |



## 10.11 - විශේෂ වැඩසටහන්

සැලසුම්ගත වැඩසටහන් වලට අමතරව සාමාලෝචිත වර්ෂය තුලදී පහත සඳහන් විශේෂ වැඩසටහන් පවත්වන ලදී.

| අනු අංකය | පාඨමාලා ශීර්ෂය | 2011 | | | |
|---|---|---|---|---|---|
| | | කාල පරිච්ඡේදය | 1<br>පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | 2<br>සහභාගීවූවන් සංඛ්‍යාව | 3<br>සහභාගීත්ව දින ගණන |
| 1 | පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | 5 Days | 11 | 261 | 1305 |
| 2 | ජ්‍යෙෂ්ඨ පුහුණුකරුවන් සඳහා පුහුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ උසස් පාඨමාලාව (CSC- සිංගප්පූරුව) | 10 | 1 | 25 | 250 |

# 10.12 - හැකියාවන් වර්ධනය කිරීමේ වැඩසටහන්

කාල පරිච්ඡේදය තුලදී පහත සඳහන් ධාරිතා වර්ධනය කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

| අනු අංකය | මධ්‍ය වෘත්තික පුහුණුව | මොඩියුල සංඛ්‍යාව | කාල පරිච්ඡේදය | සහභාගීවූවන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **1** | **I පන්තිය** | | | |
| 1.1 | කණ්ඩායම I | මොඩියුල 8 | දින 24 | 30 |
| 1.2 | කණ්ඩායම I I | මොඩියුල 8 | දින 24 | 26 |
| 1.3 | කණ්ඩායම I I I | මොඩියුල 7 | දින 24 | 48 |
| 1.4 | කණ්ඩායම I V | මොඩියුල 7 | දින 21 | 38 |
| **2** | **I I I පන්තිය** | | | |
| 2.1 | කණ්ඩායම V-2 වන අදියර | මොඩියුල 3 | 14 | 40 |
| 2.2 | කණ්ඩායම VI-1 වන අදියර | මොඩියුල 3 | 18 | 37 |
| | කණ්ඩායම VI –2 වන අදියර | මොඩියුල 4 | 20 | 37 |
| 2.3 | කණ්ඩායම VII | මොඩියුල 7 | 38 | 30 |
| 2.4 | කණ්ඩායම VIII | මොඩියුල 7 | 38 | 30 |
| 2.5 | කණ්ඩායම I X | මොඩියුල 8 | 30 | 35 |
| 2.6 | කණ්ඩායම X | | 30 | 44 |
| 2.7 | කණ්ඩායම XI | | 30 | 38 |

## 10.13 - බාහිර විභාග

මීට පෙර විභාග දෙපාර්තමේන්තුව විසින් පැවැත්වූ ශ්‍රී ලංකා පරිපාලන සේවය, විද්‍යාත්මක සේවය, ඉංජිනේරු සේවය ආදියේ කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමේ වගකීම රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට පවරා ඇත.

මීට අමතරව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, රජයේ අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු හා රාජ්‍ය අංශයේ අනෙකුත් සංවිධාන වෙනුවෙන් බඳවාගැනීම,උසස් කිරීම් හා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සිදු කරයි. මෙම විභාග පැවැත්වීම අදාළ ආයතනවල ඉල්ලීම මත සිදු කරනු ලැබේ.
මෙම කාලසීමාව ඇතුළත බාහිර විභාග 84ක් පවත්වා ඇත.

## 10.14 - පුහුණු උපදේශන සේවා

සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් අදාල ආයතන වල ඉල්ලීම් මත විශේෂිත පුහුණු වැඩසටහන් 32ක් සැලසුම් කොට පවත්වන ලදී.

| අනු අංකය | පුහුණු සේවාලාභී ආයතනය | පුහුණු උපදේශන වැඩසටහන | කාල පරිච්ඡේදය | සහභාගී වූ සංඛ්‍යාව | සහභාගීත්ව දින ගණන |
|---|---|---|---|---|---|
| 1 | ලංකා හොස්පිටල්ස් | කළමනාකරණ පුහුණු වැඩසටහන | 5 | 30 | 150 |
| 2 | සෞඛ්‍ය ආරක්ෂන හා පෝෂණ අමාත්‍යාංශය | කළමනාකරණය සහ යහපාලනය පිලිබඳ පුහුණු වැඩසටහන | 3 | 12 | 36 |
| 3 | ලෝක සෞඛ්‍ය සංවිධානය | පරිපාලන හා මූල්‍ය පුහුණුව | 5 | 9 | 45 |
| 4 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | ධනාත්මක චින්තනය | 10 | 80 | 800 |
| 5 | පශ්චාත් උපාධි ආයතනය කොළඹ විශ්ව විද්‍යාලය | වෛද්‍ය පරිපාලන කටයුතු පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව | 30 | 20 | 600 |
| 6 | අධ්‍යාපන අමාත්‍යාංශය | කළමනාකරණ පුහුණු පාඨමාලාව | 2 | 36 | 72 |
| 7 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | සමෘද්ධි නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන | 10 | 40 | 400 |
| 8 | විදේශ කටයුතු අමාත්‍යාංශය | පකිස්ථාන දූත මණ්ඩලයක් පැමිණීම | 4 | 11 | 44 |
| 9 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පේරාදෙණිය | කළමනාකරණ පුහුණු වැඩසටහන | 40 | 237 | 9480 |
| 10 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | ශ්‍රී ලංකාව සඳහා මානව සම්පත් උපායමාර්ගික ප්‍රතිපත්ති කාර්ය රාමුවක් සංවර්ධනය කිරීම | 1 | 30 | 30 |
| 11 | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව කුරුණෑගල | මූලික විමර්ශණ | 5 | 19 | 95 |
| 12 | යෞවන කටයුතු අමාත්‍යාංශය | රැකියා විස්තර පිළිබඳ වැඩමුළුව | 1 | 20 | 20 |
| 13 | සිවිල් සේවා කොමිසම මාලදිවයින | රැකියා පළාත් පාලන ඵලදායි ක්‍රම සම්බන්ධයෙන් මාලදිවයිනේ ZV නිලධාරීන් සඳහා ධාරිතා වර්ධනය කිරීම පිළිබඳ වැඩමුළුව | 12 | 15 | 180 |
| 14 | පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපාරය | කණ්ඩායම් ඒකරාශී කිරීම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන | 4 | 120 | 480 |
| 15 | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමෙන්තුව | සේවාරම්භක පුහුණු වැඩසටහන | 2 | 17 | 34 |
| 16 | ජාතික ඖෂධ තත්ත්ව සහතික පරීක්ෂණාගාරය | ජාල මෙහෙයුම් සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන | 2 | 40 | 80 |
| 17 | මැතිවරණ දෙපාර්තමේන්තුව | තොරතුරු තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන | 15 | 55 | 825 |
| 18 | අමාත්‍යාංශය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, දෙපාර්තමේන්තු | මාර්ගස්ථ වාහන කළමනාකරණ පද්ධතිය (කණ්ඩායම්1) මාර්ගස්ථ වාහන කළමනාකරණ පද්ධතිය (කණ්ඩායම් 2) | 2 | 62 | 124 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 19 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | තැපැල් කළමනාකරණ ක්‍රම | 1 | 8 | 8 |
| 20 | ශ්‍රී ලංකා නාවික හමුදාව | නායකත්ව සහ කළමනාකරණ අධ්‍යයනය | 5 | 14 | 70 |
| 21 | අධ්‍යාපන අමාත්‍යංශය | සංවර්ධන සහකාර නිලධාරීන් සඳහා දෙදින පුහුණු වැඩසටහන | 2 | 40 | 80 |
| 22 | මඩකලපුව දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | සැලසුම් නිලධාරීගේ හැකියාවන් වර්ධනය කිරීම, ප්‍රතිඵල පාදක කළමනාකරණය පිළිබඳ මොඩියුලය | 5 | 19 | 95 |
| 23 | මඩකලපුව දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් සැලසුම් ලේකම් කාර්යාලය | සැලසුම් නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය කිරීමේ වැඩසටහන. සම්පත් ආකෘති සකස් කිරීම පිළිබඳ මොඩියුලය | 10 | 20 | 200 |
| 24 | මඩකලපුව දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් සැලසුම් ලේකම් කාර්යාලය | සැලසුම් නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය කිරීම, ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි සහ කළමනාකරණය පිළිබඳ මොඩියුලය | 5 | 16 | 80 |
| 25 | බන්ධනාගාරය පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය | ධාරිතා වර්ධනය කිරීමේ වැඩසටහන | 19 | 17 | 323 |
| 26 | බන්ධනාගාරය පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය | හැකියාවන් වර්ධනය කිරීමේ වැඩසටහන | 10 | 31 | 310 |
| 27 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | කළමනාකරණ හැකියාවන් පිළිබඳ පුහුණුව | 3 | 26 | 78 |
| 28 | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය | අලුතින් බඳවා ගත් සිවිල් ගුවන් සේවා නිලධාරීධාරීන් සඳහා පුහුණු වැඩසටහන | 5 | 22 | 110 |
| 29 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | ශ්‍රී ලංකා පුස්තකාලය සේවයට අලුතින් බඳවා ගත් නිලධාරීන් සඳහාපූර්ව සේවාරම්භක පුහුණු වැඩසටහන | 5 | 34 | 170 |
| 30 | දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේනතුව | සැලසුම් සංකල්ප පිළිබඳ පුහුණුව | 5 | 15 | 75 |
| 31 | කම්කරු දෙපාර්තමේන්තුව | හැකියාවන් වර්ධනය කිරීමේ වැඩසටහන | 30 | 35 | 1050 |
| 32 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | ග්‍රාම නිලධාරී සඳහා පුහුණු වැඩසටහන | 25 | 136 | 3400 |
| | එකතුව | | | 901 | 5230 |

# 10.15 - කළමනාකරණ උපදේශන සේවා

සංවිධානවල කාර්යය සාධනය හා ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් සංවිධාන සංවර්ධනය, සේවක ඇගයීම් හා සංවිධාන ප්‍රතිව්‍යුහගත කිරීම සහ ක්‍රියාවලිය නැවත සකස් කිරීම සඳහා පද්ධති වැඩි දියුණු කිරීම ආදි පුළුල් පරාසයක විහිදුණු කළමනාකරණ උපදේශන සේවා සපයනු ලබයි.

2011 වසර තුළදී සිදු කරන ලද උපදේශනයන් පහත දැක්වේ.

| අංකය | කළමනාකරණ උපදේශකත්වය | සේවා ලාභිය | තත්වය |
|---|---|---|---|
| 1 | සෞඛ්‍යය පහසුකම් සම්බන්ධයෙන් එලදායීත්ව සහ ගුණත්ව වර්ධනය සහ 5S සංකල්ප ක්‍රියාත්මක කිරීම | හෘද රෝග සහ ක්ෂය රෝගය පාලනය කිරීමේ ජාතික වැඩසටහන | ක්‍රියාත්මක වෙමින් පවතී |
| 2 | අපද්‍රව්‍ය පිරිසැකසුම් පහසුකම් ඇතිකිරීම | අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය | ක්‍රියාත්මක වෙමින් පවතී |
| 3 | විද්‍යුත් මාර්ග ඔස්සේ ලියවිලි අනුමත කර ගැනීමේ ක්‍රම ව්‍යාප්ත කිරීම | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය - අදියර 2 | ක්‍රියාත්මක වෙමින් පවතී |
| 4 | ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම | විදුලි සංදේශ නියාමක කොමිසම | ක්‍රියාත්මක වෙමින් පවතී |
| 5 | පරිපාලන කාර්යයන් ප්‍රතිව්‍යුහ ගත කිරීම | ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | ක්‍රියාත්මක වෙමින් පවතී |
| 6 | උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම | පළාත් ලේකම් කාර්යාලය - මධ්‍යම පළාත | ක්‍රියාත්මක වෙමින් පවතී |
| 7 | උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම | සී/ස මිනරල් සැන්ඩ්ස් | ක්‍රියාත්මක වෙමින් පවතී |
| 8 | ආදායම් බලපත්‍ර ගාස්තු සංශෝධනය | පළාත් රථවාහන කොමසාරිස් කාර්යාලය | ක්‍රියාත්මක වෙමින් පවතී |

## 10.16 - පශ්චාත් උපාධි අධ්‍යයන පාසල

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් (U.G.C) උපාධි පිරිනැමීමේ ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පිළිගෙන ඇති අතර මේ වන විට පහත සඳහන් පශ්චාත් උපාධි වැඩසටහන් පවත්වනු ලැබේ.

1 රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

2 රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

3 රාජ්‍ය කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධි (සාමාන්‍ය, මූල්‍ය, මානව සම්පත් කළමනාකරණ, ව්‍යාපෘති කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණ)

2011 වර්ෂයේදී (2011 - 2013 අධ්‍යයන වර්ෂය සඳහා) රාජ්‍ය කළමනාකරණ විද්‍යාපති වැඩසටහන් සඳහා සහභාගීවන්නන් 120 දෙනෙකු බඳවා ගන්නා ලදී. ආයතනය විසින් 2011 වසරේදී පහත සඳහන් වැඩසටහන් පවත්වන ලදී.

| අංකය | වැඩසටහන් (ක්‍රියාත්මක වෙමින් පවතින) | වැඩසටහන් ගණන | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | රාජ්‍ය කළමනාකරණ විද්‍යාපති උපාධිය 2008/2010 (සතියේ දින) | | |
| | ව්‍යාපෘති කළමනාකරණය | 01 | 24 |
| | සාමාන්‍ය කළමනාකරණය | 01 | 16 |
| 2 | රාජ්‍ය කළමනාකරණ විද්‍යාපති උපාධිය 2008/2010 (සති අන්ත) | | |
| | සාමාන්‍ය කළමනාකරණය | 01 | 24 |
| 3 | රාජ්‍ය කළමනාකරණ විද්‍යාපති උපාධිය 2009/ 2011 (සතියේ දින) | | |
| | ව්‍යාපෘති කළමනාකරණය | 01 | 17 |
| 4 | රාජ්‍ය කළමනාකරණ විද්‍යාපති උපාධිය 2009/2011 (සති අන්ත) | | |
| | ව්‍යාපෘති කළමනාකරණය | 01 | 21 |
| | සාමාන්‍ය කළමනාකරණය | 01 | 14 |
| 5 | රාජ්‍ය කළමනාකරණ විද්‍යාපති උපාධිය 2010/2012 (සතියේ දින) | 01 | 55 |
| 6 | රාජ්‍ය කළමනාකරණ විද්‍යාපති උපාධිය 2010 / 2012 (සති අන්ත) | 01 | 48 |

# වර්ෂය තුළ කාර්යය සාධනය

## 11. වර්ෂය තුළ කාර්යය සාධනය

i වර්ෂය තුලදී ද්විතීය, ස්ථිර හෝ කොන්ත්‍රාත් පදනම මත අධ්‍යයන පීඨය, පරිපාලන සහ අනෙකුත් අංශ සඳහා නව සාමාජිකයින් 15 දෙනෙකු බඳවා ගන්නා ලදී.

ii 2011 වර්ෂය තුළදී පහත සඳහන් නිලධාරීන් වෙත විදේශ ශිෂ්‍යත්ව පිරිනමන ලදී

| අංකය | නම | පාඨමාලා විස්තර | කාල පරිච්ඡේදය | රට |
|---|---|---|---|---|
| 1. | කේ.ඩී.එන්.ආර්.අශෝක මහතා | ද්විතීය රාජ්‍ය අංශයේ නායකත්ව වැඩසටහන | පෙබ.14-25 දක්වා | සිංගප්පූරුව |
| 2. | පී.පී.ඩී.පී.සේරසිංහ මිය | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ද්විතියික රාජ්‍ය අධ්‍යයන චාරිකාව, ශ්‍රී.ල.ප.සේ - අදියර VI වැඩ සටහන - IAS නිලධාරීන් සඳහා ඉන්දියාවට සහ දකුණු කොරියාවේ පැවති වැඩසටහන | අප්‍රේල් 24 - ජුනි 10 දක්වා | ඉන්දියාව |
| 3. | එම්.තිලකසිරි මහතා | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ද්විතියික රාජ්‍ය අධ්‍යයන චාරිකාව | අප්‍රේල් 24 - මැයි 07 දක්වා | තායිලන්තය |
| 4. | පී.ඩී.එල්.කුලරත්න මහතා | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ද්විතියික රාජ්‍ය අධ්‍යයන චාරිකාව | අප්‍රේල් 24 - මැයි 07 දක්වා | තායිලන්තය |
| 5. | ඩබ්.ඒ.ජයසුන්දර මහතා<br>එස්.මැදගම මහතා<br>එන්.ජයසුන්දර මිය<br>ඩබ්.එම්.එම්.පී.ඩී.විජේකෝන් මයා<br>එන්.එම්.එස්.ඒ.බණ්ඩාර මහතා<br>ඩී.හෙට්ටිආරච්චි මයා<br>ඒ.එච්.එම්.එල්.අබේරත්න මයා<br>ආර්.ඒ.එස්.පී.රණවීර මිය<br>විදුත් මෙන්ඩිස් මයා. | පුහුණුව සහ සංවර්ධනය පිළිබඳ අධ්‍යයන චාරිකා වැඩසටහන සඳහා හැකියාවන් වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | අප්‍රේල් 24 - 29 දක්වා | සිංගප්පූරුව |
| 6. | බී.විජයරත්න මයා | සාක් රැස්වීම | ජූලි 22 - 25 දක්වා | භූතානය |
| 7. | සුජාන් නානායක්කාර මයා | ශ්‍රී.ල.ප.සේ, අදියර V, IAS නිලධාරීන් සඳහා මධ්‍ය වෘත්තීය පුහුණුව | ඔක්තෝබර් 07 නොවැම්බර් 11 දක්වා | ඉන්දියාව |
| 8. | බී.විජයරත්න මයා | NAPSIPAG සමුළුව | දෙසැ 14 - 18 දක්වා | කත්මන්ඩු නේපාලය |

III කාල පරිච්ඡේදය අවසන් වන විට යෝජිත නේවාසිකාගාර සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු වලින් 95 %ක ප්‍රමාණයක් අවසන් කරන ලදී.





# යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

## 12. යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

පසුගිය වසර කිහිපය තුළදී, විශේෂයෙන්ම ඒකාබද්ධ සේවාවන් හි මාණ්ඩලික ශ්‍රේණි වලට බඳවාගත් පිරිස ද ඇතුළත්ව අභ්‍යාසලාභීන්ගේ සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස ඉහළ යාමක් දක්නට ලැබුණි. මෙම නව නිලධාරීන්ට සේවාරම්භක පුහුණුව ලබා දුන් අතර ඉන්පසුව ඔවුන් කෙටි කාලින පුහුණු පාඨමාලා වෙත යොමු කරන ලදී. මීට අමතරව පශ්චාත් උපාධි අධ්‍යයන පාසලේ ක්‍රියාත්මක වෙමින් පවතින වැඩ සටහන් සඳහා ද වැඩි වැඩියෙන් සහභාගීවන්නන්, ආකර්ෂණය විය. මෙම කාල සීමාව තුළ දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රය ද විශාල සේවාලාභින් සංඛ්‍යාවකට පහසුකම් සපයා ඇත.

දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පවතින අනෙකුත් පුහුණු ආයතන හා සසඳන විට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වැඩි ප්‍රසිද්ධියකින් තොරව සිය කටයුතු පවත්වාගෙන ගොස් ඇත. මීට හේතුව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය රාජ්‍ය සංස්ථාවක් ලෙස උසස් කරනු ලැබීමට පෙර ප්‍රධාන වශයෙන් රජයේ ප්‍රතිපාදන මත යැපුණු රජයේ ආයතනයක් වීමයි. කෙසේ වෙතත්, අනෙකුත් පුහුණු ආයතන සමඟ උරෙන් උර ගැටෙමින් සේවාවන්හි ගුණාත්මක භාවය රඳා පවත්වා ගැනීම සඳහා ආයතනයේ බාහිර ස්වරූපය ද ඉහළ නැංවීම අවශ්‍ය වේ. එම නිසා, 2011 වර්ෂය තුළ දී පහත සඳහන් කාර්යයන් ආරම්භ කරන ලදී.

| අංකය | විස්තරය |
|---|---|
| 01 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ රථගාල, මාර්ග ඇතුරුම් ගල් (Interlocking Paving Blocks) යොදා සකස් කිරීම |
| 02 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නේවාසිකාගාර සංකීර්ණය අළුත්වැඩියා කිරීම සහ වැඩිදියුණු කිරීම (වැසිකිළි 16ක් ප්‍රතිසංස්කරණය කිරීම) |
| 03 | සැලසුම් කිරීම, සැපයීම සහ ගෘහභාණ්ඩ සවිකිරීම ඇතුළත්ව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ආපන ශාලාවේ ඉතිරි වැඩ සැලසුම් කිරීම, ඉදිකිරීම සහ සම්පූර්ණ කිරීම |
| 04 | වායු සමීකරණ යන්ත්‍ර සැපයුම් කිරීම සහ සවිකිරීම (නේවාසිකාගාරය සහ දේශන ශාලා) |
| 05 | ප්‍රධාන ශ්‍රවනාගාරය,රැස්වීම් ශාලාව සහ දේශන ශාලා 17ක් අභ්‍යන්තර වැඩිදියුණු කිරීම් සිදු කිරීම |
| 06 | පරිඝනක මුද්‍රන යන්ත්‍ර 05ක් මිලදී ගැනීම |
| 07 | ප්‍රධාන සහ කුඩා ශ්‍රවනාගාරය, සම්මන්ත්‍රණ ශාලාව, කෑම කාමරය සහ දේශන ශාලා 14ක් සඳහා ගෘහ භාණ්ඩ සැලසුම් කිරීම්, සැපයුම් කිරීම හා සවි කිරීම |
| 08 | ප්‍රධාන ගොඩනැගිල්ලේ වැසිකිළි 08 ක් ප්‍රතිසංස්කරණය කිරීම |

| අංකය | විස්තරය |
|---|---|
| 09 | ජලා පවහන පද්ධති සහ අප ජලවහන නල මාර්ග ඉදිකිරීම |
| 10 | රථගාල ඉදිකිරීම |

## යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් වියදම් වර්ගීකරණය කිරීම - 2011

| කාර්යයන් | ආයෝජන වටිනාකම (රු) |
|---|---|
| ගොඩනැගිලි | 7,644,201.75 |
| ලීබඩු හා සවි කිරීම් | 602,572.64 |
| කාර්යාල උපකරණ | 569,460.88 |
| විදුලි උපකරණ | 4,970,131.70 |
| පරිඝනක | 1,470,398.18 |
| මෝටර් රථ | 29,100,000.00 |
| පොත් | 304,096.93 |
| වෙනත් වත්කම් | 5,545,259.22 |
| මෘදුකාංග පැකේජ් | 251,160.00 |
| නේවාසිකාගාර ව්‍යාපෘතිය | |
| ගොඩනැගිලි | 2,923,691.44 |
| විදුලි උපකරණ හා සවිකිරීම් | 1,030,592.00 |
| ලීබඩු | 1,432,278.40 |
| රෙදිපිළි | 1,047,398.00 |
| අනෙකුත් වත්කම් | 1,244,195.34 |
| එකතුව | **58,135,436.48** |

# පුස්තකාලය සහ තොරතුරු සේවා

# 13. පුස්තකාලය සහ තොරතුරු සේවා

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුස්තකාලය මගින් ආයතනයේ පුහුණුවීම් සඳහා සහභාගී වන අධ්‍යයන පීඨ සාමාජිකයන්, රාජ්‍ය / පෞද්ගලික අංශයේ විධායකයන් ආදීන්ගේ තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කරනු ලබයි. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුස්තකාලය එය භාවිතා කරන්නන්ගේ ඉගෙනුම් අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂයෙන්ම රාජ්‍ය පරිපාලනය, කළමණාකරණය, මූල්‍ය කළමනාකරණය, ගණකාධිකරණය සහ වෙනත් අදාළ අධ්‍යයන ක්ෂේත්‍ර ද ඇතුළුව පුළුල් පරාසයක යාවත්කාලීන පොත් පත් සම්භාරයකින් සමන්විත වේ.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය නව පුහුණු පාඨමාලා හඳුන්වා දීම, එහි වත්මන් පාඨමාලා යාවත්කාලීන කිරීම, උපදේශන සේවා හා පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම ආදිය සිදුකරන විට පුස්තකාලය අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීම මඟින් එම ක්‍රියාවලියට දායක වේ. 2011 වසර තුළ දී පුස්තකාලයේ ග්‍රන්ථ එකතුව සංවර්ධනය කිරීමේ වැඩ සටහනේ දී අවධානය යොමු කරන ලද්දේ රාජ්‍ය ප්‍රතිපත්තිය, යහ පාලනය, පරිසර කළමනාකරණය, කාර්යය සාධන වර්ධනය, එලදායිතාව, ව්‍යාපෘති කළමනාකරණය හා ක්‍රියාත්මක කිරීම, ස්ත්‍රී - පුරුෂ භාවය පිළිබඳ අධ්‍යයනයන් දරිද්‍රතාවය තුරන් කිරීම, ගෝලීයකරණය, පුද්ගලිකරණය, ඊ- ආණ්ඩුකරණය (e - governance) සහ ඊ - ව්‍යාපාර (e-business) යන විෂය ක්ෂේත්‍රයන් පිළිබඳවයි.

**පුස්තකාලය මඟින් සපයනු ලබන සේවා**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුස්තකාලය පාඨක පරිශිලනය සඳහා සඳුදා සිට - සිකුරාදා දක්වා උදෑසන 7.30 සිට සවස 7.30 දක්වා විවෘත පවතින අතර ඉරිදා දිනවල හා ප්‍රසිද්ධ නිවාඩු දින වල වසා තබනු ලැබේ.

විශේෂ විෂය ක්ෂේත්‍රයන්ට අදාළ නාමාවලි, අධ්‍යයන පීඨ සාමාජිකයන්ට හා සහභාගිවන්නන්ට ඔවුන්ගේ ඉල්ලීම පරිදි ලබා දෙනු ලැබේ. ඉංග්‍රීසි බසින් ඇති ග්‍රන්ථ එකතුවට අතිරේක වශයෙන් සිංහල හා දෙමළ ග්‍රන්ථ එකතුවක් සංවිධානය කිරීම සඳහා ද පියවර ගෙන තිබේ.

පාඨකයන්ට පරිශීලනය සඳහා ග්‍රන්ථ සොයාගැනීමේදී සහාය වීම පිණිස කාඩ්පත් සුචියක් හා පරිගණකගත සුචියක් ලබා දෙයි. සේවාලාභීන්ට සේවා සැපයීම සඳහා අන්තර් පුස්තකාල බැහැර දීමේ පහසුකම් සපයා තිබේ. එමෙන්ම ඡායා පිටපත් පහසුකම් හා ඊ- ගොනුකරණ මුද්‍රණ සේවා ද සහන මිල ගණන් යටතේ පුස්තකාලයේ පවතී.

### පුස්තකාලය භාවිතා කරන්නන් (සාමාජිකත්වය සහිතව)

2011 වර්ෂය තුලදී පුද්ගලයින් 46 දෙනෙකු පුස්තකාල සාමාජිකත්වය ලබාගෙන ඇති අතර, එය පහත වගුවේ දක්වා ඇත.

| අංකය | පාඨමාලාව | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ දර්ශනපති උපාධිය | 04 |
| 2 | කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව | 32 |
| 3 | ස්ථිර සාමාජිකත්වය | 01 |
| 4 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්යය මණ්ඩලය | 09 |
| | එකතුව | **46** |

### පුස්තකාල ග්‍රන්ථ එකතුව

විවිධ වර්ගයේ කෙටිකාලීන පුහුණු පාඨමාලා සඳහා සහභාගීවන්නන් ද තම දැනුම වර්ධනය කරගැනීම සඳහා පුස්තකාලය භාවිතා කරනු ලබයි. 2011 වර්ෂය තුළදී සහභාගීවන්නන් 3500ක් පමණ පුස්තකාල සේවාවන් භාවිතා කොට ඇත.

### පුස්තකාලය ග්‍රන්ථ එකතුව

#### පොත්පත්


2011 වර්ෂය අවසන් වන විට ඉන්වෙන්ට්‍රියේ ඇතුළත් කර ඇති මුළු පොත් සංඛ්‍යාව 29053කි. පොත් තොග වැඩි කිරීමේ අරමුණින් 2011 වර්ෂය තුළදී නව ග්‍රන්ථ 1304 ක් මිලට ගන්නා ලදී. ඊට අමතරව, අනුග්‍රහක පිටපත් 426ක් ද පුස්තකාලය වෙත ලැබී ඇත. තවද මොනෑෂ් විශ්ව විද්‍යාලයේ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වටිනාකම රු.323,568 ක් වන පොත් 326 ක් පුස්තකාලය වෙත පරිත්‍යාග කරන ලදී.

#### සඟරා

පුස්තකාලය භාවිතා කරන්නන්ගේ ඉහළ යන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා තොරාගත් සඟරා 50කට පමණ දායක මුදල් ගෙවා ඇත. ඊට අමතරව දේශීය සහ අන්තර්ජාතික සංවිධාන වෙතින් නොමිලයේ ලබා දෙන ලද පදනම මත සඟරා 100ක් පමණ පුස්තකාලය වෙත ලබා දී ඇත. මොනෑෂ් විශ්ව විද්‍යාලය විසින් වටිනාකම රු.2,387,556.96 සඟරා 555ක් පරිත්‍යාග කොට ඇත.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අරමුදල් උපයෝගී කර ගැනීම පිළිබඳ තොරතුරු පහතින් දැක්වේ.

| මිලදී ගත් අයිතමය | වියදම (රු.) |
|---|---|
| පොත් | 303208.93 |
| වාර ප්‍රකාශන (දේශීය) | 43566.00 |
| වාර ප්‍රකාශන (විදේශීය) | 311678.87 |
| පුවත්පත් | 62465.00 |
| එකතුව | 720918.80 |



# මූල්‍ය සමාලෝචනය

## ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
## 2011.12.31 දිනට මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශය

| | සටහන් | 2011 | 2010 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| අතැති තොග | 1 | 3,809,776.62 | 3,569,536.50 |
| අත්තිකාරම් (උපලේඛනය 01) | 2 | 1,296,478.28 | 1,353,037.64 |
| පූර්ව ගෙවීම් (උපලේඛනය.02) | | 1,186,517.63 | 576,758.61 |
| කාර්ය මණ්ඩල ණය (උපලේඛනය.03-05) | 3 | 13,007,416.24 | 9,968,977.05 |
| ලැබිය යුතු මුදල් (උපලේඛනය.06) | | 26,744,563.49 | 13,753,390.99 |
| භාණ්ඩාගාර බිල්පත් | | 0.00 | 88,000,000.00 |
| දිරි දීමනා යෝජනා ක්‍රමය | | 171,849.34 | 0.00 |
| බැංකු ශේෂ | 4 | 119,039,669.01 | 45,061,069.68 |
| | | 165,256,270.61 | 162,282,770.47 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ යන්ත්‍රාගාර සහ උපකරණ (උපලේඛනය.07) | 5 | 190,793,105.80 | 142,157,131.82 |
| නොනිමි වැඩ | | 104,372,449.83 | 76,769,813.52 |
| ආයෝජන (උපලේඛනය.08) | | 2,097,824.40 | 1,984,264.81 |
| | | 297,263,380.03 | 220,911,210.15 |
| **මුලු වත්කම්** | | **462,519,650.64** | **383,193,980.62** |
| **වගකීම් ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු තැන්පතු (උපලේඛනය 09-10) | 6 | 17,394,338.44 | 34,322,616.95 |
| ගෙවිය යුතු උපදේශන ගාස්තු (උපලේඛනය.11) | | 3,671,091.77 | 25,132,062.64 |
| ගෙවිය යුතු උ.වි.ගෙ | | 0.00 | 0.00 |
| උපචිත වියදම්(උපලේඛනය.12) | | 22,125,178.18 | 2,401,377.45 |
| හිමිකම් නොපෑ ගෙවීම් | | 7,643.52 | 7,050.00 |
| දෙමළ වැඩසටහන | | 252,000.00 | 3,503,128.48 |
| සිංහල වැඩසටහන | | 0.00 | 2,628,269.08 |
| DMP | | 0.00 | 491,349.13 |
| GIS ව්‍යාපෘතිය | | 0.00 | 44,222.90 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය | | 0.00 | 899,228.74 |
| ශ්‍රී.ල.ස.ප.ආ ප්‍රාග්ධනය ඉහළ නැංවීම | | 0.00 | 29,540.00 |
| බොල්ණය සඳහා වෙන් කිරීම | | 470,122.50 | 470,122.50 |
| | | 43,920,374.41 | 69,928,967.87 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සී/ස දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රය | | 34,756,235.53 | 36,411,294.36 |
| විලම්භිත ආදායම | | 0.00 | 157,099.64 |
| කොෆි අන්නොමා අරමුදල | | 0.00 | 22,191.50 |
| පාරිතෝෂිත සඳහා වෙන්කිරීම (උපලේඛනය 13) | | 17,930,529.50 | 15,308,325.00 |
| ප්‍රසාද අරමුදල් ගිණුම | | 383,412.41 | 87,178.41 |
| විශිෂ්ඨ කාර්යසාධන අරමුදල | | 50,927.36 | 48,660.21 |
| | | 53,121,104.80 | 52,034,749.12 |
| **මුලු වගකීම්** | | 97,041,479.21 | 121,963,716.99 |
| **ශුද්ධ වත්කම්** | | **365,478,171.43** | **261,230,263.63** |
| **ශුද්ධ වත්කම්/ හිමිකම්** | | | |
| භාණ්ඩාගාරයෙන් ලද දායකත්වය | | 65,600,000.00 | 63,240,000.00 |
| ප්‍රාග්ධන පරිත්‍යාග | | 29,100,000.00 | 0.00 |
| වත්කම් ප්‍රත්‍යාගණනසංචිත | | 13,365,807.00 | 6,152,662.00 |

| | | |
|---|---|---|
| සමුච්චිත අතිරික්තය | 257,412,364.43 | 191,837,601.63 |
| **මුළු ශුද්ධ වත්කම්/හිමිකම්** | **365,478,171.43** | **261,230,263.63** |

Accountant

Date: 29.02.2012

P. D. LAL KULARATHNA
Accountant
Sri Lanka Institute of Development Administration
28/10, Malalasekara Avenue,
Colombo - 7.

Director

Date: 29.02.2012.

B. Wijayaratne
Director
Sri Lanka Institute of Development Administration
28/10, Malalasekara Mw, Colombo 07

## ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
## 2011.12.31 දිනට අවසන් වසර සඳහා මූල්‍ය කාර්ය සාධනය දැක්වෙන ප්‍රකාශය

| | සටහන් | 2011 | 2010 |
|---|---|---|---|
| **ආදායම** | | | |
| භාණ්ඩාගාරයෙන් ලද දායකත්වය | | 47,480,000.00 | 39,100,000.00 |
| **වෙනත් ආදායම්** | | | |
| පාඨමාලා ගාස්තු - දේශීය | | 18,908,910.21 | 6,599,025.91 |
| ශාලා කුළිය | | 528,550.00 | 391,075.00 |
| ප්‍රකාශන අලෙවිය | | 10,420.50 | 9,642.50 |
| ආයෝජන මත ආදායම් | 1 | 447,803.43 | 3,756,933.18 |
| ණය පොලී ආදායම | | 501,497.57 | 425,519.75 |
| විවිධ ආදායම් | 2 | 1,755,939.18 | 1,670,917.61 |
| කුලිය | | 1,342,734.00 | 1,440,000.00 |
| බදු කුළිය | 3 | 1,655,058.83 | 1,655,058.83 |
| පශ්චාත් උපාධි අධ්‍යයන පාසල - ආදායම (උපලේඛනය 14) | | 16,074,850.00 | 12,400,454.00 |
| ඉංග්‍රී සි වැඩසටහන - ආදායම (උපලේඛනය 14) | | 10,339,500.66 | 3,502,950.00 |
| භාෂා පරිවර්තන ක්‍රම පිළිබඳ ඩිපලෝමාව | | 0.00 | 64,000.00 |
| අපහරණ ආදායම | | 635,249.07 | 0.00 |
| උපදේශන ගාස්තු(උපලේඛනය 16,17සහ18) | | 47,552,682.01 | 34,725,754.78 |
| දෙමළ වැඩසටහන (උපලේඛනය.19) | | 3,695,128.48 | 0.00 |
| සිංහල වැඩසටහන (උපලේඛනය.20) | | 2,629,519.08 | 0.00 |
| DMP (උපලේඛනය 21) | | 491,349.13 | 255,000.00 |
| ස්වාරම්භක පුහුණු වැඩසටහන | | 0.00 | 23,923,838.66 |
| **මුලු ආදායම** | | **154,049,192.15** | **129,920,170.22** |
| **වියදම්** | | | |
| සේවක පඩිනඩි | 4 | 54,433,656.89 | 48,362,517.01 |
| කාර්යමණ්ඩල සුභසාධනය | 5 | 1,695,154.89 | 1,532,369.25 |
| ගමන් වියදම් හා යැපුම් දීමනා | 6 | 1,830,281.86 | 121,958.25 |
| උපයෝගිතා හා අනෙකුත් සේවාවන් | 7 | 18,744,384.11 | 15,277,291.68 |
| ප්‍රවාහනය | 8 | 6,172,627.73 | 3,625,833.83 |
| ස්ථාවර වත්කම් අළුත්වැඩියා හා නඩත්තු | 9 | 3,133,879.30 | 3,273,493.64 |
| සැපයුම් හා අවශ්‍යතා | 10 | 5,572,504.40 | 3,947,488.53 |
| මූල්‍ය ගාස්තු | 11 | 1,479,168.76 | 1,955,318.46 |
| පුස්තකාල සේවා | 12 | 221,573.60 | 775,669.12 |
| පුහුණුව සහ ඇගයීම | 13 | 15,148,238.72 | 7,978,468.16 |
| ප්‍රකාශන සහ තොරතුරු සේවා | 14 | 293,943.50 | 0.00 |
| ක්ෂය ප්‍රතිපාදන | 15 | 11,832,723.73 | 12,933,900.45 |
| පශ්චාත් උපාධි අධ්‍යයන පාසල (උපලේඛනය 14) | | 4,348,204.44 | 5,148,191.78 |
| ඉංග්‍රීසි වැඩසටහන (උපලේඛනය 15) | | 2,761,478.29 | 2,752,090.68 |
| භාෂා පරිවර්තන ක්‍රම පිළිබඳ ඩිප්ලෝමාව | | 0.00 | 97,340.00 |
| උපදේශන ගාස්තු (උපලේඛනය 16,17,18) | | 23,314,279.84 | 17,555,309.09 |
| දෙමළ වැඩසටහන (උපලේඛනය 19) | | 566,512.00 | 0.00 |
| සිංහල වැඩසටහන (උපලේඛනය 20) | | 369,500.00 | 0.00 |
| DMP (උපලේඛනය 21) | | 0.00 | 107,500.00 |
| ස්වාරම්භක පුහුණු වැඩසටහන් සඳහා වියදම් | | 0.00 | 2,458,625.91 |
| **මුලු වියදම** | | **151,918,112.06** | **127,903,365.84** |
| **වර්ෂය සඳහා අතිරික්තය** | | **2,131,080.09** | **2,016,804.38** |
| **නේවාසිකාගාරයේ ශුද්ධ හිඟය** | 16 | **(1,490,318.87)** | **(1,536,481.45)** |

| | | |
|---|---|---|
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය** | **640,761.22** | **480,322.93** |
| | | |
| **සමුච්චිත අතිරික්තය/( හිඟය) පිළිබඳ ප්‍රකාශනය** | | |
| ජනවාරි 01 දිනට ශේෂය | 255,077,601.63 | 197,349,203.30 |
| ප්‍රාග්ධන ප්‍රදාන | 0.00 | 63,240,000.00 |
| පූර්ව වර්ෂයේ ගැලපුම් | 1,694,001.58 | (5,991,924.60) |
| **නැවතත් සඳහන් කෙරෙන්නේ** | 256,771,603.21 | 254,597,278.70 |
| වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය (හිඟය) | 640,761.22 | 480,322.93 |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **257,412,364.43** | **255,077,601.63** |

# විගණකාධිපති වාර්තාව
# සහ පිළිතුරු

## 14. විගණකාධිපති වාර්තාව සහ පිළිතුරු

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. – පීඒ/ඒ/ එස්එල්අයිඩීඒ/එෆ්ඒ/11 | ඔබේ අංකය / உமது இல / No. | දිනය / திகதி / Date – 2012 දෙසැම්බර් 31 දින |

අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය.

**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.ඒ.එස් සමරවීර
විගණකාධිපති.

පිටපත් -

1. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
2. ලේකම් - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை | No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය | ෆැක්ස් අංකය | ඉලෙක්ට්‍රොනික් තැපැල්

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல / My No. පීඑෆ්/ඒ/ එස්එල්ඩීඅයිඩීඒ/එෆ්ඒ/11

ඔබේ අංකය / உமது இல / No.

දිනය / திகதி / Date 2012 දෙසැම්බර් [illegible] දින

අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය.

**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

-----------------------------------------------------------

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 1982 අංක 09 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පනතේ 21 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2012 අගෝස්තු 24 දින නිකුත් කරන ලදී.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

---

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி 2887220
ෆැක්ස් අංකය / பெக்ஸ் இல 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් [illegible]

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 <u>තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2 <u>මූල්‍ය ප්‍රකාශන</u>

2.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 18 ට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

i. ස්ථාවර වත්කම් මිලදී ගත් දිනයේ සිට ක්ෂය කිරීම් කලයුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල මිලදීගෙන තිබුණු වත්කම් වෙනුවෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

ii. ක්ෂය අනුපාතයන් තීරණය කිරීමේදී වත්කම් වල පැවැත්ම සහ ආයු කාලය සලකා නොතිබුණු අතර ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් වල ශේෂ ජීවිත කාලය පිළිබඳව තක්සේරුවක්ද කර නොතිබුණි.

iii. සමාලෝචිත වර්ෂයේ අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය වටිනාකම රු.16,939,764 ක් වූ වත්කම් භාවිතයේ පැවතියද, ඒවා ප්‍රත්‍යාගණනය කර ගිණුම් වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන වල බොල් ණය සඳහා ප්‍රතිපාදන සලසා තිබුණද, ගණනය කරන ලද ආකාරය හෝ යොදාගත් අනුපාතය හෝ ගිණුම් වල අනාවරණය කර නොතිබුණි.

(ආ) ගිණුම් ප්‍රතිපත්ති යටතේ වර්ෂ 5 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සේවකයින් වෙනුවෙන් පාරිතෝෂිත ප්‍රතිපාදන සලසන බව දක්වා තිබුණද, ඉදිරිපත් කර තිබුණු උපලේඛනයට අනුව වර්ෂයක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සේවකයින් වෙනුවෙන්ද ප්‍රතිපාදන සලසා තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) i සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් වාහන 3 ක පිරිවැය වටිනාකම ගිණුම්ගත නොකර රක්ෂිත වටිනාකම ගිණුම්ගත කිරීම නිසා වාහන වල පිරිවැය හා ප්‍රාග්ධන ආධාර වල අගය රු.10,625,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

ii ක්ෂය ප්‍රතිපාදන සලසන ලද ස්ථාවර වත්කම් වල පිරිවැය සහ මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන වත්කම් වල පිරිවැය අතර රු.25,458,440 ක වෙනසක් නිරීක්ෂණය විය. ඉහත වෙනස්කම් නිසා ගිණුම් වල සලසා ඇති ක්ෂය ප්‍රතිපාදනය රු.4,761,379 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වැඩිපුර ගෙවන ලද රු.1,674,450 ක් ,ගෙවිය යුතු උපදේශන ගාස්තු ශේෂයෙන් හිලව් කර ශුද්ධ ශේෂය පමණක් දක්වා තිබුණි.

(ඇ) රු.736,000 ක් වූ වියදම් ලැබිය යුතු ගිණුම් ශේෂයක් ලෙස සටහන් කිරීමෙන් වර්ෂයේ ලැබිය යුතු ගිණුම් ශේෂය හා අතිරික්තය වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) වත්කම් ප්‍රත්‍යාගණනයේදී විදුලි උපකරණ වල අගය රු.500,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) රු.21,066 ක් වූ තොග ශේෂයක අගය රු.476,680 ක් ලෙස දක්වා තිබීම නිසා වර්ෂය අවසානයට අත ඉතිරි තොගයේ වටිනාකම රු.455,614 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු.385,000 ක් වූ වාහනයක් සමාලෝචිත වර්ෂයේදී රු.200,950 කට විකුණා තිබුණු නමුත්, එහි පිරිවැය හෝ සමුච්චිත ක්ෂය ප්‍රතිපාදනය එම ගිණුම් වලට ගලපා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග ලෙස ලැබී තිබුණු එකතු වටිනාකම රු. 379,788 ක් වූ පුස්තකාල පොත් තොගයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) ඉකුත් වර්ෂයට අදාලව ගෙවන ලද රු.169,144 ක ජලගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

2.2.4 <u>නොසැසදූ පාලන ගිණුම්</u>

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් වියයන් 06 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන සහ වාර්තා වල දැක්වෙන ශේෂයන් අතර රු. 875,051 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.5 <u>ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු.26,744,563 ක් වූ ණයගැති ශේෂ වලින් රු. 908,778 ක් වූ ශේෂ 23 ක් අවුරුදු 3 ක කාලයක් ඉක්මවා තිබූ අතර, ඉන් රු. 764,465 ක් වූ ශේෂ 19 ක් වර්ෂ 5 ක කාලයක්ද ඉක්මවා තිබුණි.

(ආ) එකතුව රු. 1,309,046 ක් වූ නොපියවන ලද අත්තිකාරම් ශේෂය තුළ වර්ෂ 10 ත් 20 ත් අතර කාල පරාසයකට අයත් රු. 520,931 ක් වූ ශේෂ 36 ක් පැවති අතර, ඉතිරි රු. 788,115 ක් වූ ශේෂ 5 ක් වර්ෂ 1 ත් වර්ෂ 8 ත් අතර කාල පරාසයකට අයත් ඒවා විය. දිගු කාලයක සිට පවතින මෙම ශේෂයන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේද කටයුතු කර නොතිබුණි.

(ඇ) එකතුව රු. 25,796,270 ක් වූ ණයහිමි ශේෂ වලින් රු. 2,454,433 ක් වූ ශේෂ 24 ක් වර්ෂ 03 ක කාලයක් ඉක්මවා තිබුණු අතර, ඉන් රු. 1,048,248 ක් වූ ශේෂ 13 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් විය.

(ඈ) එකතුව රු.17,370,338 ක් වූ ගෙවිය යුතු තැන්පත් ශේෂ වලින් රු.2,506,578 ක්වූ ශේෂ 127 ක් වර්ෂ 3ක කාලයක් ඉක්මවා තිබුණු අතර, ඉන් රු.703,493 ක්වූ ශේෂ 104 ක් වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් විය.

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත සඳහන් ගිණුම් ශේෂයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| ගිණුම් විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ස්ථාවර වත්කම් | 254,837,766 | විධිමත් පරිදි සකස් කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් සහ වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| පරිගණක,උපාංග හා මෘදුකාංග | 43,627,026 | පරිගණක සම්බන්ධ විස්තර ඇතුලත් විස්තරාත්මක උපලේඛනය |
| ක්ෂය ප්‍රතිපාදන | 13,406,655 | ශේෂය සකස්වූ ආකාරය දැක්වෙන විස්තරාත්මක උපලේඛන |
| වාර්තා ලිවීම සඳහා කර ඇති ගෙවීම් | 1,401,629 | වාර්තා වල පිටපත් සහ ඊට අදාල විස්තර |
| අත්තිකාරම් නිරවුල් කිරීම් | 198,000 | නිරවුල් කිරීම් පිළිබඳ විස්තර, බිල්පත් හා කුවිතාන්සි |
| ඉන්ධන සහ අළුත්වැඩියා වියදම් | 5,919,975 | දෛනික ධාවන සටහන් පත් සහ මාසික කාර්ය සාධන සාරාංශ |
| ණයගැතියෝ | 2,505,460 | ණය ශේෂ 28 කට අදාළ සනාථ කිරීම් |
| ණයහිමියෝ | 2,891,468 | ණය ශේෂ 20 කට අදාළ සනාථ කිරීම් |

### 2.2.7 <u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.</u>

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1982 අංක 09 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පනතේ 13 (1) වගන්තිය | පාලක සභාවේ රැස්වීම් යටත් පිරිසෙයින් සෑම මාසයකම එක් වරක්වත් පැවැත්විය යුතු වුවද, 2011 වර්ෂය සඳහා පවත්වා තිබුණේ රැස්වීම් 09 ක් පමණි. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනත | |
| i. 10 (5) වගන්තිය සහ 1991 මාර්තු 20 දිනැති රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | පනතේ සඳහන් මුදල් යෙදවීම් වලින් පසුව වර්ෂයේ ශුද්ධ අතිරික්ත ආදායමින් ඉතිරි සියළුම මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| ii. 13 (8) වගන්තිය | 13 (7) (ඊ) වගන්තිය ප්‍රකාර වාර්තාව පාලක මණ්ඩලය විසින් සලකා බැලිය යුතු අතර, එහි දැක්වෙන කරුණු සම්බන්ධයෙන් ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග වාර්තාව ලැබී මාස 3 ක් ඇතුළත විගණකාධිපති වෙත දන්වා යැවිය යුතුය. ඉකුත් වර්ෂය සඳහා වූ වාර්තාව ඉදිරිපත් කර වර්ෂයකට වැඩි කාලයක් ගතවී තිබුණද, යථෝක්ත විධිවිධාන වලට අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) ආයතන සංග්‍රහයේ ix වැනි පරිච්ඡේදයේ 1 සහ 2.2 ඡේද | රජයේ සේවයෙන් ලබාගත් දැනුම හා පුහුණුව භාවිතා කරමින් උපයා ගන්නා ගාස්තු වලින් 10% ක් ඒකාබද්ධ අරමුදලට බැර කළයුතු වුවත් ආයතනය ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i මු.රෙ 188 (2) | උපලබ්ධි නොවූ රු. 124,725 ක් වූ චෙක්පත් හා මුදල් ඇණවුම් 26 ක් සම්බන්ධයෙන් මු.රෙ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| ii මු.රෙ 371 (2) (ආ) | අත්තිකාරම් ලබාදීමේදි සහ නිරවුල් කිරීමේදි අදාල විධිවිධාන වලට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 1 ක් වර්ෂ 19 ක් අතර කාලයට අයත් නොපියවන ලද අත්තිකාරම් ශේෂ 44 ක එකතුව රු. 1,309,046 ක් විය. |

iii මූ.රෙ 1647 (ඇ) — වාහන සහ ඒවායේ උපකරණ සම්බන්ධයෙන් සම්පූර්ණ පරීක්ෂණයක් පැවැත්විය යුතු වුවද, එවැනි පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

2.2.8 <u>ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

1963 නොවැම්බර් 30 දිනැති අංක 1024 එන්/800/29 සිවී දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව "රාජ්‍ය සංස්ථා" අප්‍රමාදව මූල්‍ය සහ පරිපාලන රෙගුලාසි සම්පාදනය කර ගත යුතු නමුත්, ඊට අනුකූලව කටයුතු නොකර රජයේ මුදල් රෙගුලාසි සහ ආයතන සංග්‍රහයේ විධි විධාන අනුගමනය කර තිබුණි. එහෙත් නිලධාරීන්ගේ වාර්ෂික නිවාඩු සහ අතිකාල දීමනා සම්බන්ධයෙන් පමණක් සාප්පු හා කාර්යාල සේවකයින් පිළිබඳ ආඥා පනතේ විධිවිධාන අනුගමනය කර තිබුණද, රාජකාරී කාලය සහ කාර්යාල වේලාව සම්බන්ධයෙන් එම පනතේ විධිවිධාන වලට අනුකූල ව කටයුතු කර නොතිබුණි. මේ නිසා වාර්ෂිකව සැලකිය යුතු රාජකාරී පැය ගණනක් අහිමිව තිබුණු අතර, අතිකාල දීමනා වෙනුවෙන්ද වැඩිපුර ගෙවීම් සිදුවී ඇති බව නිරීක්ෂණය විය.

2.2.9 <u>මතභේදයට තුඩුදෙන ගනුදෙනු</u>

දේශන පැවැත්වීම සහ ඊට සම්බන්ධිත උපදේශක පාඨමාලා සම්බන්ධීකරණය, සැලසුම් කිරීම, මෘදුකාංග සංවර්ධනය, වාර්තා ලිවීම යනාදී කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් ආයතනයේ ස්ථිර හා කොන්ත්‍රාත් උපදේශකවරුන්ට මෙන්ම නිලධාරීන් කිහිපදෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී රු.12,329,726 මුදලක් ද, ඉකුත් වර්ෂයේදී රු.9,952,915 ක මුදලක් ද ගෙවා තිබුණි.

2007 අගෝස්තු 21 දින අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද බාහිර සේවා සැපයීම් සම්බන්ධ ගෙවීම් පිළිවෙත අනුව ප්‍රයෝජිත ගෙවීම් සිදු කරන ලද බව දන්වා තිබුණද, එම සේවාවන් දෛනික රාජකාරී කාලය ඇතුළත සිදු කර තිබූ බව නිරීක්ෂණය විය. ආයතනය ස්ථාපිත පනතේ 3(1) වගන්තියේ දැක්වෙන කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් මෙම ගෙවීම් කර ඇති බව විගණනයේදී අනාවරණය වූ අතර, මෙම කාරණය රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කමිටු රැස්වීමේද සාකච්ඡාවට භාජනය වී තිබුණි.

3. <u>මූල්‍ය සමාලෝචනය</u>

3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතු වලින් රු. 640,761 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 480,323 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 160,438 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. නේවාසිකාගාර ආදායම් වල වූ රු.1,070,558 ක වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3.2 වාර්තාවේ 2.2.1 හා 2.2.3 ඡේදයන්හි ගැලපීම් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශණ වල දක්වා ඇති සමාලෝචිත වර්ෂයේ අතිරික්තයට දල වශයෙන් රු.මිලියන 5.5 ක ප්‍රමාණය අවාසි ලෙස බලපානු ඇත. එසේ හෙයින් වාර්තා කර ඇති ආයතනයේ මෙහෙයුම් අතිරික්තය වූ රු.640,761 ක ප්‍රමාණය ඉහත බලපෑම් හේතුවෙන් ඌනතාවයක් බවට පත් වේ.

4 <u>මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 <u>කාර්ය සාධනය</u>

4.1.1 <u>පුහුණු කටයුතු</u>

(අ) ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුළ සැලසුම්ගත වැඩසටහන් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| පාඨමාලා විස්තරය සහ වර්ෂය | සැලසුම් ගත පාඨමාලා ගණන | පැවැත්වූ පාඨමාලා ගණන | පාඨමාලා සදහා තෝරාගත් සංඛ්‍යාව | පාඨමාලා සම්පූර්ණ කළ සංඛ්‍යාව | පාඨමාලා හැරගිය සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| සහතික පත්‍ර පාඨමාලා | | | | | |
| 2011 | 72 | 30 | 756 | 633 | 123 |
| 2010 | 78 | 30 | 890 | 733 | 117 |
| ඩිප්ලෝමා පාඨමාලා | | | | | |
| 2011 | 09 | 06 | 245 | 208 | 37 |
| 2010 | 06 | 04 | 213 | 202 | 11 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. ඉකුත් වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂයේදී පවත්වා නොතිබුණු සැලසුම්ගත සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව පිළිවෙලින් 48 ක් හා 42 ක් විය.

ii. ඉකුත් වර්ෂයේදී සැලසුම් කල ඩිප්ලෝමා පාඨමාලා දෙකක්ද, සමාලෝචිත වර්ෂයේදී සැලසුම් කල පාඨමාලා තුනක්ද පවත්වා නොතිබුණි.

iii. ඉකුත් වර්ෂයේදී සැලසුම්ගත සහතික පත්‍ර පාඨමාලා සඳහා තොරාගත් අයගෙන් 117 දෙනෙකුද, සමාලෝචිත වර්ෂයේ තොරාගත් අයගෙන් 123 දෙනෙකුද පාඨමාලා හැරගොස් තිබුණි.

iv. සැලසුම්ගත ඩිප්ලෝමා පාඨමාලා සඳහා බඳවාගත් අයගෙන් ඉකුත් වර්ෂයේදී 11 දෙනෙකුද, සමාලෝචිත වර්ෂයේදී 37 දෙනෙකුද, පාඨමාලා හැරගොස් තිබුණි.

(ආ) ආයතනය විසින් පවත්වා තිබුණු අනෙකුත් වැඩසටහන් වලට අදාල විස්තර ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| පාඨමාලා විස්තරය | 2011 වර්ෂය<br>පාඨමාලා සංඛ්‍යාව | 2011 වර්ෂය<br>සහභාගි වූ සංඛ්‍යාව | 2010 වර්ෂය<br>පාඨමාලා සංඛ්‍යාව | 2010 වර්ෂය<br>සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| සේවාරම්භක පුහුණු වැඩසටහන් | 01 | 146 | 5 | 610 |
| ධාරිතා වර්ධන පුහුණු වැඩසටහන් | 11 | 396 | 6 | 233 |
| පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් | 13 | 286 | - | - |
| පශ්චාත් උපාධි වැඩසටහන් | | | | |
| - සම්පූර්ණ කරන ලද | 02 | 65 | 02 | 118 |
| - පවත්වාගෙන යන | 05 | 155 | 06 | 231 |
| පුහුණු උපදේශන සේවා වැඩසටහන් | 46 | 1,398 | 30 | 901 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. සමාලෝචිත වර්ෂයේදී අළුතින් පුහුණුකරුවන් පුහුණු කිරීමේ පාඨමාලාවක් හඳුන්වා දී තිබුණු අතර, පාඨමාලා 13 කදී 286 දෙනෙකු පුහුණු කර තිබුණි.

ii. 2010 දී පවත්වන ලද පුහුණු උපදේශන වැඩසටහන් 30 ක් මඟින් 901 දෙනෙකු පුහුණු කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී වැඩසටහන් 46 ක් මඟින් 1398 දෙනෙකු පුහුණු කර තිබුණි.

### 4.1.2 දේශන පැවැත්වීම.

(අ) අභ්‍යන්තර උපදේශකවරයෙකු මාසයකට සැලසුම්ගත පුහුණු වැඩසටහන් වල පැය 45 ක් දේශන පැවැත්විය යුතු අතර ඉකුත් වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර උපදේශකවරුන් සැලසුම්ගත පුහුණු වැඩසටහන් වලද පවත්වා තිබූ දේශන පිළිබඳව සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | උපදේශකවරු සංඛ්‍යාව | වර්ෂය තුළ පැවැත්විය යුතු දේශන පැය ගණන | පවත්වා තිබුණු පැය ගණන | අඩු වූ දේශන පැය ගණන (විචලනය) |
|---|---|---|---|---|
| 2011 | 18 | 9,720 | 2,108 | 7,612 |
| 2010 | 15 | 8,100 | 2,560 | 5,540 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. ඉකුත් වර්ෂයේ දී දේශන පැය 5,540 ක්ද, සමාලෝචිත වර්ෂයේදී දේශන පැය 7,612 ක්ද ආයතනයට අහිමිවී තිබුණි.

ii. සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී කිසිදු උපදේශකවරයෙකු මාසයකට නියමිත සම්පූර්ණ දේශන පැය ගණන පවත්වා නොතිබුණු අතර ඉකුත් වර්ෂයේදී උපදේශකවරුන් තිදෙනෙකු පමණක් වර්ෂයට නියමිත දේශන පැය ගණනින් හරි අඩක් ඉක්මවා දේශන පවත්වා තිබුණි.

(ආ) ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ අභ්‍යන්තර හා බාහිර උපදේශකවරුන් පවත්වා තිබුණු දේශන පැය ගණන් පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| | අභ්‍යන්තර උපදේශකවරු | | බාහිර උපදේශකවරු | | |
|---|---|---|---|---|---|
| වර්ෂය | සැලසුම් කළ වැඩසටහන් | උපදේශන වැඩසටහන් (ගෙවීම් මත) | සැලසුම් කළ වැඩසටහන් (ගෙවීම් මත) | උපදේශන වැඩසටහන් (ගෙවීම් මත) | එකතුව |
| | දේශන පැය | දේශන පැය | දේශන පැය | දේශන පැය | මුළු පැය |
| 2011 | 2,108 | 2,520 | 4,115 | 4,172 | 12,915 |
| 2010 | 2,560 | 2,226 | 2,346 | 2,450 | 9,582 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර උපදේශකවරුන් සැලසුම්ගත පාඨමාලා වල පවත්වා තිබුණු දේශන පැය ගණන පැය 452 කින් අඩුවී තිබුණි.

ii. ගෙවීම් මත කරන උපදේශන වැඩසටහන් වලදී පවත්වා ඇති දේශන පැය ගණන ඉකුත් වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේදී පැය 294 කින් වැඩිවී තිබුණි.

iii. බාහිර උපදේශකවරුන් සැලසුම්ගත පාඨමාලා වල පවත්වා තිබුණු දේශන පැය ගණන ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පැය 1,769 ක් වැඩිවී තිබුණි.

iv. බාහිර උපදේශකවරුන් උපදේශන වැඩසටහන් වල පවත්වා තිබුණු දේශන පැය ප්‍රමාණය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පැය 1,722 කින් වැඩිවී තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය නිලධාරීන්ට රාජ්‍ය ව්‍යාපාර රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 97 ක් මෙහෙයවීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් රු. 8,620,447 ක මුදලක් ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතිය 2008 වර්ෂයේ නිම වී තිබුණද, ඊට අදාල ගෙවීම් නිරවුල් නොකර ගිණුම් වල රු. 2,000,000 ක ශේෂයක් තවදුරටත් රඳවාගෙන තිබුණි.

(ආ) අදියර දෙකක් යටතේ ඉදිකිරීමට යෝජිතව තිබුණු නව ගොඩනැගිලි සංකීර්ණය වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට සහ කොළඹ මහ නගර සභාවට සේවා ගාස්තු ලෙස පිළිවෙලින් රු. 3,714,000 ක්, රු. 292,709 ක් ගෙවා තිබුණි. එහෙත් II අදියරට අයත් පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අත්හැරීම නිසා ඒ වෙනුවෙන් ගෙවා තිබුණු රු. 2,615,738 ක මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ඇ) 2007 වර්ෂයේ සිට අළුත්වැඩියා කටයුතු සඳහා වසා දමන ලද නේවාසිකාගාරයේ කාමර 13 ක අළුත්වැඩියා කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිමවී නොතිබුණි. එම හේතුව නිසා ආයතනයේ පුහුණු වන්නන්ට බාහිර නේවාසිකාගාර පහසුකම් ලබාදීමට සිදුවී තිබුණු අතර, ඒ වෙනුවෙන් 2011 වර්ෂයේදී රු.43,440 ක වියදමක් දැරීමට සිදුවී තිබුණි.

(ඈ) 1997,2002 සහ 2008 යන වර්ෂ වලදී ව්‍යාපෘති දෙකකින් ලැබී තිබුණු වාහන තුනක අයිතිය ආයතනයේ නමට පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයද ඇතුළත්ව ඉකුත් වර්ෂ 4 තුළ කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා නොගෙන එකතුව රු.44,715 ක් වූ ශේෂ සහිතව බැංකු ඉතිරිකිරීමේ ගිණුම් දෙකක් නිෂ්ක්‍රියව පවත්වාගෙන ගොස් තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ ප්‍රධාන බැංකු (ජංගම) ගිණුම් දෙකෙහි සැලකිය යුතු මුදල් ශේෂයන් රඳවා තිබුණු අතර, එම මුදල් ශේෂ වල මාසික සාමාන්‍යය රු. 124,799,787 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ත්‍රී වීලර් රථයක් සහ යතුරු පැදියක් ප්‍රයෝජනයට නොගෙන ගාල්කර තිබුණි.

**4.4 ආර්ථික නොවූ ගනුදෙනු**

මහා නගර සහා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට පෙර වර්ෂයට අදාල වරිපනම් ගෙවීමෙන් වට්ටම් ලබාගත හැකි වුවත්, ඒ අනුව කටයුතු නොකිරීම නිසා ලබාගත හැකිව තිබුණු රු. 76,222 ක වට්ටම් අහිමි වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ රු.762,220 ක් වූ වරිපනම් බදු 2012 ජුලි 30 වන විටත් ගෙවා නොතිබූ හෙයින් ඒ වෙනුවෙන් 20% ක් වූ වරෙන්තු/ අධිභාර ගාස්තු වශයෙන් රු.152,440 ක් මහ නගර සභාවට ගෙවීමට සිදු වන බව ද, විගණනයේදී නිරීක්ෂණය විය.

**4.5 හඳුනාගන්නා ලද පාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2004 සහ 2007 අතර කාල පරිච්ඡේදයට අදාළව නිලධාරීන් 5 දෙනෙකුගෙන් සහ බාහිර ආයතනයකින් අයවිය යුතු එකතුව රු.633,150 ක් වූ නේවාසිකාගාර ගාස්තු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණු අතර, එය ගිණුම් වලටද ඇතුලත් වී නොතිබුණි.

(ආ) පුහුණුකරුවන් පුහුණු කිරීමේ පාඨමාලාවේ ඇස්තමේන්තු ගත පිරිවැය රු.9,942,625 ක් වූ නමුත්,භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන තිබුණේ ඉන් රු. 3,493,320 ක් සඳහා පමණි. පාඨමාලාවේ සම්පූර්ණ වියදම ආයතනය වැයකර පාඨමාලාව පවත්වා තිබූ අතර, අවසානයේ තෝරාගත් 14 දෙනෙකුට විදේශ පුහුණුවද ලබා දී තිබුණි. පුහුණු පාඨමාලාව වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු. 6,763,915 ක් 2012 ජුලි 15 දින වන විටත් අය කරගෙන නොතිබූ බව විගණනයේදී අනාවරණය විය. කිසිදු අයකිරීමකින් තොරව පුහුණුකරුවන්ට නේවාසිකාගාරයේ කාමර 30 ක් ලබා දී තිබූ අතර මේ ආකාරයට නේවාසික පහසුකම් සැපයීම නිසා ආයතනයට උපයා ගත හැකිව තිබුණ ආදායම් අහිමි වී තිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) පශ්චාත් උපාධි සහ ඩිප්ලෝමා වැඩසටහන් වලට ඇතුළත් වූ සහ සහභාගී වූ අයදුම්කරුවන් 40 දෙනෙකුගෙන් අයවිය යුතු රු.5,583,050 ක මුදලක් ඉකුත් වර්ෂයේදී ගිණුම් වලින් ලියා හැර තිබුණි. මේ පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i පාඨමාලා ගාස්තු අයවිය යුතුව තිබුණු අයදුම්කරුවන්ගෙන් දෙදෙනෙකු නැවතත් 2008/2010 කාලපරිච්ඡේදය වෙනුවෙන් පාඨමාලා වලට ඇතුළත් වී තිබුණි.

ii එක් අයදුම් කරුවෙකුගෙන් අයවිය යුතු රු.6,750 ක් ලියාහැර තිබුණද, ඔහු පාඨමාලා ගාස්තුව ඉක්මවා රු.23,250 ක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය.වැඩිපුර ගෙවා තිබුණු පාඨමාලා ගාස්තුව ඔහු වෙත ආපසු ගෙවා නොතිබුණු අතර, ගෙවිය යුතු මුදලක් ලෙසද මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

4.6 <u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවක සංඛ්‍යා සැලැස්ම අනුව අනුමත තනතුරු 21 ක පුරප්පාඩු 48 ක් පැවතුණි.

(ආ) සේවක සංඛ්‍යා සැලැස්මෙහි අනුමත වූ රියදුරු හා පරිගණක වැඩසටහන් විශ්ලේෂක යන තනතුරු දෙකක අනුමත සීමාව ඉක්මවා තිදෙනෙකු සේවයේ යොදවා තිබුණි.

(ඇ) කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 14 දෙනෙකු තමන්ට හිමි වාර්ෂික නිවාඩු ප්‍රමාණය ඉක්මවා දින 224 ක වැටුප් රහිත නිවාඩු ලබාගෙන තිබුණි. මින් වැටුප් රහිත නිවාඩු දින 150 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති උපදේශක කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් හතර දෙනෙකු විසින් ලබාගෙන තිබුණි.

4.7 <u>සේවක පාර්ශ්වෝෂිත සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම.</u>

ඉකුත් වර්ෂය අවසානයට කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 62 දෙනෙකු වෙනුවෙන් රු.15,308,325 ක ප්‍රතිපාදන සලසා තිබුණද, එම මුදල් ආයෝජනය කර අරමුදලක් ගොඩනගා ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එම සාමාජික සංඛ්‍යාව 92 ක් දක්වාද, ප්‍රතිපාදනය රු.17,930,529 ක් දක්වාද, වර්ධනය වී තිබුණි.

5 <u>ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය</u>

5.1 <u>සංයුක්ත සැලැස්ම</u>

2003 ජුනි 2 දින හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාර සංයුක්ත සැලැස්මක් සකස් කළ යුතු අතර 5.1.3 වගන්තියේ විධි විධාන ප්‍රකාර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද, යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම, යාවත්කාලීන කරන ලද වාර්ෂික අයවැය සමඟ මූල්‍ය වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර ඉදිරිපත් කළ යුතුය. එහෙත් 2011 වර්ෂය සහ ඉන් ඉදිරියට බල පැවැත්වෙන ආකාරයට සකස්කර තිබුණු සංයුක්ත සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණේ 2011 නොවැම්බර් 29 දින දීය.

5.2 <u>අභ්‍යන්තර විගණනය</u>

ආයතනය ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

5.3 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 2 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාර අවම වශයෙන් ත්‍රෛමාසිකව විගණන කමිටු පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී කමිටු පවත්වා නොතිබුණි.

(ආ) උක්ත චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන කමිටුවේ කාර්ය සාධනය පිළිබඳ වාර්තාවක් ආයතනයේ වාර්ෂික වාර්තාවට ඇතුළත් කළ යුතු වුවත් කමිටු නොපැවැත්වීම නිසා ඊ අනුව කටයුතු කිරීමට නොහැකි වී තිබුණි.

5.4 <u>අයවැය පාලනය</u>

සමාලෝචිත වර්ෂය සඳහා වූ අය වැය ලේඛනය වරින් වර සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි. එම හේතුව නිසා අය වැය ගත හා සත්‍ය ආදායම් හා වියදම් අතර පිළිවෙලින් 06% සිට 96% දක්වා සහ 15% සිට 100% දක්වා වූ විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන සාධකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5.5 <u>වාර්ෂික වාර්තා සභාගත කිරීම</u>

ඉකුත් වර්ෂ වලදීද වාර්ෂික වාර්තා සභාගත කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය වූ අතර, 2010 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2012 ජුනි 7 දින දිය.

6 <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයන් පිළිබඳ අඩුපාඩු වරින් වර ආයතනයේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) මුදල් හා බැංකු කටයුතු
(ඇ) ස්ථාවර වත්කම්
(ඈ) වාහන උපයෝජනය
(ඉ) අත්තිකාරම්
(ඊ) ණයගැතියෝ සහ ණයහිමියෝ
(උ) කාර්ය මණ්ඩල පරිපාලනය
(ඌ) පුහුණු කටයුතු

එච්.ඒ.එස් සමරවීර
විගණකාධිපති.

**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාශ විගණකාධිපති වාර්තාව.**

2012/12/31 දිනැති උක්ත වාර්තාවේ සඳහන් කරුණු පිළිබඳව පාලක සභාවේ අදහස් පහත පරිදි වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**
**ප්‍රමිති - 18**

(i) 2012 වර්ෂයේ ආයතන මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අදාල නිවැරදි කිරීම් කිරීමට කටයුතු යොදා ඇත.

(ii) ක්ෂේත්‍රයේ භාවිතයන් සැලකිල්ලට ගෙන 2012 මූල්‍ය ප්‍රකාශන සඳහා නව අනුපාතයන් හඳුන්වා දීමට කටයුතු කරනු ලැබේ.

(iii) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු යොදා ඇත. ඒ අනුව 2012 මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම සිදු කරනු ලැබේ. 2011 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණන අඩුපාඩු නැවත සලකා බලා නිවැරදි කිරීමක්, ඒ අනුව 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමටත් කටයුතු යොදා ඇත.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

(අ) එකඟ වෙමි. ප්‍රතිපත්ති අනාවරණය කිරීමටත්, ඒ අනුව 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමට කටයුතු කරනු ලැබේ.

(ආ) විචක්ෂණශීලී බව අනුව සියලුම සේවකයන් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා ඇති අතර ඒ අනුව ප්‍රතිපත්ති සංශෝධනය කිරීමට හා මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීමට කටයුතු යොදා ඇත.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) i නිවැරදි කර ඇත.
i i මූල්‍ය ප්‍රකාශනයන්හි සඳහන් වත්කම් හා ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් වත්කම් සැසඳීමට කටයුතු කරගෙන යනු ලැබේ. ඒ අනුව 2012 අවසාන මූල්‍ය වාර්තා සකස් කිරීමේදී නිවැරදි අගයන් ගැලපීමට කටයුතු කරනු ලැබේ.

(ආ) 2012 වර්ෂයේ ගිණුම් මගින් නිවැරදිව දැක්වීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) වියදම් වර්ගීකරණය කිරීමේදී සිදු වූ ප්‍රමාද දෝෂයකි. නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) නිවැරදි කර ඇත.

(ඉ) ගණනය කිරීමේදී සිදු වූ ප්‍රමාද දෝෂයක් නිසා මෙම තත්ත්වය පැන නැගී ඇත. 2012 අවසන් ගිණුම් මඟින් මෙය නිවැරදි වේ.

(ඊ) නිවැරදි කර ඇත.

(උ) නිවැරදි කර ඇත.

(ඌ) අයහාර වියදම් වන බැවින් තවදුරටත් නිවැරදි කිරීම් අවශ්‍ය නොවේ. නමුත්, මෙවැනි අඩුපාඩු තවදුරටත් සිදු නොවීමට වගබලා ගන්නා ලෙස උපදෙස් දී ඇත.

**2.2.4. නොසැසඳුන පාලන ගිණුම්**

උප ලේඛන නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

**2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) පාලක සභාවේ අනුමැතිය පරිදි නිවැරදි කර ඇත.

(ආ) පාලක සභාවේ අනුමැතිය පරිදි නිවැරදි කර ඇත.

(ඇ) පාලක සභාවේ අනුමැතිය පරිදි නිවැරදි කර ඇත.

(ඈ) පාලක සභාවේ අනුමැතිය පරිදි නිවැරදි කර ඇත.

**2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**ස්ථාවර වත්කම්**

ස්ථාවර වත්කම් ලේඛනය සකස් කර ඇති අතර භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත. එහි අවසන් වාර්තාව සකස් කර ලබා දීමට කටයුතු කරනු ලැබේ.

**පරිගණක උපාංග හා මෘදුකාංග**

2012 වර්ෂයට යාවත්කාලීන කරන ලද පරිගණක උපාංග හා මෘදුකාංග ලේඛනය 2012.12.31 දිනට සකස් කර ලබා දීමට කටයුතු කරනු ලැබේ.

**ක්ෂය ප්‍රතිපාදන**

2012 වර්ෂයේ අවසන් ගිණුම් සමඟ නිවැරදි ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.

**වාර්තා ලිවීම සඳහා කර ඇති ගෙවීම්**

වාර්තා ලිවීම සඳහා කර ඇති ගෙවීම් 2007 ගෙවීම් චක්‍රලේඛය අනුව සිදු කර ඇත. වාර්තා වල පිටපත් එම වැඩසටහන් ගොනුවල ඇතුළත්ව ඇති අතර අවශ්‍ය වූ විට විගණනයට ලබා දීමටද හැක.

**ඉන්ධන සහ අළුත්වැඩියා වියදම්**

දෛනික ධාවන සටහන් පත් සහ මාසික කාර්යය සාධන සාරාංශ නිසි පරිදි යාවත්කාලීන කර ඇති අතර නොපමාව ලබා දීමට කටයුතු කර ඇත.

**ණයගැතියෝ**

2012 වර්ෂයේ ශේෂ සනාථ කිරීම සඳහා අවශ්‍ය තහවුරු ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**ණයහිමියෝ**

2012 වර්ෂයේ ශේෂ සනාථ කිරීම සඳහා අවශ්‍ය තහවුරු ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**2.2.7 නීති, රීති, රෙගුලාසී හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

(අ) පිළිගතිමි. පාලක සභාව රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වන අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් සමන්විත වන අතර ඔවුන්ගේ කාර්යබහුලත්වය මත රැස්වීම් වාර කල්දැමීමට සිදු වීම නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇත. වර්තමානයේ මෙම තත්ත්වය අවම කර ගැනීමට කටයුතු කර ඇත.

**(ආ) 1971 අංක 38 දරණ මුදල් පනත**

i. ඉදිරියේදී මේ සඳහා පියවර ගනු ලැබේ

ii. එකඟ වෙමි. 2011/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ 13(7) ඒ වගන්තිය ප්‍රකාර වාර්තාව 2013/01/24 දින පැවති පාලක සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

**(ඇ) ආයතන සංග්‍රහයේ ix වැනි පරිච්ඡේදය 2.2 ඡේදය**

රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල රාජකාරී කරන නිලධාරීන් පුද්ගලික මට්ටමින් ඉටු කරන කාර්යයන්ට අදාල අනුමැතිය ලබාගෙන ගෙවිය යුතු ගාස්තුවක් ලෙස මෙය සඳහන්ව ඇත. නමුත් මෙම ආයතනයේ උපදේශකවරුන් දීමනා ගනු ලබන්නේ ආයතනය විසින් පවරනු ලබන කාර්යයන් ඉටු කිරීම වෙනුවෙනි. ඒ සඳහා විධිමත් අනුමත ගෙවීම් කාර්යය පටිපාටියක් ආයතනයේ ක්‍රියාත්මක වේ. එහි මෙම ප්‍රතිපාදන සඳහන් වී ඇති අතර පෞද්ගලික මට්ටමින් ඉටු කරනු ලබන කාර්යයන් වෙනුවෙන් 20% ක් අයකිරීම සිදු කරනු ලැබේ.

**(ඈ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසී සංග්‍රහය**

i. **මු.රෙ.188 (2)**

නිරවුල් කර ඇත.

ii. **මු.රෙ. 371 (2) (අ)**

පිළිගතිමි. 2008,2009,2010,2011 වර්ෂ වල නොපියවන ලද අත්තිකාරම් ශේෂ නිසි පරිදි නිරවුල් කර ඇති අතර, ඊට පෙර වර්ෂ වල නිරවුල් වී නොමැති ශේෂ පාලක සභාව වෙත ඉදිරිපත් කර ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු යොදා ඇත.

i i i. **මු.රෙ. 1647 (අ)**

මු.රෙ. 1647 (අ) ප්‍රකාරව නියමිත පරීක්ෂණ සිදු කිරීම සඳහා මේ වන විට කටයුතු කර ඇත.

**2.2.8 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

ආයතනයේ පරිපාලන සහ විනය ක්‍රියා පටිපාටි සේවක අඤ්ඤපනතට අනුකූලව සකස් කරමින් පවතින අතර එහිදී මෙම කරුණුද සැලකිල්ලට ගෙන අවශ්‍ය රෙගුලාසී සකස් කිරීමට කටයුතු කරමි.

**2.2.9 මතභේදයට තුඩු දෙන ගණුදෙණු**

දේශන පැවැත්වීමට හා ඊට සම්බන්ධිත උපදේශන පාඨමාලා සම්බන්ධීකරණය, සැලසුම් කිරීම, මෘදුකාංග සංවර්ධනය, වාර්තා ලිවීම යන ආදිය ඉටු කිරීම වෙනුවෙන් දැනට ක්‍රියාත්මක වන බාහිර සේවා සැපයුම් සඳහා වූ ගෙවීම් චක්‍රලේඛය අනුව ගෙවීම් කටයුතු සිදු කෙරේ.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1.1 පුහුණු කටයුතු**

(අ) i/ ii 2012 සහ 2011 වර්ෂයන් වලදී අනිවාර්ය වැඩසටහන් ලෙස ක්‍රියාත්මක වූ ධාරිතා සංවර්ධන වැඩසටහනත් සේවාරම්භක පුහුණු පාඨමාලාවන් සැලකිල්ලට ගැනීමේදී 2010 වසරේදී ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ නිළධාරීන් සඳහා වූ සේවාරම්භක පුහුණු පාඨමාලාව දින 5 බැගින් වූ මොඩියුල 11 කින් සමන්විත වූ අතර වසරපුරා කණ්ඩායම් 06ක් සඳහා මෙම මොඩියුල 11 ක්‍රියාත්මක විය. ඒ අනුව එක් කණ්ඩායමකට දින 05 බැගින් වූ කෙටිකාලීන පාඨමාලා 11 ක් ලෙස කණ්ඩායම් 06 ක් සඳහා පාඨමාලා 66ක් ක්‍රියාත්මක කර ඇති අතර පාඨමාලා දින ගණන 330ක් වන අතර පැය ගණන 1980කි. තවද ධාරිතා සංවර්ධන වැඩ සටහන යටතේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පන්තියේ නිළධාරීන් කණ්ඩායම් 03ක් සඳහා දින 24 බැගින් වූ පාඨමාලා 03ක් මෙහෙයවා ඇති අතර පාඨමාලා දින ගණන 72කි. තවද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 111 පන්තියේ නිළධාරීන් කණ්ඩායම් 03 ක් සඳහා දින 40 බැගින් වූ පාඨමාලාවක් ක්‍රියාත්මක කර ඇති අතර පාඨමාලා දින ගණන 120 කි. තවද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ කුසලතා පදනම මත වූ නිළධාරීන් සඳහා දින 15ක පුහුණු පාඨමාලාවක්ද පවත්වා ඇත. සීමිත පදමන මත වූ නිලධාරීන් සඳහා දින 80 ක පුහුණු පාඨමාලාවක්ද පවත්වා ඇත.

- 2011 වසරේදී ක්‍රියාත්මක කල සේවාරම්භක පුහුණු පාඨමාලාවද සැලකිල්ලට ගැනීමේදී සේවාරම්භක පුහුණු පාඨමාලාව අධ්‍යන මොඩියුල 10 කින් සමන්විත වූ අතර වසරක් පුරා

කණ්ඩායම් 04 ක් ලෙස මෙම මොඩියුල 10 ක්‍රියාත්මක විය. ඒ අනුව එක් කණ්ඩායමකට දින 05 බැගින් වූ කෙටි කාලීන පාඨමාලා 10 ක් ලෙස කණ්ඩායම් 04 ක් සඳහා පාඨමාලා 40 ක් ක්‍රියාත්මක කර ඇති අතර පාඨමාලා දින ගණන 200 ක් වන අතර පැය ගණන 1200කි. තවද ධාරිතා සංවර්ධන වැඩසටහන යටතේ ශ්‍රී.ල.ප.සේ. 1 පන්තියේ නිළධාරීන් කණ්ඩායම් 04ක් සඳහා දින 24 බැගින් වූ පාඨමාලාවන් 04 ක් මෙහෙයවා ඇති අතර ඒ අනුව පාඨමාලා දින ගණන 96කි. තවද ශ්‍රී.ල.ප.සේ. 111 පන්තියේ නිළධාරීන් කණ්ඩායම් 06ක් සඳහා දින 30 බැගින් වූ පාඨමාලාවන් ක්‍රියාත්මක කර ඇති අතර එහිදී පාඨමාලා දින ගණන 180කි.

- තවද 2010 හා 2011 යන වර්ෂයන් වල දී ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහන් බොහොමයක් මුදල් අයකිරීමේ පදනම මත පැවැත්වීමද එම වර්ෂයන් වලදී පැවැත්වුණු පුහුණු පාඨමාලා ප්‍රමාණය අඩු වීමට හේතුවිය. එම වර්ෂයන් තුල ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහන් අතුරින් 2/3 ක් ප්‍රමාණයක් කර ඇත්තේ මුදල් අයකරන පදනමෙන් වන අතර මුදල් අයකිරීමකින් තොරව කර ඇත්තේ 1/3ක පමණ ප්‍රමාණයකි.

- දේශන ශාලා නැවත සකස් කිරීම හා අලුත් වැඩියා කිරීම හේතුවෙන් පාඨමාලා ක්‍රියාත්මක කිරීමට ඉතිරිවූ දේශන ශාලා ප්‍රමාණය සීමිත වීම.

III. සැලසුම් ගත සහතික පත්‍ර පාඨමාලා සඳහා තෝරාගත් අයගෙන් සැලකිය යුතු පිරිසක් පාඨමාලාව හැරගොස් ඇත. කෙසේ වුවද අප තෝරා ගන්නා නිළධාරීන් පාඨමාලාවට සහභාගී කරවීමේ බලතල ඇත්තේ එම නිළධාරීන් සේවය කරන ආයතන වල ප්‍රධානීන් වෙත වේ. නියමිත නිළධාරීන් පුහුණු පාඨමාලාව සඳහා මුදා හැරීමට යම් අපහසුතා වේ නම් හෝ එම නිලධාරීන් පෞද්ගලික හේතුන්, පාඨමාලා ගාස්තු ගෙවීම පිළිබඳ අපහසුව, නිවාඩු ලබා ගැනීමේ අපහසුව, යනාදී අප ආයතනයෙන් පරිබාහිර කරුණු මත වේ.

IV. ඩිප්ලෝමා පාඨමාලා සඳහා බඳවා ගත් අය අතුරින් සැලකිය යුතු පිරිසක් පාඨමාලාව හැරගොස් ඇත. ඊට හේතුවී ඇත්තේ පාඨමාලා ගාස්තු ගෙවීම පිළිබඳ අපහසුව, නිවාඩු ලබා ගැනීමේ අපහසුව, විභාග නිසිලෙස සම්පූර්ණ නොකිරීම, යනාදී අප ආයතනයෙන් පරිබාහිර පෞද්ගලික හේතුන් මත වේ.

(ආ) I. 2011 වසරේදී අපගේ පුහුණු උපක්‍රමයන් වෙනස් කිරීමේ තීරණයට අනුව ක්‍රියාත්මක කළ පුහුණු කරන්නන් පුහුණු කිරීමේ පාඨමාලාව යටතේ දිස්ත්‍රික්ක ගණනාවක පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් යටතේ දින 05 බැගින් වූ පාඨමාලාවන් 13ක් ලෙස ක්‍රියාත්මක විය. ඒ අනුව 2011 වසර තුල පුහුණුකරුවන් 286ක් පුහුණු කළ අතර අද වන විට පුහුණු කළ මුලු ගණන 462 ක් වේ.

II. 1982 අංක 09 දරණ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආඥා පනතට අනුව පුහුණු උපදේශක

සේවාවන් පැවැත්වීම ද අප ආයතනයේ කාර්යයකි. ඒ අනුව පිටස්තර ආයතන විසින් කරනු ලබන ඉල්ලීම් වලට අනුව මෙම පුහුණු උපදේශන සේවාවන් පවත්වන අතර මහා භාණ්ඩාගාරයෙන් හිමිවන ප්‍රතිපාදන වලට අමතරව අප ආයතනයේ වියදම් පියවීම සඳහා මෙම මුදල් උපයෝගී කොට ගනී.

### 4.1.2 දේශන පැවැත්වීම

(අ) I/II/III. ඉහත අංක යටතේ ඇති නිරීක්ෂණය සැලකිල්ලට ගැනීමේ දී නියමිත දේශන පැය ප්‍රමාණය අඩුවුවද උපදේශකවරුන් වශයෙන් ඔවුන් නිරත වන කාර්යයන් රාශියක් වේ. පාඨමාලා සම්පාදනය, සමායෝජනය, ව්‍යාපෘති වාර්තා සකස් කිරීමට අදාල උපදෙස් ලබාදීම, දිස්ත්‍රික් පුහුණු වැඩසටහන් අධීක්ෂණය හා නිරීක්ෂණය, රැස්වීම් සඳහා සහභාගීවීම, දේශන සඳහා පොත්පත් පරිශීලනය වාර්ථාවන් සකස් කිරීම, අත් පත්‍රිකා සකස් කිරීම, යනාදී කාර්යයන් දැක්විය හැක.

(ආ) I. ඉහත අංක යටතේ ඇති නිරීක්ෂණය සැලකිල්ලට ගැනීමේ දී නියමිත දේශන පැය ප්‍රමාණය අඩුවුවද උපදේශකවරුන් වශයෙන් ඔවුන් නිරත වන කාර්යයන් රාශියක් වේ. පාඨමාලා සම්පාදනය, සමායෝජනය, ව්‍යාපෘති වාර්තා සකස් කිරීමට අදාල උපදෙස් ලබාදීම, දිස්ත්‍රික් පුහුණු වැඩසටහන් අධීක්ෂණය හා නිරීක්ෂණය, රැස්වීම් සඳහා සහභාගීවීම, දේශන සඳහා පොත් පත් පරිශීලනය වාර්ථාවන් සකස් කිරීම, අත් පත්‍රිකා සකස් කිරීම, යනාදී කාර්යයන් දැක්විය හැක.

II. 1982 අංක 09 දරණ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආඥා පනතට අනුව පුහුණු උපදේශක සේවාවන් පැවැත්වීම ද අප ආයතනයේ කාර්යයකි. ඒ අනුව පිටස්තර ආයතන විසින් කරනු ලබන ඉල්ලීම්වලට අනුව මෙම පුහුණු උපදේශන සේවාවන් පවත්වන අතර මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන වලට අමතරව අප ආයතනයේ වියදම් පියවීම සඳහා මෙම මුදල් උපයෝගී කොටගනී.

III.නිරීක්ෂණයන් සැලකිල්ලට ගැනීමේදී ඊට පාදක වී ඇත්තේ විශේෂිත වූ විෂය කරුණු සම්බන්ධයෙන් විශේෂිත වූ දැනුම ඇති දේශකවරුන් සහභාගීකර ගැනීමට සිදුවීම. විශේෂයෙන්ම ධාරිතා සංවර්ධන වැඩසටහන්හි ඇතැම් මොඩියුලයන් (උදා- දෙමළ, ඉංග්‍රීසි) සඳහා බාහිර උපදේශන සේවාව ලබා ගැනීමට සිදුවේ.

### 4.2. කළමණාකරණ අකාර්යක්ෂමතා

(අ) 2012 වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කර ඇත.

(ආ) පිළිගතිම්. මූලික කටයුතු කිරීමෙන් පසු පුහුණු කටයුතු විමධ්‍ය ගත කිරීමේ අරමුණින් විධිමත් අංග සම්පූර්ණ පුහුණු ආයතනයක් නුවරඑළියේ ඉදිකිරීමට යෝජනා කිරීම හේතුවෙන් ඉහත ඉදිකිරීම් නැවැත්වීම සිදුකරන ලදී.

(ඇ) මේ වන විට මෙම කාමර 13 හි අලුත් වැඩියා කටයුතු අවසන් කර නේවාසික පහසුකම් ලබා දීම සිදුකරයි. පිටස්තර ආයතන වල නේවාසික පහසුකම් ලබාදෙනු ලබන්නේ

අවස්ථානුකූලව පැන නැගෙන අනිවාර්ය නේවාසික පහසුකම් සැපයීමේ අවශ්‍යතාව මත වේ.

(ඈ) 18-2096,GI-4694 යන වාහන දෙක අදාල ආයතන සඳහා නැවත භාරදී ඇත.එසේම 300-4289 දැනට පවරා ගැනීමට ඉල්ලීම් කලද, එම ආයතනය මෙම පවරා ගැනීම එකඟතාවට පළ කර නොමැත.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

(අ) වර්ෂ කිහිපයකට පෙර ආයතනය වෙත බාහිරින් ලැබූ විදේශ ව්‍යාපෘති ආදිය මෙහෙය වීමට ආරම්භ කරන ලද මෙම ගිණුම් ව්‍යාපෘතිය අවසන් වීම සමඟ වසා දැමීමට කටයුතු නොකිරීම නිසා මෙම තත්වය පැන නැගී ඇති අතර අවශ්‍ය තොරතුරු සොයා ගිණුම් වසා දැමීමට කටයුතු යොදා ඇත.

(ආ) අතිරික්ත මුදල් තාවකාලික අයෝජනයන්හී යෙදවීමට කටයුතු යොදා ඇත.

(ඇ) පිළිගනිමි. අදාල වාහන දෙක ඉදිරියේදී වෙන්දේසි කිරීමට කටයුතු කරමි.

**4.4 ආර්ථික නොවූ ගනුදෙනු**

2012 වර්ෂයේ සිට ප්‍රමාදයකින් තොරව වරිපනම් ගෙවීමට කටයුතු කර ඇත.

**4.5 හඳුනාගත් පාඩු**

(අ) මේ පිළිබඳ කරුණු ඇතුළත් වර්තාව 2013/01/24 දින පැවති පාලක සභාව වෙත ඉදිරිපත් කළ අතර පාලක සභාව විසින් එම වටිනාකම් තව දුරටත් පවත්වා ගෙන යාම අනවශ්‍ය ලෙසට තීරණයක් ගන්නා ලදී.

(ආ) මෙම මුදල භාණ්ඩාගාරයෙන් ලබා ගැනීම සඳහා තව දුරටත් කටයුතු කරමින් පවතී. නේවාසිකාගාරයේ නවාතැන් ගත නිලධාරීන් සඳහා අයවිය යුතු මුදල්ද මෙහි ඇතුළත්ව ඇත.

(ඇ) I නිවැරදි කිරීමට කටයුතු කර ඇත

II නිවැරදි කිරීමට කටයුතු කර ඇත

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

(අ) බඳවා ගැනීමේ පටිපාටිය පිළියෙල කිරීම අවසන් වී ඇති අතර අනුමත පුරප්පාඩු පිරවීමට කටයුතු කරමි.

(ආ) පවත්නා වාහන ප්‍රමාණයට සරිලන රියදුරු සංඛ්‍යාවක් නොමැති නිසා ද්වීතිය පදනම මත වසර 02 ක කාලය සඳහා රියදුරකු බඳවා ගෙන ඇත. නව සේවක සංඛ්‍යා සංශෝධන වලදී එකම වැටුප් පරිමාණයේ සිටි දත්ත ප්‍රදර්ශක හා දත්ත විශ්ලේෂක තනතුරු එකතු කොට විශ්ලේෂක එක් තනතුරක්ද, දත්ත ප්‍රදර්ශක තනතුරු දෙකක් ද ඇති කිරීමට යෝජනා කර ඇත.

(ඇ) පඩි රහිත නිවාඩු ලබා ගැනීම පිළිබඳ එම නිළධාරීන් දැනුවත් කර ඇත.

**4.7 සේවක පාරිභෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩ නැගීම.**

සංචිත වෙන් කිරීම පමණක් සිදුකර ඇති අතර ආයෝජන මඟින් අරමුදලක් ගොඩ නැගීම සඳහා කටයුතු කර නොමැත. විගණන හා කළමණාකරන රැස්වීමේදී මේ සම්බන්ධව සාකච්ඡා කළ අතර එම කමිටු වාර්ථාව අනුව පාලක සභා අනුමැතිය ලැබූ පසු ආයෝජන කිරීමට පියවර ගනු ලැබේ.

**5 ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

අධ්‍යයන ක්‍රමවේදයන් වෙනස් කිරීම සැලකිල්ලට ගෙන සංයුක්ත සැලැස්මෙහි සංශෝධනයන් කිරීමට යම් කාලයක් අවශ්‍ය වූ බැවින් මෙම තත්ත්වය පැන නැඟී ඇත.

**5.2 අභ්‍යන්තර විගණනය**

(අ) 2012/11/22 පැවති පාලක සභා අනුමැතිය මත අභ්‍යන්තර විගණක වරයකු පත් කර විගණන ඒකකය පිහිටුවීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

ආ) 2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව පිළියෙල කිරීමේ දී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ

(අ **5.3 විගණන හා කළමණාකරන කමිටු.**

) වර්තමානයේ නිසි පරිදි ක්‍රියාත්මක වේ.

(ආ) 2012 වර්ෂයේ වාර්ෂික වාර්ථාව පිළියෙල කල පසු එහි නිවැරදි කටයුතු කරනු ලැබේ.

**5.4 අයවැය පාලනය**

ඇස්ත මෙන්තු සකස් කිරීමේ දී හැකි හැම විටම සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම අනුව පූරෝකථනය සිදු කරන අතර, 2011 වර්ෂයේ සංයුක්ත සැලැස්මේ ඇති වූ වෙනස් කම් හේතුවෙන් මෙවැනි තත්ත්වයන් පැන නැඟී ඇත.

ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ දී ළඟා විය හැකි ඉලක්කයන් උපරිම නිවැරදිතාවයකින් යුතුව පූරෝකථනය කිරීමට කටයුතු කරනු ලැබේ. නමුත් පාලනය කළ නොහැකි තත්ත්වයක් නිසා යම් ප්‍රමාණයක යහපත් හා අයහපත් වි විචලනය සිදුවීම වැළැක්විය නොහැක. කෙසේ වෙතත් 2012 ආදායම් නිරන්තර සමාලෝචනයට ලක් කිරීමටත් 2013 සඳහා ඇස්තමේන්තු උපරිම නිවරදි පුරෝකාථනයක් කිරීමට කටයුතු යොදා ඇත

**5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

පිළිගතිමි. 2010 වර්ෂයේ 14(2)(C)විගණකාධිපති වාර්තාව ලැබීමෙන් පසු මුද්‍රණ කටයුතු සිදුකිරීමෙන් අනතුරුව සභාගත කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශය වන රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලබා දී ඇති අතර,2012 වර්ෂයේදී නිවැරදි ලෙස ලබා දීමට කටයුතු කර ඇත.

**6 පද්ධති සහ පාලනය**

විගණකාධිපති විසින් පෙන්වා දී ඇති පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන්ගේ අඩුපාඩුව සම්බන්ධව දැනටමත් විශේෂ අවධානය යොමු කර තවදුරටත් විධිමත් කිරීම සඳහා පාලක සභාවේද මඟ පෙන්වීම ඇතිව අවශ්‍ය ක්‍රියා මාර්ග ගනු ඇත

**බී.විජයරත්න**

අධ්‍යක්ෂ